# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2016** ජනවාරි **19** වන අඟහරුවාදා
2016 தை 19 செவ்வாய்க் கிழமை
Tuesday 19th January 2016

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.44 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.44 க்கு சபை கூடியது
*The Provincial Council met at 09.44 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදනය
## ANNOUNCEMENT OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"2016 පෙබරවාරි මස 09 වන දින පැවැත්වෙන සභා රැස්වීමේ පටන් ඉන් ඉදිරියට පැවැත්වෙන සභා රැස්වීම පෙ.ව. 09.30 සිට තේ විවේකයකින් තොරව පවත්වා ගෙන යෑමටත්, උදෑසන ආහාර / තේ පැන් සඳහා භෝජනාගාරය පෙ.ව. 09.00 සිට විවෘතව තැබීමටත් කටයුතු කළ යුතු බව 2016.01.06 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී තීරණය කරනු ලැබුවා.*

*ඒ පිළිබඳව ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානයටත් ඒ වාගේම ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම සඳහා ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයෙත් ගරු ප්‍රධාන සංවිධායකවරුන්ගේ අවධානයටත් යොමු කරනවා."*

ඉන් අපි අදහස් කරන්නේ ඊළඟ සභා වාරයේ ඉඳලා උදෑසන තේ විවේකය සඳහා සභාව නතර කිරීමක් සිදු වෙන්නේ නැහැ. සභාව දිගටම යනවා.

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු ශිරන්ත අමරසේකර[ශ්‍රීනාත් ම. පෙරේරා කාරක සභා ගරු සභාපති වෙනුවෙන්]**
Hon. ShiranthaAmarasekara[On Behalf of Hon.Chairman of the Committee, Srinath M. Perera]

ගරු සභාපතිතුමනි, 2015.12.10 වන දින පැවැති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2016.01.06 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that the copies of the relevant report are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, බොරලැස්ගමුව, වැව පාර, අංක 570 හි පදිංචි එම්.පී. ප්‍රියදර්ශනී යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. කඩවත, පහළ කරගහමුණ, ජයසිංහ මාවත, 5 වන පටුමග, 53/2 ඒ හි පදිංචි මහින්ද හේවගේ යන අයගේ පෙත්සම සහ

ii. වත්තල, හුණුපිටිය, පාදිලියාතුඩුව පාර, අංක 140/1/1 හි පදිංචි එන්.ආර්. වීරරත්න යන අයගේ පෙත්සම

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. PradeepPerera

i. කඩවත, ඉහල කරගහමුණ, ගාමිණී මාවත, අංක 280/5 හි පදිංචි ඩබ්.ඒ. ගුණරත්න යන අයගේ පෙත්සම සහ,

ii. කඩවත, කිරිමැටියාගාර, අංක 160/10 හි පදිංචි ජී.ඩබ්.ජී. කිත්සිරියන අයගේ පෙත්සම.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. SusilKindelpitiya

ගරු සභාපතිතුමනි, බම්බලපිටිය, රජයේ මහල් නිවාස, අංක 25 හි පදිංචි ඒ. කුගරාජ් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු උදේන විජේරත්න**
Hon. UdenaWijerathne

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. ලෝලුවාගොඩ, කඳන්ගමුව, අංක 127/1 හි පදිංචි මාලනී වීරක්කොඩි යන අයගෙ පෙත්සම

ii. පල්ලේවල, බෝරුක්ගමුව, කන්දවත්ත අංක 12 හි පදිංචි එම්.එච්.ආර්. කුසුමා ගුණසේකර යන අයගේ පෙත්සම සහ,

iii. මීරිගම, පමුණුවත්ත, හලුගම, නන්දන, අංක 213 හි පදිංචි ලක්ෂ්මිණී සන්ධ්‍යා අබේගුණවර්ධන යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඊළඟට න්‍යාය පත්‍රයට අනුව තිබෙන්නේ, ප්‍රශ්නවලට වාචික පිළිතුරු ඉදිරිපත් කිරීමේ අවස්ථාව. මම ඉතාමත් කනගාටු වෙනවා ප්‍රශ්න ඉදිරිපත් කළාට පිළිතුරු දෙන්න කිසිම ඇමැතිවරයෙක් සභාව තුළ නැහැ. ප්‍රශ්න සඳහා කල් ගන්නවත් කෙනෙක් නැහැ. මේ විධියට සභාව යන්නේ කොහොමද? කිසිම ඇමැතිවරයෙක් මේ සභාවේ නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මේ වාගේ වෙලාවක ඔබතුමා කොහොමද තීන්දුවක් ගන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට කල් දාන්න තමයි තියෙන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

මේ වාගේ සිද්ධියක් අහම්බෙන් තමයි දැක්කේ. එක ඇමැති කෙනෙක්වත් සභාවේ නැහැ. එතකොට මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න ඉදිරිපත් කරන්න පුළුවන්ද? මීන් ඉදිරියට මේ වාගේ දෙයක් වෙන්නේ නැති වෙන්න හරි ඔබතුමා මොකක් හරි ක්‍රියා මාර්ගයක් ගන්න. නැත්නම් මන්ත්‍රීවරු වශයෙන් අපටත් ඉන් අසාධාරණයක් වෙනවා. ඇමැතිවරු ඇමැතිකම අරගෙන වගකීමෙන් කටයුතු කරන්නේ නැතිකමයි මෙතැන තියෙන්නේ. එතුමන්ලා පත්තරවලින් නම් ලොකු දේවල් කියනවා. ඇත්ත කථා කරන්න ඕනෑ. මේක සාධාරණ වෙන්න ඕනෑ. මන්ත්‍රීවරයෙක් ආවේ නැති වුණාම සභාගත කරනවා. මෙතුමන්ලා නැති වුණාම මොකද වෙන්නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. MerilPerera

ඇත්තටම මේක සාධාරණයි. සභාව තියෙන්නේ මාසයටම දවස් දෙකයි. ගරු ප්‍රධාන ඇමැතිතුමා සහ අමාත්‍ය මණ්ඩලය වගකීමක් දරලා මෙතැනට එන්නේ නැත්නම් - මේ වෙලාවේ සභාවේ ගණපූරණයත් නැහැ. ඔක්කෝම රැස්වීම්වලට යනවා. උත්සවවලට යනවා. සභාවේ වගකීමක් නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. සියලුම ගරු මන්ත්‍රීවරු වාඩි වෙන්න. මට තිබෙන ප්‍රශ්න මේකයි. අපි මේ සභාවේ ශෝක යෝජනා දෙකක් ගෙන එන්න

තීරණය කරලා තියෙන්නේ. ඒ පවුල්වල උදවියත් ඇවිල්ලා ඉන්නවා. ඒක හරි ප්‍රශ්නයක්. සභානායකතුමාගේ යුතුකමක් තමයි සභාව පවත්වාගෙන යන්න මට උදව් කරන එක. ඒක වෙන්නෙත් නැහැ. ඒ නිසා මට රීති අනුව කටයුතු කරන්න සිද්ධ වෙනවා. සභාවේ ගණපූරණය සම්පූර්ණ වනතුරු මම මෙම සභාව තාවකාලිකව අත්හිටුවනවා.

***සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන් කැඳවීම් සීනුව නාද කිරීමට නියෝග කරන ලදී.***

***පසුව ගණපූරණය ඇති නොවූයෙන් ගරු සභාපතිතුමා විසින් රැස්වීම තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 10.46 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ [යසපාල කෝරලගේ මහතා] ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.***

*Committee counted, and Quorum not being present, the Division bells were ordered to be rung,*

*Later, there was no quorum and Hon. Chairman, suspended the sitting and it resumed at 10.46a.m presided over by the Hon. Deputy Chairman [Mr. YasapalaKoralage].*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

න්‍යාය පත්‍රයානුකූලව දැන් තිබෙන්නේ ප්‍රශ්නවලට වාචික පිළිතුරු සැපයීමේ අවස්ථාව.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව. ගරු මන්ත්‍රීතුමා සභාවේ නැහැ. ගරු ප්‍රධාන ඇමැතිතුමාට පිළිතුර සභාගත කරන්න පුළුවන්.

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ සහ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Governmentand Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs&Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

***** [සභාගත කරන ලද පිළිතුර]**
*[Tabled Answer]*

***ප්‍රශ්නය :***

*අ. 2012, 2013, 2014 වර්ෂ තුළ බස්නාහිර පළාතේ ලියාපදිංචි බෞද්ධ, හින්දු, මුස්ලිම් දහම් පාසල් කොපමණ සංඛ්‍යාවක් තිබේද?*

***පිළිතුර :***

*අ.*

| වර්ෂය | බෞද්ධ | හින්දු | මුස්ලිම් | කතෝලික |
|---|---|---|---|---|
| 2012 | 1936 | 109 | 250 | 314 |
| 2013 | 2017 | 116 | 266 | 327 |
| 2014 | 2017 | 116 | 266 | 327 |

***ප්‍රශ්නය :***

*ආ. එම එක් එක් ලියාපදිංචි දහම් පාසල් සංවර්ධනය සඳහා කොපමණ මුදලක් ඒ ඒ වර්ෂවල ලබා දී තිබේද?*

***පිළිතුර :***

*ආ. 2012 - රු. 205,600,000.00*
*2013 - රු. 202,200,000.00*
*2014 - රු. 165,000,000.00*

***ප්‍රශ්නය :***

*ඇ. එම මුදල් ප්‍රතිපාදන සපයා ගත්තේ කුමන අරමුදලකින්ද?*

***පිළිතුර :***

*ඇ. බස්නාහිර පළාත් සභා සංවර්ධන වැඩ සටහන් - පොදු අරමුදල මගින්*

***ප්‍රශ්නය :***

*ඈ. එසේ අරමුදල් ලබා නොදුන් ලියාපදිංචි දහම් පාසල් තිබේද?*

***පිළිතුර :***

*ඈ. ඔව්.*

***ප්‍රශ්නය :***

*ඉ. එසේ ලබා නොදුන්නා නම් ඒ කුමක් නිසාද? එසේ ලබා දුන්නා නම් ඒ කුමන ක්‍රමවේදයක් අනුවද?*

***පිළිතුර :***

*ඉ. පළමු අදියරෙහිදී මෙම ආධාර මුදල ලබා ගැනීමට අයදුම් කළ සියලුම ලියාපදිංචි දහම් පාසල් සඳහා ආධාර ලබා දෙන ලදී. දෙවන සහ තෙවන අදියරහිදී මුලින් ලබා දුන් ආධාර මුදලෙහි ප්‍රගතිය සමඟ අයදුම්පත් එවූ දහම් පාසල් සඳහා පමණක් මෙම ආධාර මුදල ලබා දී ඇත.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

න්‍යාය පත්‍රයේ අංක 02 යටතේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ නමින් යත් ප්‍රශ්නය ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමාට යොමු කිරීමට අවස්ථාව. ප්‍රශ්නය ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමා සහ අදාළ ඇමැතිතුමා සභා ගර්භයේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

න්‍යාය පත්‍රයේ අංක 03 ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**03.**

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/VI(1)/16/01)**

අ. බස්නාහිර පළාතේ පළාත් සභා පාලනය යටතේ වූ රෝහල්වල මේ වන විට පුරප්පාඩු ලෙස පවතින වෛද්‍ය තනතුරු සංඛ්‍යාව කොපමණද?

ආ. පුරප්පාඩුව පවතින හෙද තනතුරු සංඛ්‍යාව කොපමණද?

ඇ. මධ්‍යම ආණ්ඩුවෙන් පිරවිය යුතු වෙනත් තනතුරු එම රෝහල්වල පුරප්පාඩු ලෙස පවතීද?

ඈ. එම තනතුරු සහ තනතුරු සංඛ්‍යාව කවරේද?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. IsuraDevapriya- Chief Minister

අ. බස්නාහිර පළාත් සභා පාලනය යටතේ වූ රෝහල්වල 2015.12.31 දිනට පුරප්පාඩු ලෙස පවතින වෛද්‍ය තනතුරු සංඛ්‍යාව 34 කි.

ආ. පුරප්පාඩුව පවතින හෙද පුරප්පාඩු සංඛ්‍යාව 166 කි.

ඇ. මෙම රෝහල්වල මධ්‍යම ආණ්ඩුවෙන් පිරවිය යුතු වෙනත් තනතුරු පුරප්පාඩු ලෙස පවතී.

ඈ.

| අනු අංකය | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව (2015.12.31 දිනට) |
|---|---|---|
| 01 | දන්ත ශල්‍ය වෛද්‍ය | 07 |
| 02 | දන්ත වෛද්‍ය | 23 |
| 03 | පෝෂණවේදී | 03 |
| 04 | පාසල් දන්ත චිකිත්සක | 40 |
| 05 | ඖෂධවේදී | 53 |
| 06 | වෛද්‍ය පර්යේෂණ කාර්මික විද්‍යාඥ | 65 |
| 07 | විකිරණ ශිල්පී | 26 |
| 08 | මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර සහකාර | 30 |
| 09 | ඖෂධ සංයෝජක | 71 |
| 10 | භෞත චිකිත්සක | 06 |
| 11 | වෘත්තීය චිකිත්සක | 05 |
| 12 | අක්ෂි තාක්ෂණවේදී | 04 |
| 13 | කීට විද්‍යා සහකාර | 25 |
| 14 | දන්ත කාර්මික ශිල්පී | 07 |
| 15 | වාග් චිකිත්සක | 02 |
| 16 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | 162 |
| 17 | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී | 412 |
| 18 | විද්‍යුත් බන්තු රේඛන ශිල්පී | 29 |
| 19 | විද්‍යුත් බන්තු රේඛන සටහන්කරු | 01 |
| 20 | මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී | 07 |
| 21 | වෛද්‍ය සැපයුම් සහකාර | 09 |
| 22 | එන්නත්කරු | 27 |

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. LakshmanNipunaArachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මේ පුරප්පාඩු සංඛ්‍යාව බැලුවාට පස්සේ අපට හිතෙනවා මේ රෝහල් කොහොමද පවත්වාගෙන යන්නේ කියලා. මෙය බරපතළ ප්‍රශ්නයක් හැටියට තිබෙනවා. සෞඛ්‍ය සේවයක් තිබෙනවාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. මේ සම්බන්ධව ඔබතුමා මේ මොහොත වනවිට මධ්‍යම ආණ්ඩුවත් සමග කිසියම් ක්‍රියා මාර්ගයකට ගිහිල්ලා තිබෙනවාද?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. IsuraDevapriya- Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විකිරණ ශිල්පී මැෂින් එක ගෙනැල්ලා මම හිතන්නේ, අවුරුදු දෙකක් විතර වෙනවා. ඒක Operate වෙලා නැහැ. අපි දැන් මධ්‍යම රජයත් එක්ක කථා කළා. ඒ අයට දෙන්නත් Attach කරන්න කවුරුත් නැහැ. නමුත් පළාත් අමාත්‍ය සමුළුව ගිය සතියේ තිබුණා. එතැනදී සියලුම පළාත් අමාත්‍යවරු - අපට විතරක් නොවෙයි මේ ප්‍රශ්නය තියෙන්නේ. අනෙක් පළාත්වලටත් තිබුණා. ගරු ඇමැතිතුමා නියෝග දුන්නා මේ තිබෙන පුරප්පාඩුවලින් විශාල ප්‍රමාණයක් අපට පුරවන්න. විශේෂයෙන්ම ජනවර්ග පදනම මත. ජන සනත්වය මත. ඒ නිසා ඒකට Priority එකක් ලැබෙයි. පුහුණුවීම් අවසන් වන පිළිවෙළට මේ පුරප්පාඩු ලබා දෙන්න දැනටමත් - ඔබතුමාගේ ප්‍රශ්නය පරණයි නේ? ඒ අතර අපට මිඩ් වයිෆ්ලා හය දෙනෙක්. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු 51 දෙනෙක්. මේක පරණ ප්‍රශ්නයක් නේ? දැන් මේ වනකොට කිහිපයක් ආවා. මම අමාත්‍යාංශයට සම්බන්ධ වන අවදියෙන් පස්සේ කිහිප දෙනෙක් ආවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. LakshmanNipunaArachchi

දෙවැනි ප්‍රශ්නය ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේකටම අදාළ නැහැ. මම හිතන්නේ ප්‍රධාන ඇමැතිතුමා හැටියට ඔබතුමාට උත්තර දෙන්න පුළුවන්. මේ වනකොට රෝහල් ගණනාවකම විශාල බෙහෙත් හිඟයක් තිබෙනවා. මධ්‍යම ආණ්ඩුවේ රෝහලුත් එහෙමයි. උදාහරණයක් හැටියට ගත්තොත් එහෙම කළුබෝවිල රෝහලේ කොලෙස්ටරෝල්වලට දෙන්න ඕනෑ බෙහෙත් ටික නැහැ. ඒ වාගේ පළාත් සභා රෝහල්වලත් මේ වාගේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සම්බන්ධව ඔබතුමා දැනුවත්ද?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. IsuraDevapriya- Chief Minister

ඔව්. දැනුවත්.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. LakshmanNipunaArachchi

එහෙම ප්‍රශ්නයක් තිබෙනවා. ඒකට ගන්න ක්‍රියා මාර්ගය මොකක්ද?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. IsuraDevapriya- Chief Minister

Director එක්ක කථා කරලා - ගරු ඇමැතිතුමා දැනටමත් ප්‍රකාශ කරලා තිබෙනවා, පිටරටින් හරි ගේනවා කියලා. එතුමා ධනාත්මක පැත්තේ ඉන්නවා. මේ වනකොට කළුතර දිස්ත්‍රික්කයට මිලියන 20 කුත්, කොළඹ සහ ගම්පහ කියන දිස්ත්‍රික්කවල සියලුම රෝහල්වල අවශ්‍යතා ඉෂ්ට කරන්න මධ්‍යම රජයෙන් අපේ මුදල්වලට අමතරව ප්‍රතිපාදන ලැබෙනවා. ඒ සහයෝගයත් තිබෙනවා. ගරු ඇමැතිතුමා විශාල උත්සාහයක ඉන්නවා. එතුමාටත් අපටත් පාලනය කරන්න බැරි තත්ත්වයන් තිබෙන්නේ. නැත්නම් අපට ඉදිරි කාලය තුළ සැකයක් ඇති කර ගන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මම දැක්කා, මාත් පළමු අවස්ථාවට පළාත් සෞඛ්‍ය සමුළුවට ගියා. අපට ඉදිරි මාස තුන හතර වනකොට විශාල ප්‍රගතියක් දකින්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. LakshmanNipunaArachchi

ඒ වාගේම මම පෞද්ගලිකවම දන්නවා ජඹුරලිය ආයුර්වේද රෝහලට මේ කාර්තුවට බෙහෙත් නැති වෙලා තිබෙන්නේ. මධ්‍යම රජයෙන් දෙන මුදල් ප්‍රතිපාදන සම්බන්ධ ප්‍රශ්නයක්ද? එහෙම නැත්නම් ඒ ප්‍රශ්නය දැන් නිරාකරණය වෙලාද තියෙන්නේ කියන ගැටළු ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. IsuraDevapriya- Chief Minister

මට විනාඩි කිහිපයක් දෙන්න. මම කථා කරලා පිළිතුරක් දෙන්නම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි ගරු ප්‍රධාන ඇමැතිතුමනි. මීළඟට ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු සෞඛ්‍ය ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව. ගරු ඇමැතිතුමා සභාවේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇමැතිවරු නැහැ. ගරු ප්‍රධාන ඇමැතිතුමා විතරයි ඉන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ඇමතිවරු නැත්තේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම හිතන්නේ ඒක ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාට දැනුම් දීමක් කරලා තිබෙනවා. ඒක ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාම දැනුම් දෙනවා නම් වඩා හොඳයි.

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. SumithLalMendis- Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම උදේ උත්තරයක් දුන්නා. රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමා ඊයේ මට කිව්වා උණ කියලා. ඒ වුණාට රැස්වීමකට ගිහිල්ලා තිබුණා. ඒ වාගේම ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමා විදේශගත වෙලා තිබෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

කොයි රටටද?

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. SumithLalMendis- Chief Government Whip

ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා අතිගරු ජනාධිපතිතුමා සහභාගී වන රැස්වීමකට යන්න තිබෙනවා කියලා ඇවිල්ලා ගියා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඒක කමක් නැහැ. ඇවිල්ලා නේ ගිහිල්ලා තියෙන්නේ.

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. SumithLalMendis- Chief Government Whip

උණ ගත්තු ඇමැතිතුමා ගැන ආරංචියක් නැහැ.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. LakshmanNipunaArachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාර්ය පටිපාටි රීති අංක 34 යටතේ පෞද්ගලික පැහැදිලි කිරීම. එදිනෙදා අත්‍යාවශයෙන් මිලදී ගත යුතු භාණ්ඩවල මිල ඉහළ යෑම නිසා පාරිභෝගිකයා පත්ව ඇති තත්ත්වය පිළිබඳව වග කිව යුත්තන්ගේ අවධානය යොමු විය යුතු බව අවධාරණය කිරීම සඳහාත්, පිළියන්දල රාජ්‍ය ඔසුසල ශාඛාව වසා දැමීම නිසා ඇති වී තිබෙන ජනතා ගැටළුව අවධාරණය කිරීම සඳහාත් මෙම ප්‍රකාශය ඉදිරිපත් කරමි. එදිනෙදා වැඩි වන ජීවන වියදමට අනුව තමන්ට ලැබෙන ආදායම වැඩි නොවන, මාසයක් ජීවත්වීම සඳහා ලැබෙන මුදලින් කෙසේ හෝ ජීවිතය ගත කිරීමට සිදු වී ඇති ජනතාව මුහුණ දෙන මෙම තත්ත්වය පිළිබඳව වගකිව යුත්තන්ගේ අවධානය යොමු විය යුතු යැයි අදහස් කරමි. අද මේ තත්ත්වයෙන් අසීරු තත්ත්වයට පත්ව ඇති ජනතාව අතර විශ්‍රාම ජීවිතයක් ගත කරන්නට සිදුව ඇති, විශ්‍රාමිකයින් මුහුණ දෙන තත්ත්වය ඉතා බරපතළය. රජයේ රෝහලකට ගොස් වෛද්‍යවරයෙකු හමු වීම හැර නිදහස් සෞඛ්‍ය සේවාවක් අද අපේ රටේ නොමැත. එහෙයින් විශ්‍රාමිකයින් අති බහුතරයක් තමන්ට ලැබෙන මුදලින් විශාල ප්‍රමාණයක් අද වියදම් කරන්නේ, කෑම බීම සඳහා නොව, බෙහෙත් සඳහාය. මෙරටට ගෙන්වන සෑම ඖෂධයක්ම දෛනිකව මිල වැඩි වී ඇත. එයට හේතුව වන්නේ, ඩොලරයට සාපේක්ෂව රුපියල බාල්දු වීම නිසා තමන්ට ලැබෙන රුපියල්වලින් කලින්ට වඩා වැඩි මුදලක් ගෙවීමට සිදු වීමයි. මේ වනවිට බෙහෙත් ඇතුළු ආනයන භාණ්ඩ සෑම එකකම මිල වැඩි වී ඇති අතර, නිරන්තරයෙන් මිල වැඩි වෙමින් පවතී. උදාහරණයක් ලෙස තම නිවසේදී රුධිර පරීක්ෂණය කර ගන්නා කෙනාට ඒ සඳහා රුධිර පරීක්ෂණ යන්ත්‍ර සඳහා යොදා ගන්නා ස්ට්‍රිප් පවා 2015 දෙසැම්බර් මස 31 වැනි දිනට මිලදී ගත් මුදලට වඩා වැඩි මුදලක් ගෙවීමට සිදු වී ඇත. රුපියල බාල්දුවන වේගයේ තරමටම පාරිභෝගිකයා අසරණ වී ඇත. විශේෂයෙන්ම විශ්‍රාමිකයා මුහුණ දෙන

මේ තත්ත්වය සුළුපටු නොවේ. එහෙයින් තමන්ට වියදම් කිරීමට තිබෙන මුදලින් ජීවත් වන්නේ කෙසේද යන්න උභතෝකෝටිකය තුළ සිතන්නට අද ඔවුනට සිදු වී ඇත.

විශේෂයෙන්ම අද ඖෂධවලට පාලන මිලක් නොමැත. එහෙයින් අප දන්නා සමහරුන් බෙහෙත් තුණ්ඩුව රැගෙන බෙහෙත් වර්ගවල නම් උච්චාරණය කරමින් ෆාමසියෙන් ෆාමසියට ඇවිද යයි. ඒ වෛද්‍ය නිර්දේශයට අනුව තමන්ට අවශ්‍ය බෙහෙත් අඩු මිලට ඇත්තේ කුමන ෆාමසියේද යන්න සොයා ගැනීම සඳහායි. ඒ අනුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව යටතේ ස්ථාපිත රජයේ ඔසුසලක් තිබේ නම්, එය සැනසුම්දායක තත්ත්වයකි. මන්ද, එහි කිසියම් පාලනයකට අනුව ඖෂධ මිල තීරණය වන බැවිනි. එහෙයින් අමාරුවෙන් බෙහෙත් ටික මිලදී ගන්නා පාරිභෝගිකයන් රජයේ ඔසු සලක් සොයා යෑමට පෙළඹේ. ඒ අනුව කිසියම් නගරයක එවැනි ඔසු සලක් තිබේ නම්, මේ තත්ත්වයට මුහුණ දෙන ජනතාවට කිසියම් අස්වැසිල්ලකි. එසේ පවත්වාගෙන ගිය රාජ්‍ය ඔසුසලක්, පිළියන්දල ප්‍රදේශයේ පවත්වාගෙන යන ලද්දේ සතොස විකුණුම් මධ්‍යස්ථානයේම කුඩා ඉඩකඩක් තුළය. එම ඔසුසල් ශාඛාව වසා දැමීමට උත්සාහ කිරීමේදී ප්‍රදේශයේ ජනතාව ඇතුළු විශේෂයෙන් විශ්‍රාමිකයින් සංවිධානය වී වගකිව යුත්තන් වෙත බලපෑම් කර එය නතර කර ගන්නා ලදී. නමුත් පසුගිය දිනයක හිටි හැටියේම එම ඔසුසල වසා දමා ඇත. ඖෂධ සංස්ථාවෙන් ඒ ගැන පවසන්නේ ඔසුසල සඳහා පැවතිය යුතු නියමිත බිම් ප්‍රමාණය නොමැතිවීම නිසා ඔසුසල සඳහා අවශ්‍ය වාර්ෂික බලපත්‍රය නොලැබීම හේතුවෙන් වසා දැමීමට සිදු වූ බවයි. ප්‍රදේශයෙන් සුදුසු ස්ථානයක් ලබා දෙන්නේ නම් නැවත ඔසුසල විවෘත කිරීමට හැකියාව ඇති බවයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් සභාවේ අවධානය යොමු කළ යුතු වන්නේ මෙන්න මේ තත්ත්වය මතයි. මධ්‍යම ආණ්ඩුවේ බලය සහිත නිලධාරියා වන ප්‍රාදේශීය ලේකම්ට, පළාත් සභාවට, නගර සභාවට මේ කුමන හෝ පරිපාලන ක්ෂේත්‍රයෙන් ඒ වාගේම දේශපාලන බලාධිකාරයෙන් විසඳුමක් අවශ්‍ය වී ඇත්තේ, ඔසුසල ශාඛාව අහිමි වීම නිසා සහනයක් බලාපොරොත්තු වන ජනතාවගේ උවමනාව වෙනුවෙන් වගකීමක් ඇති නිසයි. එහෙයින් මේ වනවිට පළාත් සභාව යටතේ ඇති ගොඩනැගිලි පහසුකම් සහිත ස්ථානයක් හෝ කුමන පදනමකින් හෝ ලබා දී නැවත ඔසුසල විවෘත කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු බව අවධාරණය කරමි. පිළියන්දල ප්‍රදේශයේ අවශ්‍ය ප්‍රමිතිය සහිත ඉඩ කොටසක් තාවකාලික පදනමින් හෝ ලබා දී කටයුතු කිරීමට ජනතා අවශ්‍යතාවය ඉටු කිරීමට අවශ්‍ය බව විශේෂයෙන්ම පළාත් සභාවේ අවධානයට යොමු කරමි. බොහොම ස්තූතියි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. SusilKindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ වෙලාවේදී කාරණා දෙකක් මතු කරලා පෙන්වන්න උත්සාහ කරනවා. මුලින්ම පළාත් සභාවේ සැලසුම් අංශය පිළිබඳව. එහි අධ්‍යක්ෂවරයා සහ ඔහුගේ ක්‍රියාකාරකම් පිළිබඳව. විශේෂයෙන්ම මගේ අතේ තිබෙනවා, බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන ලේකම්තුමිය විසින් පළාත් අමාත්‍යාංශ ලේකම්, ප්‍රාදේශීය ලේකම් සහ සියලුම ආයතන ප්‍රධානීන් වෙත යවපු චක්‍රලේඛයක්. එහි එක තැනක තිබෙනවා, ලියාපදිංචි පෙර පාසල් සඳහා ඩෙස් පුටු සහ අනෙකුත් අත්‍යවශ්‍ය උපකරණ ලබා දීම සඳහා උපරිම ප්‍රතිපාදනය රුපියල් 30,000 යි. වසර 05 ක් ඇතුළත එකම ආයතනයකට උපකරණ ලබා දිය නොහැක. ඊළඟට වසර දෙකකට වඩා වැඩි කාලයක් අඛණ්ඩව පවත්වාගෙන යන ලියාපදිංචි මරණාධාර සහ ග්‍රාම සංවර්ධන සමිති සඳහා තාවකාලික ආවරණයක් ලබා දෙන්න පුළුවන් රුපියල් 30,000 ක උපරිමයකට යටත්ව. ඉදිරියට වසර 05 ක් යනකල් මේ සමිතියට, කිසි කෙනෙකුට යළිත් ආධාර දෙන්න බැහැ. මේක එකක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 30,000 කට මෙහෙම ආධාර දෙන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මම හිතනවා සියලුම මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රතිපාදන වැය කිරීම සම්බන්ධයෙන් තමයි මේ යෝජනාව සහ අදහස් ඉදිරිපත් වෙන්නේ. ඒක නිසා එතුමාගේ කථාවට කාගේත් අවධානය යොමු වෙනවා නම් බොහොම හොඳයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. SusilKindelpitiya

බොහොම ස්තූතියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේවා යහපාලන ආණ්ඩුවේ තීරණ.

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. SumithLalMendis- Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පිළිබඳව කථා කරන්න මට විනාඩියක් දෙනවාද? (බාධා කිරීම්)

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. SusilKindelpitiya

ඔබතුමාට අදහස් දක්වන්න බැහැ. මගේ පෞද්ගලික පැහැදිලි කිරීමක්.

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. SumithLalMendis- Chief Government Whip

මේ පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් එක්ක අපි ආණ්ඩු පක්ෂ රැස්වීමේදී කථා කළා. කථා කරලා තීරණයකට එළැඹුණා, ප්‍රධාන ඇමැතිතුමා මේකට මැදිහත් වෙලා, පක්ෂ දෙකෙන්ම කමිටුවක් පත් කරලා, අපි මේ පිළිබඳව නැවත තීන්දුවක් ගන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සංවිධායකතුමා ඒකට ඌණපූරණයක් වශයෙන් ගරු මන්ත්‍රීතුමාගේ කථාව ශ්‍රවණය කරනවා නම් වටිනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. SusilKindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ තිබෙනවා ක්‍රීඩා සමිතියකට රුපියල් 25,000 යි. උපරිමයකට යටත්ව වසර 05 යි. අනේ, වොලිබෝල් එහෙම ගහන්න හම්බ වෙන්නේ නැහැ. ක්‍රිකට් ගහන්න හම්බ වෙන්නේ නැහැ. ක්‍රීඩා සමිතිවලට වසර 05 කට 25,000 යි දෙන්න පුළුවන්. මම කියන්නේ මේවා හරි බරපතළ කාරණා. මම දන්නේ නැහැ මේවා කොහෙන්ද එන්නේ කියලා. ඊළඟට ජාත්‍යන්තර තරගයකට යනවා නම්, රුපියල් 10,000 යි දෙන්න පුළුවන්. සපත්තු නොවෙයි -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

මේස් දෙකක්වත් ගන්න බැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. SusilKindelpitiya

මේස් දෙකක්වත් ගන්න බැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ එක කාරණයක්. ඊළඟට දැන් මොකක්ද වෙලා තියෙන්නේ? දැන් මේක මෙහෙය වන්නේ කවුද? මේක මෙහෙය වන්නේ සේනක සිල්වා, කේ.එච්. සේනක පී සිල්වා මහතා. සේනක සිල්වා කියන අධ්‍යක්ෂවරයා පත් කිරීමම නීති විරෝධීයි. මේ පත් කිරීම කරන්නේ කවුද? අටළුගමගේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්. රාජකාරී පවරනවා. මේ ලියුම නීති විරෝධීයි. ඊළඟට මොහු මෙම තනතුරට පත් කරන්නේ මොකෙන්ද? මෙම තනතුරට 2010.09.10 වැනි දින 1670/32 දරන රජයේ අති විශේෂ ගැසට් නිවේදනය අනුව මේකට නිලධාරියෙක් පත් කරන්න ඕනෑ. මේ ගැසට් නිවේදනය කඩ කරලා. Advertise කරන්නේ නැතුව මේ පත්වීම කරලා තිබෙනවා. ඒ නිසා මේ ගැසට් නිවේදනය කඩ කරමින් මේ පත්වීම කරලා තිබෙන්නේ. ඊළඟට මම කියන්නම් මේ අලුතෙන් පත් වෙලා ඉන්න අධ්‍යක්ෂවරයාගේ කටයුතු. ව්‍යාපෘති අනුමත කරන්න ගියාම වෙලාවට ව්‍යාපෘති අනුමත කරලා දෙන්නේ නැහැ. අනවශ්‍ය කාලයක් ගන්නවා. ඊළඟට එක එක ප්‍රශ්න මතු කරලා ව්‍යාපෘති අධෛර්ය කරනවා. ඉතින් මේ කටයුතුවලට මෙහෙම ඉඩ දෙන්න බැහැ. දැන් එක සැරයක් අර හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීතුමියගේ ප්‍රතිපාදන ලබා දීමේදී ප්‍රශ්න ගණනාවක් මතු කළා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සැබෑම ඇත්ත. එතුමා කියන කාරණා සියල්ලම මන්ත්‍රීවරුන්ට බලපානවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. SusilKindelpitiya

මන්ත්‍රීවරයෙකු ගියාම ගරු සරු ඇතිව කථා කරන්නේ නැහැ. මන්ත්‍රීවරයාට මුහුණ දෙන්නේ නැහැ. මඟ ඇරලා යනවා. ඒ විතරක් නොවෙයි. දැන් මේ සේවය කරන නිලධාරීන්ට, මම උදාහරණයකට කියන්නම්. කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ කටයුතු මෙහෙයවන නිලධාරිනියන් අසීමිත ලෙස මහන්සි වෙනවා. අසීමිත ලෙස කටයුතු කරනවා. අපට වඩා උනන්දුවෙන් මේ වැඩේ කරන සමහර නිලධාරීන් ඉන්නවා. හැබැයි, ඒ නිලධාරීන්ට සලකන්නේ ඉතාම අමානුෂික විධියට.

සමහරුන්ගේ දීමනා කපලා. සමහරුන්ට වැටුප් වර්ධක නැහැ. නිසි පරිදි ඔවුන්ගේ උසස් වීම් ලබා දී නැහැ. මේ සියල්ල නැති කරලා මේ නිලධාරියා මෙහෙම කටයුතු කරන්නේ මෙයාට කොහෙන් ආපු බලයක්ද කියන ප්‍රශ්නය මතු වෙනවා. මේ වැඩ පටන් ගන්නේ 2014 අවසාන කාර්තුවේ ඡන්දය ලං වනකොට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලක්ෂ 15 ගාණේ දෙන්න ගිහින් ප්‍රශ්නයක් මතු වෙනවා. ඒ වෙලාවේදී අටළුගමගේ මහතා ඒක ප්‍රතික්ෂේප කරනවා. ඒ වෙලාවේ තමයි හිටපු මහ ඇමතිවරයාත් එක්ක ගැටුමක් ඇති වෙන්නේ. මම මේ පළාත් සභාවේදී මේ කාරණය මතු කරලා පෙන්නුවා. ඊළඟට එතුමා බැහැයි කියපු මුදල අනුමත කරන්නේ සේනක සිල්වා කියන මේ නිලධාරියා. මෙන්න තිබෙනවා ලියුම. මොකක්ද? පළාත් සභා සංවර්ධන වැඩ සටහන කළුතර දිස්ත්‍රික්කයේ නව වැඩ සටහන කියලා සල්ලි අනුමත කරන්නේ එතුමා. මේකේ තිබෙන ප්‍රශ්නය මේකයි. මේ පොදු අරමුදල කාගේද? මේ පොදු අරමුදලේ තිබෙන්නේ අපේ බදු සල්ලි. මේ පළාතේ ජනතාවගේ බදු සල්ලි. ප්‍රතිපාදන විධියට වෙන් කරන්නේ කාගේ සල්ලිද? මේ උපමාන පාදක ප්‍රතිපාදන කියලා වෙන් කරන්නේ ජනතාවගේ බදු සල්ලි. එහෙම නම් ඒවා මෙහෙයවීමේදී නිලධාරීන්ට ඕනෑ විධියට කටයුතු කරන්න බැහැ නේ? නිලධාරීන් සැලකිල්ලට ගන්න ඕනෑ. දැන් මේ තවත් තිබෙනවා, මහ විශාල ලැයිස්තුවක් අලුතෙන් සකස් කරලා, මේවා කොහොමද කෙරෙන්න ඕනෑ කියලා. හැබැයි බලාගෙන ගියාම පරණ ලැයිස්තුවම, පරණ කොපියම මේකේ තිබෙන්නේ. වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීමට අදාළ මාර්ගෝපදේශ. මේ මාර්ගෝපදේශ ටික කියෙව්වාම තේරෙනවා, අපි කොයිතරම් පසුගාමී සමාජයකද, පසුගාමී පරිසරයකද ජීවත් වෙන්නේ කියලා. ඒ නිසා මේවා නිර්මාණශීලී විධියට කරන එක නිලධාරීන්ගේ වගකීමක්. අපට ගැළපෙන විධියට, පළාතට ගැළපෙන විධියට, පළාතේ ජනතාවගේ ජීවන තත්ත්වය දියුණු වන විධියට එපැයි මේවා මෙහෙයවන්න. මේ මුදල් නිකම් නාස්ති වෙන්න දෙන්න බැහැ නේ? ඒ නිසා සේනක සිල්වා වාගේ එක නිලධාරියෙකුට ඕනෑ විධියට සැලසුම් සකස් කිරීමේ කටයුත්ත කරුණාකරලා යම් නියාමනයකට හසු කරන්න කියලා ඉල්ලනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ දෙවැනි කාරණය. 1998 අංක 03 දරන බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තිය අනුව පිහිටවපු ආයතනයක් තිබෙනවා. ඒ තමයි කොටිකාවත්ත සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමූපකාර සමිතිය. මේක හරි බරපතළ තත්ත්වයක්. මෙහි ඉන්නවා සරත් විදානපතිරන කියලා සභාපතිවරයෙක්. එතුමාගේ කටයුතු පිළිබඳව බරපතළ ප්‍රශ්න මාලාවක් තිබෙනවා. ඒ තමයි මෙතැන තට්ටු 07 ක ගොඩනැගිල්ලක් හැදුවා. මෙහි විශාල දූෂණයක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම අඹතලේ හරියේ පිහිනුම් තටාකයක් හැදුවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒක ඇස්තමේන්තු කරලා තිබුණා කෝටි 14 කට. එතැන හෝටලයක් හැදුවා. වියදම් කරලා තිබෙනවා කෝටි 29 ක්. අසාමාන්‍ය විධියට. මේ ඉඩම මිලදී ගැනීමේ ඉඳලා සම්පූර්ණ ව්‍යාපෘතියම ඉතාම දූෂිත එකක්. ඒ වාගේම මේකේ වත්කම කෝටි 2900 ක්. කොලොන්නාව ප්‍රදේශයේ සාමාජිකයින් 11,000 ක් ඉන්නවා. ඒ නිසා මේ සභාපතිවරයා යළිත් වරක් පත් වෙලා ඉන්නවා. කොටිකාවත්ත සණස සංවිධානයේ. 11,000 ක් වන කොලොන්නාව ප්‍රදේශයේ ජනතාවගේ සල්ලි. ඒ නිසා දූෂණ ගණනාවක් තිබෙනවා. එකින් එක කියන්න බැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා මම ගරු ප්‍රධාන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, වහාම කොටිකාවත්ත සණස බැංකුවේ කටයුතු පිළිබඳව හොයන්න. පුළුවන් නම් මේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු නවත්වලා, විසුරුවා හැරලා පාලක මණ්ඩලයක් යටතට කොටිකාවත්ත සණස සමිතිය පත් කරන්න.

ඒ විතරක් නොවෙයි. මේ සභාපතිවරයා අවුරුදු 14 ක් සභාපති හැටියට කටයුතු කරනවා. එතුමාට ඉස්සර ෆුට් සයිකල් එකක්වත් තිබුණේ නැහැ. අපේ ගමේ දන්න කෙනෙක්. මීට ටික කාලයකට කලින් ඒ මනුස්සයාගේ බයිසිකලේ පැව් එක්ක ගිහිල්ලා තල්ලු කරගෙන යනවා මම දැකලා තිබෙනවා. සභාපතිවරයාගේ දීමනාව ලෙස රුපියල් 10,000 යි ගෙවන්නේ. අද පවුල් පිටින් යුරෝපා සංචාරයේ යනවා. එතුමාට වාහනයක් අරගෙන දෙනවා, අර ගොඩනැගිල්ලේ වීදුරු දාපු කොන්ත්‍රාත්කාරයා. ඒ නිසා මේක ඉතාම බරපතළයි. ඒ නිසා මේ සරත් විදානපතිරණ සභාපතිවරයාට විරුද්ධව යම් පියවරක් ගන්න. විධිමත් පරීක්ෂණයක් කරන්න. හොරකම් කරපු සල්ලි ටික යළි ගිණුම්ගත කරන්න කටයුතු කරන්න. එහෙම නැති වුණොත් ගරු ප්‍රධාන ඇමතිතුමාට මම දැනුම් දෙනවා, මේ පිළිබඳව මම රහස් පොලීසියටත්, මූල්‍ය අපාරාධ කොට්ඨාශයටත් දැනුම් දෙන්න බලාපොරොත්තු වන බව. ඒ නිසා මේ කටයුතු පිළිබඳව මීට වැඩිය සොයා බලලා පියවරක් ගන්න කියලා ඉල්ලීමක් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. IsuraDevapriya- Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා මතක් කරපු කාරණය, ප්‍රතිපාදන වෙන් කිරීම අපේ එකක් නොවෙයි. මොකද, මේ සැරේ උපමාන පාදක සඳහා භාණ්ඩාගාරයෙන් තමයි ඔය කොන්දේසි පනවලා එවලා තිබෙන්නේ. අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් සංවර්ධන කමිටුව රැස් වුණා. මුළු රටේම මැති ඇමැතිවරු, මහ ඇමැතිවරු ඔක්කෝම ඇවිල්ලා හිටියා. මේ පිළිබඳව හකීම් ඇමැතිතුමාත් කාරණා මතු කළා. නමුත් එතැනදී එකඟතාවයකට ආවේ නැහැ. ඒ නිසා මම විපක්ෂ නායකතුමාට කියන්න කැමැතියි ගරු අග්‍රාමාත්‍යතුමාට මේ ගැන පැහැදිලි කිරීමක් කරලා, ඒ කියන්නේ මීට අවුරුදු 04 කට විතර උඩදී තිබුණු කොන්දේසි නේ තියෙන්නේ. ඒ නිසා මේ පිළිබඳව ගරු අගමැතිතුමාගේ අවධානයට යොමු කරලා මුදල් ඇමැතිතුමාට කියලා මේක වෙනසක් කර ගත්තොත් හොඳයි. ගරු ඇමැතිවරු පවා ඒක කිව්වා. මොකද, ලක්ෂ 02 කටත් ටෙන්ඩර් කැඳවන්න කියලා තිබෙනවා. අපි ඉස්සර ලක්ෂ 02 ට ටෙන්ඩර් කැඳවන්නේ නැහැ නේ? සමිතියකට දීලා 995,000 ක් වෙනකල්. ඉතින් ඒ වාගේ පසුබෑමක් ලැබිලා තිබෙනවා. මේ විධියට ගියොත් එහෙම යහපාලන ආණ්ඩුව කෙරෙහි ජනතාවගේ කලකිරීමක් ඇති වෙනවා. ඒ නිසා මම විශේෂයෙන්ම -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු ප්‍රධාන ඇමැතිතුමා අපි පසුගිය කාලයේ දිනාගත්තු දේවල්. ඔබතුමා කැලණිය පැත්තේ කතන්දර ටික අහන්න කෝ? කැලණිය පැත්තේ තොරතුරු ටික ඔබතුමා දන්නවා නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා බාධා කිරීම් කරන්න එපා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමා දන්නවා නේ කැලණියත් එක්ක අපේ සම්බන්ධකම්. විමල් වීරවංශ මැතිතුමා (බාධා කිරීම්) ජනතාවගේ විරෝධය.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. IsuraDevapriya- Chief Minister

පොඩ්ඩක් ඉන්න කෝ මන්ත්‍රීතුමා. ඔබතුමන්ලාට යහපාලනය කිව්වාම මළ පයිනවා නේ? පුදුම වැඩක් නේ? ඒ නිසා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ අවධානය ඒ පිළිබඳව යොමු කරනවා. සෞඛ්‍ය ඇමැතිතුමා නැති නිසා මම ඒ වගකීමත් භාර ගන්නම්. මට හිතෙන්නේ, මේ ඔක්කෝම ඇමැතිකම් ටික මට දුන්නා නම් හොඳයි. එතකොට මට මේ වැඩේ හොඳට කරගෙන යන්න පුළුවන්. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. SirikamalFilician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොලොන්නාවෙන් වත්තලට. මම ඇත්ත වශයෙන්ම කනගාටු වෙනවා අද අපේ පළාත් සභාව පත් වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව. කාලයකට ඉස්සෙල්ලා මේ පළාත් සභාව ඇතුළේ ක්‍රියාත්මක වන කාරක සභා ඉතාමත් ශක්තිමත්ව ක්‍රියාත්මක වුණා. ඒ අතරින් බොහොම බලවත් කාරක සභාවක් තමයි පෙත්සම් කාරක සභාව. පෙත්සම් කාරක සභාවට පෙත්සමක් ඉදිරිපත් කළාම, ඒ පෙත්සම පිළිබඳව පසුවිපරමක් කරලා, යම්කිසි ක්‍රමයකට ගිහිල්ලා ඒ පෙත්සම ඉදිරිපත් කරපු පුද්ගලයාට සාධාරණත්වයක් ඉෂ්ට වෙලා තිබෙනවා. එහෙම අතීතයක් මේ පළාත් සභාව ඇතුළේ තිබුණා. හැබැයි දැන් ඉතින් බීරි අලින්ට වීනා වාදනය කරනවා වාගේ. කමක් නැහැ කොහොම වුණත් ඇමැතිවරුන් නැති පළාත් සභාවේ මේ විෂයයට කථා කරන ඇමැතිවරයා පළාත් පාලන ඇමැතිවරයාත්, ප්‍රධාන ඇමැතිවරයා විධියට ඉන්න වෙලාවේ අඩු ගාණේ මේකට ඇහුම්කන් දෙයි කියලාවත් මම විශ්වාස කරනවා. මොකද, දැන් පළාත් සභාවේ ඇමැතිවරු නැහැ නේ? 05 ක් ඉන්නවා. 05 න් 04 ක්ම අද නැහැ. එතකොට ඉන්නේ මහ ඇමැතිතුමා විතරයි. මහ ඇමැතිතුමාට අදාළ කාරණයක් තමයි මම මේ කථා කරන්න යන්නේ. ඒක නිසා මම හිතනවා එතුමා මේ ගැන අවධානය යොමු කරයි කියලා.

මීට කාලයකට ඉස්සෙල්ලා මේ පළාත් සභාවට වත්තල ප්‍රාදේශීය සභාවේ කටයුතු සම්බන්ධයෙන් විමර්ශනය කරන්න කියලා දැන් ඉන්න සහ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු පෙත්සමක් ඉදිරිපත් කෙරුවා. ඒ අනුව මේ පෙත්සම විභාග කරලා ඉවර වෙලා චන්ද්‍රානි සමරකෝන් අපේ පළාත් පාලන කොමසාරිස්තුමියට මගේ අංක එල්.ජී.ඩී/6/5පී18, 2015.05.14 වැනිදා බොහොම පැහැදිලි තීන්දුවක් ඇරලා තිබෙනවා. අද වනකල් මේ තීන්දු මොනම ආකාරයකින්වත් ක්‍රියාත්මක වෙලා නැහැ. ඊට පස්සේ මේ සභාවට 2015.02.09 වැනිදා පෙත්සම ඉදිරිපත් කරපු ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමාට, ඒ සම්බන්ධයෙන්, මේ තීන්දු ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව හේමන්ත සමරකෝන් ලේකම්තුමා ලිපියක් යවලා තිබෙනවා. කොයි විධියටද කරන්නේ කියලා. මේ විධියට ගම්පහ පළාත් පාලන සහකාර කොමසාරිස් එවලා තිබෙනවා මේ තීන්දු ක්‍රියාත්මක කරන්න ඕනෑ ක්‍රමය කොහොමද කියලා. මේවා ගැන ශත පහක වග විභාගයක් නැතුව තමන්ට හිතු හිතු පරිදි වැඩ කෙරුවා. මේ පිළිබඳව පසුගිය මුදල් ප්‍රකාශය ගැන සාකච්ඡා කරන අවස්ථාවේදී මම සාකච්ඡා කළා, ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානයට යොමු කරන්න කියලා. මේක බරපතළ කාරණාවක්.

මේකේ බොහොම පැහැදිලිව තිබෙනවා බෝපිටිය, පමුණුගම උප කාර්යාලයේ, බෝපිටිය පොදු වෙළඳ පොලේ කඩ කාමර වගයක් හැදුවා. මේ කඩ කාමර හැදපු තැන ඉඳලා, මුදල් ලබා ගත්තු තැන ඉඳලාම අවිධිමත් විධියට තමයි සිද්ධ වුණේ. ඒක නිසා මේ පිළිබඳව තීන්දුවක් දීලා දැන් මේ පිළිබඳව පරීක්ෂණයක් යනවා. එහෙම තියෙද්දී දැන් සභාපතිවරු නැහැ. දැන් ලේකම්වරියක් තමයි කොමසාරිස් විධියට ඉන්නේ. පසුගිය සති අන්තයේ දීර්ඝ නිවාඩුවක් තිබුණා. එතකොට සිකුරාදා, සෙනසුරාදා, ඉරිදා නිවාඩු. මේ මිනිස්සු දන්නවා, නිවාඩු දවසක ඇවිල්ලා මේ අකටයුතුකම් කරපුවාම ඒ පිළිබඳව නීතිමය කටයුතු කරන්න විධියක් නැහැයි කියලා. ඒ නිසා ගිය සිකුරාදා - අපේ ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමා හිටියා මේ සාකච්ඡාව වෙන වෙලාවේ. බෝපිටියේ කඩ කාමරවල යතුරු ඇරලා පදිංචි වෙනවා. ඒ පිළිබඳව දැනුම් දුන්නාම පොලිසිය කියනවා, මට කටයුතු කරන්න විධියක් නැහැ. පළාත් පාලන කොමසාරිස්තුමිය නියෝගය එවලා තිබෙනවා. එතකොට ඒක ක්‍රියාත්මක කරන්න ඕනෑ දැනට ප්‍රාදේශීය සභාවේ ඉන්න විශේෂ කොමසාරිස්තුමිය. එතුමිය නිවාඩු දවසක්. දැන් මම ඉතාමත් වගකීමෙන් තමුන්නාන්සේගෙන් ඉල්ලන්නේ මේ සභාවට පෙත්සමක් ඉදිරිපත් කළාම, ඒ පෙත්සමට යම් තීන්දුවක් දීලා තිබෙනවා. බොහොම වැදගත් විධියට, නිවැරදි විධියට තීන්දුවක් දීලා තිබෙනවා. ඒ තීන්දුව ක්‍රියාත්මක කරන්න. ඇයි මේ තීන්දු ක්‍රියාත්මක කරන්නේ නැත්තේ? සභාවට මූල්‍යමය පාඩු වෙලා තිබෙනවා. එකක් විතරක් නොවෙයි. ගොඩක් තිබෙනවා. එකින් එක කියන්නම්. මේකේ තීන්දුව ලබා දුන් විමර්ශන කමිටුවේ නිලධාරී හැටියට හිටියා මහින්ද වීරසේකර, කේ.ජී. සෝමරත්න, එම්.එල්.බී.පී. චන්ද්‍රසිරි. මේ නිලධාරීන් තුන් දෙනා තමයි විමර්ශනය කරලා මේ වාර්තාව දීලා තිබෙන්නේ. මම හිතනවා ඇත්තටම මේ නිලධාරීන්ගේ ආත්ම ගෞරවයටත් කැළැලක් සිද්ධ වෙනවා, මෙය ක්‍රියාත්මක නොවීම තුළින්. ඒක නිසා මේ පළාත් සභාවේ ඉතාමත් කනගාටුදායක තත්ත්වයක් තමයි ඇත්ත වශයෙන්ම අද තිබෙන්නේ. මොකද, අපි කාටද කථා කරන්නේ කියලා අපි දන්නේ නැහැ. ඒක නිසා ඇමැතිවරු නැති පළාත් සභාවක්. නමුත් අපි මේක ගෙනියන්න හදනවා, ආණ්ඩු පක්ෂයේ ඉන්න එක කල්ලියක් යහපාලනය කියලා කියන නිසා. එහෙම පාලනයක් නොවෙයි. මේක අපි ඔක්කෝම පිහිටවපු පළාත් සභාව. මේකේ මහජනතාවට වැඩ කරන්න අපට වගකීමක් තිබෙනවා. ඒක නිසා කරුණාකරලා මේ පළාත් සභාව ඇතුළේ ක්‍රියාත්මක වන පෙත්සම් කාරක සභාව ඇතුළු අනෙක් කාරක සභාවල දෙන තීන්දු වලට නීත්‍යානුකූල අයිතියත් තිබෙනවා. එම නිසා වැදගත් විධියට නීතිය ක්‍රියාත්මක කරන්න කියලා තමුන්නාන්සේගේ මාර්ගයෙන් මම මේ තුන්වැනි වතාවට පළාත් සභාවේ කියන්නේ. කරුණාකර නැවත වතාවක් කියනවා. එහෙම නැති වුණොත් මේ පළාත් සභාවට විරුද්ධව හරි බඳු ගෙවන ජනතාව උසාවියට යන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. NandanaPathmakumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36 (1) වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්න තිබෙනවා. ඇත්තටම කළුතර දිස්ත්‍රික්කයෙන් පළාත් සභාවට මන්ත්‍රීවරු 22 ක් විතර තේරී පත් වෙලා තිබෙනවා. නමුත් අද කළුතරත් පානදුරත් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් දාලා. අපට සහභාගී වෙන්න බැහැ. එහෙම යොදා ගන්නවා නම් පළාත් සභාවෙන් විමසීමක් කරලා කරන්න ඕනෑ. ඇත්තටම ගැටළුකාරී තත්ත්වයක්. කළුතර උදේ 09.00 ට. පානදුරේ හවස 02.00 ට. සහභාගී වෙන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කළුතර දිස්ත්‍රික්කයේ වටේම දාලාද සම්බන්ධීකරණ කමිටු. ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. දිස්ත්‍රික් කමිටුවේ සම සභාපතිත්වය තිබෙන්නේ අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාට. මේ සම්බන්ධව දිස්ත්‍රික් කමිටුව හරහා පළාත් සභා රැස්වීම් දිනවලට මින් පස්සේ මේ කර්තව්‍ය කරන්න එපා කියලා ඇමැතිවරුන්ව දැනුවත් කරන්න කියන එක ගරු ප්‍රධාන ඇමැතිතුමා හරහා අපි දැනුම් දීමක් කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. IsuraDevapriya- Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා මගින් මම සභා ලේකම්තුමා දැනුවත් කරන්න කැමැතියි. මේ පිළිබඳව අදාළ දින සඳහන් කරලා ලිපියක් සකස් කරලා මගේ අත්සනට එවන්න කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා, මම හිතන්නේ අද අසනීපයි කිව්වාට සමහර ඇමැතිවරු අද ඒවායේ ඉන්නේ. ප්‍රදීප් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ පෞද්ගලික පැහැදිලි කිරීමට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. PradeepPerera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ අවස්ථාවේ ඇත්ත වශයෙන්ම මතක් කරන්න ඕනෑ 2016.01.06 වන දින මහර ආසනය ආශ්‍රිත ප්‍රදේශයේ කිරිල්ලවල, වැබොඩ, සූරියපාළුව, අහුගම්මන කියන ප්‍රදේශ හරහා දැඩි සුළං තත්ත්වයක් පැවතීම හේතුකොට ගෙන මේ වනකොට ගෙවල් 254 ක් අර්ධ හානි, ඒ වාගේම විශාල ලෙස අලාභ හානි සහ එක ජීවිත හානියක් සිදු වෙලා තිබෙනවා. මේ ආදී වශයෙන් විශාල ව්‍යසනයකට පසුගිය 01 වැනි මාසේ 06 වැනි දින මහර ආසනයේ ග්‍රාම සේවක වසම් තුන හතරක ප්‍රමාණයක මිනිස්සු මුහුණ දී තිබෙනවා. ඔවුන් විශාල අපහසුතාවයකට පත් වී තිබෙනවා. මේ අවස්ථාවේදී මම ගරු ප්‍රධාන ඇමැතිතුමාත්, ඒ වාගේම පළාත් සභාවේ නිවාස විෂයය භාර ගරු අමාත්‍යතුමාත් මේ සියලු දෙනා දුරකථනයෙන් සම්බන්ධ කරගෙන ඔවුන්ට මේ පිළිබඳව නිවැරදි තොරතුරු ලබා දීලා තිබෙනවා. විශේෂයෙන්ම මා ළඟ තිබෙනවා ප්‍රාදේශීය ලේකම්තුමිය ගොනු කරපු කරුණු. සියලු සත්‍ය කාරණා මා ළඟ මේ වෙලාවේ තිබෙනවා. මම ඒක සභාගත කරනවා. මම ඉල්ලීමක් කරනවා.පළාත් සභාව විධියට අපි ඒ වෙලාවේත් ඉල්ලීමක් කළා. මහර ආසනයේ ඡන්දදායකයන්ගෙන් ඡන්ද ගත්තු ගම්පහ දිස්ත්‍රික්කයේ මේ දෙපැත්තේම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු විශාල ප්‍රමාණයක් ඉන්නවා. අද ඒ මිනිස්සු බොහොම අසරණ වෙලා ඉන්නේ. මේ වෙලාවේ පිහිටක් වුණේ නැත්නම් පස්සට පිහිටක් වෙන එකේ තේරුමක් නැහැ. ඒ නිසා මම ඔබතුමා හරහා ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ වාගේම නිවාස විෂයය භාර අමාත්‍යතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා අපේ මේ අසරණ වුණු ජනතාවට හැකි ඉක්මණින් පිහිටක් වෙන්න කියලා. මොකද, නිවාස ආධාර අපට ලබා දෙන්නට පුළුවන් හැකියාව තිබෙනවා. ඒ වාගේම මම මහර ආසනයේ ඡන්ද ගත්තු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා තමුන්නාන්සේලා අඩු තරමින් එක මන්ත්‍රීවරයෙක් එක පවුලකට සීට් 10 ක්වත් ලබා දීමේ කෘතවේදීත්වය මේ අවස්ථාවේදී දැක්විය යුතුයි කියන එකත් මම මේ අවස්ථාවේ මේ සභාවට මතක් කරලා දෙනවා. ඒ නිසා නැවත නැවත මම ගරු ප්‍රධාන ඇමැතිතුමාට මතක් කරනවා අපේ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හරහා හැකි නම් පළාත් සභාවේ ඔබතුමාගේ මුදල් ප්‍රතිපාදන ලබා දෙන්න. එහෙම ප්‍රතිපාදනයක් ලබා දීමට හැකියාව තිබෙනවා නම් හැකි ඉක්මණින් මේක කරන්න පුළුවන්. මේ මිනිස්සු අසරණ වෙලා ඉන්න අවස්ථාවේ මේ සඳහා අපේ ආසනයේ අසරණ වුණු ජනතාවට පිහිට වෙන්න කියලා ඉල්ලීමක් කරනවා. බොහොම ස්තූතියි කාලය ලබා දුන්නාට.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. RajithaHapuarachchige

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ අවස්ථාවේ කරුණු දෙකක් මතු කරන්න බලාපොරොත්තු වෙනවා. එකක් තමයි මීගමුව ධීවර පෙර පාසල් සංගම්වලට අදාළ ඒ ගුරුවරුන්ගේ දීමනා පිළිබඳ ගැටළුවක් මතු වෙලා තිබෙනවා. මොකද, 2001 වර්ෂයේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා අමාත්‍යවරයාව ඉන්න කාලයේදී රුපියල් 250 ක් මාසයකට දෙන්න සූදානම් කරපු ඒ දීමනාව එතැනින් පටන් අරගෙන 2014 වනකොට ගුරුවරයෙකුට ලබා දෙන දීමනාව රුපියල් 3000 දක්වා වැඩි වෙලා තිබෙනවා. නමුත් මේ වර්ෂයේ ක්‍රියාත්මක වන අලුත් ක්‍රමවේදයත් එක්ක ඒක නැවතත් රුපියල් 250 කට අඩු

කරලා තිබෙනවා. ඒ නිසා ඒ අය අපෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා සභාව දැනුවත් කරන්න කියලා. විශේෂයෙන්ම ගරු ඇමැතිතුමා දැනුවත් කරන්න කියලා. පෙර පාසල් සඳහා ලැබෙන දීමනාව ඒ අයට ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද, අපි දන්නවා, මීගමුව ධීවර ප්‍රදේශ ආශ්‍රිතව අඩු ආදායම්ලාභී ජනතාවක් ඉන්නේ. ඉතින් ඒ නිසා ඒ අයගේ දරුවන්ට පෙර පාසල් අධ්‍යාපනය ලබා දෙන්න කැප වෙන ඒ ගුරුවරු ගුරුවරියන්ගේ දීමනාව නිසි පරිදි කලින් ලබා දුන්නු ක්‍රමවේදයටම රුපියල් 3000 ක් දක්වා වූ මුදල ලබා දෙන්න කියන ඉල්ලීම ඔබතුමා මගින් ගරු ඇමැතිතුමා යොමු කරන්න කැමැතියි.

විශේෂයෙන්ම ඊළඟට මම මතු කරන්න බලාපොරොත්තු වෙනවා කටාන කඳවල ප්‍රදේශයේ තිබුණු ලන්දේසි කුළුණ පසුගිය කාලයේදී කඩා වැටුණා. මේ කුළුණ ලන්දේසි සමයේදී ඉදි වුණු කුළුණක්. නමුත් පසු කාලීනව ඉංග්‍රීසි පාලන සමයේදී මිනුම් කටයුතු සඳහා මිනුම් ත්‍රිකෝණයකට භාවිතා කරපු ඒ කුළුණ, එක ස්ථානයක්. නමුත් මෑත කාලයේදී මීට මාස දෙකකට විතර කලින් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කරපු අනවසර කැනීමක් හේතුකොට ගෙන ඒක කඩාගෙන වැටුණා. ඒක පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයිති ස්මාරකයක්. ගොඩනැගිල්ලක්. ඒක පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් අවසරයක් නැතුව එතැන යම්කිසි කැනීමක් කරලා තිබෙනවා. ඒ කැනීම හේතුවෙන් ඒක කඩාගෙන වැටුණා. ඒ කඩාගෙන වැටුණු වෙලාවේ ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමාව දැනුවත් කළා, එතුමා සංචාරක ඇමැතිතුමා විධියට. මොකද, කටාන ප්‍රදේශයේ ඓතිහාසික සහ සංචාරක වටිනාකමක් තිබෙන එක ස්ථානයක්. එතුමා දැනුවත් කරලා එතුමා ඒ අවස්ථාවේ එතැනට සම්බන්ධ වුණා. ඇවිල්ලා කටයුතු සොයා බැලුවා. අද තිබෙන ගැටළුව තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තීරණය කරලා තිබෙනවා එතැන තිබුණු කුළුණ වෙනුවට ස්මාරයක් ඉදි කරන්න. නමුත් ඓතිහාසික වටිනාකමක් සහ සංචාරක වටිනාකමක් එතැන තිබෙන නිසා ප්‍රදේශයේ ජනතාව ඉල්ලීමක් කරනවා, ඒ තිබුණු කුළුණ ඒ විධියටම ඉදි කරලා දෙන්න කියලා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තිබෙන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයට තමයි. ඉතින් ඔබතුමා මගින් ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා ඒ කටයුතු සොයා බලලා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ඒක නැවත ඉදි කරලා දෙන්න කටයුතු කරන්න කියලා. විශේෂයෙන්ම මාර්ග සංවර්ධන අධිකාරිය මගින් එතැන යම්කිසි වැරැද්දක් වෙලා තිබෙනවා. ඒ කටයුතු සොයා බලලා යම්කිසි වන්දියක් ගන්න පුළුවන් නම් ඒ අරගෙන මේක තිබුණු තත්ත්වයටම ඉදි කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තමයි මේකට සම්බන්ධ අනෙක් කුළුණ ඇවරිවත්ත ප්‍රදේශයේ තිබෙනවා. ඒ ඇවරිවත්ත ප්‍රදේශයේ තිබෙන කුළුණෙත් යම්කිසි ඇළවීමක් දකිනවා. ඒකත් කඩා වැටීමේ අවධානමක් තිබෙනවා. ඒ කඩා වැටීමේ අවධානම තුළ - කඳවල කුළුණ කඩා වැටුණු වෙලාවේත් මම හිතන්නේ එතැන එහා පැත්තේ තිබුණේ මාතෘ හා ළමා සායනය. ළමා සායනයේ වහලයේ කොටසකටත් කඩා වැටුණු. රාත්‍රී කාලයේ සිදු වුණු නිසා ජීවිත හානියක් සිදු වුණේ නැහැ. දේපල හානියක් විතරයි වුණේ. නමුත් ඇවරිවත්ත ප්‍රදේශයේ තිබෙන කුළුණ යම්කිසි විධියකින් අවධානමකට ලක් වුණොත් ජනාකීර්ණ ප්‍රදේශයක්. කඩකාමර විශාල සංඛ්‍යාවක් ඒ අවට තිබෙනවා. ඒ නිසා දේපල හානි වාගේම ජීවිත හානිත් වෙන්න පුළුවන්. ඉතින් ඒ නිසා ඒ සම්බන්ධයේ සොයා බලලා කඳවල කුළුණ නැවත තිබුණු තත්ත්වයටම ඉදි කරලා එසේ සංචාරක වටිනාකම රැකලා දෙන විධියටත්, ඒ වාගේම ඇවරිවත්ත ප්‍රදේශයේ තිබෙන ඒ කුළුණ නැවත ප්‍රතිසංස්කරණයක් හෝ අවශ්‍ය කටයුතු සොයා බලන්න කියන ඉල්ලීමත් කරමින් ඔබතුමා මගින් ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් වැඩිදුරටත් ඉල්ලීමක් කරනවා, ඒ හරහා රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යතුමාව දැනුවත් කරන ලෙස.

**ගරු උපාලි කොඩිකාර**
Hon. UpaliKodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. 2014 අවුරුද්දේ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ අපේ මේ මන්ත්‍රීවරුන්ට යම් යම් ආධාර බෙදා දෙන්න මුදල් ප්‍රමාණයක් ලැබුණා. ඒ අනුව මම මහරගම ආසනයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සනීපාරක්ෂක භාණ්ඩ සෞඛ්‍ය අමාත්‍ය රංජිත් සෝමවංශ මැතිතුමා ඉන්න කාලේ ලබා දුන්නා. නමුත් මේ වනකොට සමහර කොටස් එවලා, සමහර ඒවා එවලා නැතුව සිමෙන්ති ටික ගල් වෙනවා. සිංහ සිමෙන්ති කියලා එකක් තියෙන්නේ. මම ගෙනාවාට පස්සේ තමයි ඇහුවේ. මම බයේ ඉන්නවා මාව FCID එකට ගෙනියයිද කියලා මේ බඩු ටික බෙදන්නේ නැතුව තියලා. ඉතින් බඩු බෙදන්න

[ගරු උපාලි කොඩිකාර]

ක්‍රමයක් නැහැ. අවශ්‍ය බඩු ප්‍රමාණය එවලා නැහැ. දැන් මේකේ තිබෙනවා මෙන්න මේ බඩු ටික තමයි වෙන්න කරන්න ඕනෑ කියලා. නිමවන ලද දොර 01 ක්. ඊට පස්සේ පෝච්චි 01 ක්. බට 01 ක්. කරාමයක්. ඊට පස්සේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඕක සභාගත කරන්න. අපි සෞඛ්‍ය අමාත්‍යාංශයට දැනුම් දෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. UpaliKodikara

සභාගත කළාම ගරු නියෝජ්‍ය සභාපතිතුමා කොහොමද කරුණු ටික දැන ගන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුවත් කිරීමක් කරන්න පුළුවන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. UpaliKodikara

මහජන ඡන්දයෙන් පත් වුණු අයිතිවාසිකම් - මහජනයාට සේවය කරන්න. එතකොට අද මේ බඩු ඔක්කෝම නරක් වෙනවා. සිමෙන්ති ටික ගල් වෙලා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්නයක් මතු වෙනවා. මේ මන්ත්‍රීතුමාගේ නිවසට ගේන්නේ ඇයි මේ බඩු ටික? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ බඩු ටික මන්ත්‍රීතුමාගේ නිවසට ගෙනාවේ ඇයි? ඒක අඩු ආදායම්ලාභීන්ට දෙන බඩු. ඔබතුමාගේ නිවසට ගෙනැල්ලා සිමෙන්ති තියාගෙන ඉන්නේ මොකද? කාගේ බලයද? මේ කාගේ බලයද? මේක එදා පාලනය නොවෙයි. මේ යහපාලනය.

**ගරු උපාලි කොඩිකාර**
Hon. UpaliKodikara

මම සිමෙන්ති තියාගෙන නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ඔබතුමාගේ ගෙදර කොහොද සිමෙන්ති තියාගෙන ඉන්නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. UpaliKodikara

තමුන්නාන්සේ දන්නේ නැත්නම් අහගන්න. අහගෙන ඉන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

අඩු අදායම්ලාභීන්ගේ සිමෙන්ති මෙතුමා ගෙදර තියාගෙන ඉන්නේ මොකටද? මේක මෙතුමාගේ -

**ගරු උපාලි කොඩිකාර**
Hon. UpaliKodikara

මම දැන් කිව්ව දේ ඇහුවේ නැහැ නේ? තමුන්නාන්සේ කට අරින්න එපා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

නිකම් කට තිබුණාට කෑගහන්න එපා. සාධාරණ වෙන්න. අඩු ආදායම්ලාභීන්ගේ සිමෙන්ති ටික ගෙවල්වල තියාගෙන -

**ගරු උපාලි කොඩිකාර**
Hon. UpaliKodikara

අපේ ගෙවල්වල සිමෙන්ති නැහැ. සිමෙන්ති කොට්ට - අහගෙන ඉන්න.

[සභාවේ ඝෝෂා]

සෞඛ්‍ය ඇමැතිතුමා මේ ගැන බලලා, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරී මහත්වරු ඉන්නවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානයට අපි යොමු කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. UpaliKodikara

දැන් 2016 ජනවාරි. සිමෙන්ති ටික ලබා දෙන්න කටයුතු කරන්න. දුප්පත් මනුස්සයාට මේක දීලා ලොරියක් අරගෙන දෙපාරක් තුන්පාරක් යන්න බැහැ. ඒ නිසා දන්නේ නැතුව කථා කරන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ඒ බඩු ටික බෙදන්න. ගෙවල්වල තියාගෙන ඉන්න එපා. ලැජ්ජයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. UpaliKodikara

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

වැදගත් විධියට ඉන්න. කුණුහරුප කියන්නේ. කියපු වචනය දන්නවාද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. UpaliKodikara

තමුසෙලා වාගේ පෙන්දෝ දැකලා තියෙනවා ඕනෑතරම්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

යන්න නිකම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වාඩි වෙන්න. සංවිධායකතුමා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර**
Hon. UpaliKodikara

තමුන්සේලා වාගේ පෙන්දෝ අපි ඕනෑ තරම් දැකලා තියෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ලැජ්ජයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මන්ත්‍රීතුමා ඕක සභාගත කරන්නම්. වාඩි වෙන්න. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා එතුමාගේ පෞද්ගලික පැහැදිලි කිරීම සඳහා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් තත්පරයකට කලිනුත් කථා කළේ යහපාලනය ගැන. යහපාලන ආණ්ඩුවක්, යහපාලනයක් තිබෙනවා කියලා තමයි අදහස් දැක්වුයේ. මම මේ අදහස් දක්වන්න හදන්නෙත් යහපාලනය යමපාලනයක් වෙමින් තිබෙන අවස්ථාවක් සම්බන්ධව. විශේෂයෙන්ම පසුගිය සතියේ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ රැස්වීම තිබෙන අවස්ථාවේ විදුලිබල නියෝජ්‍ය අමාත්‍ය අජිත් පී. පෙරේරා මැතිතුමා - මේ සභාව නියෝජනය කරපු මන්ත්‍රීවරයක්. අපේ ළඟින් හිටපු මන්ත්‍රීවරයෙක්. එතුමා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සියලු රාජ්‍ය නිලධාරීන් ඉදිරියේ ඉතාමත් පහත් විධියට, තර්ජනාත්මකව, රාජ්‍ය සේවයටත්, සමෘද්ධි ව්‍යාපාරයටත් තර්ජනයක් ඇති වන විධියට ප්‍රකාශයක් කළා. මෙතුමන්ලා දැන් යහපාලනය ගැන කථා කළා. ඒ ප්‍රකාශය තුළ එතුමා කියනවා උද්ඝෝෂණ, වැඩ වර්ජන කරන්න එන්න එපා. ඒවාවලට ඉඩ දෙන්නේ නැහැ. එහෙම කරලා

[ගරු ජගත් කුමාර]

බලාගමු. ඒ වාගේම සමෘද්ධි නිලධාරීන්ට කියලා, මේ අනෙක් ඉන්න වන්ඩින්ටත් කියන්න කියලා. ඒ කියන්නේ අනෙක් නිලධාරීන්ටත්. රාජ්‍ය සේවයට. මෙතුමන්ලා බලයට එනකොට කිව්වේ, මේ රටේ ස්වාධීන රාජ්‍ය සේවයක් තියෙන්න ඕනෑ. මේ රටේ රාජ්‍ය සේවකයා ආරක්ෂා කරන්න ඕනෑ. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන්න ඕනෑ. නිදහස තියෙන්න ඕනෑ. කොමිෂන් සභා ඇති කරන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පක්ෂපාතී වුණාම එහෙම තමයි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මෙහෙම කියලා ආපු සමහර බලු ගැත්තෝ, මම මේ වචනය පැහැදිලිව කියන්නේ එදා නරි වාගේ නිශ්ශබ්දව හිටපු අය, අහිංසක විධියට හැසිරුණු අය ප්‍රජාතන්ත්‍රවාදය කථා කරපු අය අද වරම් ගත්තු, ලයිසන් ගත්තු වන්ඩි වෙලා. මේ නියෝජ්‍ය ඇමැතිවරු. ඒ නිසා එතුමාගේ ප්‍රකාශයට සම්පූර්ණයෙන් අපි විරෝධය දක්වනවා විතරක් නොවෙයි. ඒ ප්‍රකාශයට සමස්ත රාජ්‍ය සේවය අද කැළඹිලා ඉන්නවා. ඒ වාගේම විශේෂයෙන් සමෘද්ධි ව්‍යාපාරයේ විෂයය භාර අමාත්‍යවරයෙක් ඉන්නවා. යම් නිලධාරියෙක් අඩුවක් කළා නම් - ඒ ඇමැතිවරයා ඒ විධියට හැසිරිලා තිබුණේ, ඇමැතිවරයා කියලා දුන්නු ලැයිස්තු කිහිපයක් තිබිලා තියෙනවා සමෘද්ධි නිලධාරීන්ට බඩු බෙදන්න. මෙන්න මේ අයට දෙන්න. හැබැයි ඒ නිලධාරීන් කියලා තිබෙනවා අපට ඔබතුමා කියන ලැයිස්තුවලට තෝරන්න බැහැ කියලා. එතකොට එතුමා කියනවා, ඒ අයගේ අවශ්‍යතා නොවෙයි. මට ඕනෑ දේ කරන්නේ. ඒ නිසා මේ අනුව මේ ලැයිස්තුවට දෙන්නේ නැත්නම් ඒ නිලධාරීන්ට එරෙහිව ක්‍රියා මාර්ග ගන්නවා කියලා. අපි පැහැදිලිවම කියනවා, රටේ යහපාලනය කියන්නේ එක්සත් ජාතික පක්ෂයට ලියලා දුන්නු දෙයක් නොවෙයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ නම කියන්න බැහැ. ඒක කියනවා නම් වරප්‍රසාද ප්‍රශ්නය ගන්න. නම කියන්න බැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමන්ලාට ඕනෑම වෙලාවක කියාගන්න පුළුවන්. දැන් කියන්න බැහැ. ඉතින් ඇමැතිවරයා කරපු ප්‍රකාශය.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නම කියන්නේ නැතුව තමන්ගේ අවශ්‍ය කාරණය පැහැදිලි කරලා අවසන් කරන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එහෙම නම් මීහරකෙක් කියන්නද? උඩු බුරන බල්ලෙක් කියන්නද? මනුස්සයාගේ නම නේ කියන්න වෙන්නේ? ඇමැතිකමක් දරාගෙන හැසිරෙන විධියට. ඉතින් අපි බොහෝම පැහැදිලිව කියනවා. මේ මන්ත්‍රීතුමා නොවෙයි. හැබැයි යහපාලනය කියන්නේ, එක්සත් ජාතික පක්ෂයේ රෙද්ද පල්ලෙන් බේරෙන්න ඕනෑ නැහැ නේ? ඒ යහපාලනය රටේ තියෙන්න එපැයි. යහපාලනය කියලා අපි ඉගෙන ගත්තේ රටේ හොඳ ප්‍රජාතන්ත්‍රවාදය නේ? හොඳ නිදහසක් නේ? රාජ්‍ය සේවයේ අයට නිදහසේ වැඩ කරන්න - දැන් පසුගිය ආණ්ඩුව ඇතුළේ අඩුපාඩු තිබුණා නම් ඒවා නිවැරැදි කරනවා කියලා නේ කිව්වේ. දැන් නිවැරැදි කරන්න ඇවිල්ලා නිලධාරීන්ගේ බෙල්ලෙන් මිරිකලා, තාප්පයට හේත්තු කරලා, හොම්බට අනින්න ලැහැස්ති වෙනවා නම්, අපි ඒ ඇමැතිතුමාට කියනවා. ඒ ඇමැතිතුමාට විතරක් නොවෙයි, ඇමැතිතුමා ඉන්න රජයටත් පැහැදිලිව කියන්න ඕනෑ, අගමැතිතුමාටත්, ජනාධිපතිතුමාටත් එක්ක. මෙහෙම හැසිරුණොත් ආණ්ඩුවට බරපතළ තත්ත්වයන්වලට මුහුණ දෙන්න වෙයි. රාජ්‍ය සේවකයන්ට අත තියන්න ඇවිල්ලා. සමෘද්ධි ව්‍යාපාරයට අත තියන්න ඇවිල්ලා බරපතළ ප්‍රශ්නවලට යම් යම් පසුගිය කාලයේ මුහුණ දුන්නා. ඒ නිසා අපි පැහැදිලිවම කියනවා. ඒ ප්‍රකාශය ඉල්ලා අස්කර ගන්න ඕනෑ. එහෙම නොවුණොත් ඒ ඇමැතිවරයාට එරෙහිව ලබන සිකුරාදා බණ්ඩාරගම නගරයේ උදේ 09.30 ට අපි දැවැන්ත උද්ඝෝෂණයක්, වැඩ වර්ජනයක් කරනවා. ඒ වාගේම එතැනින් නතර වෙන්නේ නැතුව ඇමැතිවරයාගේ ප්‍රකාශය අයින් කර ගන්න රජය බල කළේ නැත්නම්, මුළු රට පුරාම, ගමක් ගමක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් පාසා මෙයට එරෙහිව අපි අරගලයක් දියත් කරනවා. අපි පැහැදිලිවම මේක කියන්න

ඕනෑ. ඒ වාගේම අපි කියනවා, එක්සත් ජාතික පක්ෂයේ හොඳ මිනිස්සුත් ඉන්න නිසා ඔබට වගකීමක් තියෙනවා ඔබේ පක්ෂයේ, ආණ්ඩුවේ ඉන්න එවැනි වැරැදි විධියට හැසිරෙන - කඩේට පැනලා වළං බින්ද ගොනා වාගේ හැසිරෙන්නේ නැතුව ප්‍රජාතන්ත්‍රවාදය පැහැදිලිවම තියෙනවා නම්, ඒ විධියට හැසිරෙන්න ඒ ඇමැතිවරු දැන ගන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යම් වැරැද්දක් නිලධාරීන්ගෙන් වෙලා තිබෙනවා නම්, ඒකට විනය ක්‍රියා මාර්ගය ගන්න ක්‍රමවේදයක් තිබෙනවා. රටේ විෂයය භාර ඇමැතිවරු ඉන්නවා. දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරු ඉන්නවා. අධ්‍යක්ෂ ජෙනරාල්වරයෙක් ඉන්නවා. වැරැද්දක් තිබෙනවා නම්, ඒ අය රකින්න නොවෙයි මම මේ කථා කරන්නේ. හැබැයි ඇමැතිවරයාගේ හැසිරීම බිංදුවයි. නිලධාරීන්ගේ හදන්නේ කොහොමද? ඒක නිවැරැදි කර ගන්න කියලා බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි. ඔබතුමාගේ මාර්ගයෙන් මහ ඇමැතිතුමා දැනුවත් කිරීම සඳහා මම මේ කාරණාව ඉදිරිපත් කරන්නේ. පසුගිය කාලයේ උපාධිධාරී පත්වීම් සඳහා රජයේ විභාගයක් තියලා ඒ දරුවන්ට රැකියා ලබා දීමට ලැහැස්ති වන අවස්ථාවක අපේ යහපාලන ආණ්ඩුව ගැන කථා කළා. අපේ අගමැතිතුමාගේ සංකල්පයක් යටතේ ඉගෙන ගත්තු දරුවන්ට රැකියා ලබා දීමේදීත් බස්නාහිර පළාත් සභාවට අනුයුක්ත, බස්නාහිර පළාත් සභාවට විභාගය තියලා සමත් වුණු දරුවන්ව - මම ඔබතුමා හරහා ගරු ප්‍රධාන ඇමැතිතුමගෙන් ඉල්ලීමක් කරනවා. ඒ දරුවන්ව Categorize කරන්නේ නැතුව විභාගයෙන් සමත් වූ ලකුණු අනුව ඒ ළමයින් බඳවා ගැනීම කරන්න. හිතවත්කම්, පාට පක්ෂ භේද බලන්න එපා. මොකද, මට දෙමව්පියෝ කිහිප දෙනෙක්ම පැහැදිලි කළා. ඒ වාගේම අද උදෑසන කැබිනට් මණ්ඩලයේ ඇමැති කෙනෙක් කථා කරලා කිව්වා පළාත් සභාවට ගියාම ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන ඇමැතිතුමා බොහොම සාධාරණව කරගෙන යන බව අපි බලාගෙන ඉන්නවා. නමුත් යහපාලනයට පිටින් යන්න දෙන්න එපා. ඒ ළමයින් විභාගයට ඉදිරිපත් වෙලා ඒ ගත්තු ලකුණු අනුව, ඒ ක්‍රමවේදය අනුව ඒ ළමයින්ව බඳවා ගන්න. හිතවත්කම්වලට මේ වැඩේ කරන්න එපා කියන එක එතුමාත්, දෙමව්පියෝ කිහිප දෙනෙකුත් මට පැහැදිලි කිරීම් කළා. ඒ අනුව මම ඔබතුමා හරහා ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අවුරුදු ගාණක් මේ ළමයි උසස් අධ්‍යාපනය හදාරලා ගෙදරට වෙලා ඉන්න කොට දැන් විභාගයට ඉදිරිපත් වෙලා සමත් වුණු ළමයින්ට පංගු භේදයක් කරන්නේ නැතුව, තමන් ගත්තු සුදුසුකම් අනුව ඒ ක්‍රියා පටිපාටිය අනුව වැඩේ කරන්න. කළුද, සුදුද, යූ.එන්.පී. ද ශ්‍රී ලංකාද භේදයක් නැතුව එය ඉෂ්ට කරලා දෙන්නය කියලා මම ගරු මහ ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

උසස් කිරීමද?

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු මහ ඇමතිතුමා, මම ඉල්ලීමක් කළේ, ඒ ළමයින් දැන් උපාධිය අරන් ගෙදර ඉන්නේ. ඒ ළමයින්ට විභාගයක් තියලා, අපි රස්සාවල් දෙන්න බඳවා ගන්න හදනවා නේ? ඒ බඳවා ගන්නා ළමයින්ට අපි පක්ෂ භේදයක් බලන්නේ නැතිව - දැන් මේ ළමයින්ගේ දෙමව්පියොත් බලාගෙන ඉන්නවා. මේ ළමයින් එක එක රූටින් එකේ නැතිව ඒ -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මේක පටන් ගත්තේ රෙජිනෝල්ඩ් කුරේ මහ ඇමතිතුමා ඉන්න කාලයේ. එතුමා සම්මුඛ පරීක්ෂණ කළා. උපාධිධාරීන් බඳවා ගත්තාට පත්වීම් දුන්නේ ප්‍රසන්න රණතුංග හිටපු මහ ඇමතිතුමා. ඊළඟට දැන් ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා බඳවා ගෙන තිබෙනවා. අපි ඒ අයට තමයි දෙන්නේ. දේශපාලනයෙන් දෙන්නේ නැහැ. ඒ අයගේ ලකුණු අනුව පළාත් රාජ්‍ය කොමිෂන් සභාවෙන් කැඳවීමක් කරනවා. අපි මැදිහත් වෙන්නේ නැහැ. අපේ සම්බන්ධයක් නැහැ. ඒක දේශපාලනීකරණය කළේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, අපි දන්නා විධියට උපාධිධාරී ළමයින්ට කිසිම අසාධාරණයක් වෙන්නේ නැහැ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

නැහැ. ඒ ලකුණු මට්ටම අනුව -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

දැන් ඔබතුමන්ලාට වැඩක් තිබෙනවා කර ගන්න. මම දැන් අධ්‍යාපන ඇමතිතුමාට කිව්වා. කාඩර් කමිෂන් එකට කිව්වා. ඕගොල්ලන්ගේ කියන්න ඕනැ හැම කෙනෙක් ළඟටම ගිහිල්ලා කිව්වා. මේ කාඩර් එක වැඩි කරලා දෙන එක අපට තවම කරලා දෙන්නේ නැහැ. ගරු විපක්ෂ නායකතුමා, චෝදනාවක් නොවෙයි. දැන් අපේ ගුරුවරු, නියෝජ්‍ය විදුහල්පතිවරු වෙලා ගිහිල්ලා තිබෙනවා. විෂය අධ්‍යක්ෂවරු, ගුරු උපදේශකවරු වෙලා ගිහිල්ලා තිබෙනවා. බස්නාහිර පළාතට ගුරුවරු 1600 – 1800 අතර ප්‍රමාණයක් පුරප්පාඩු තිබෙනවා. දැන් මට එක එක කතන්දර කියනවා. නමුත් මම ඊයෙත් පරික්ෂා කළා. ඊයේ වන කොටත් ක්‍රියාත්මක වෙලා නැහැ. ඔබතුමන්ලාට පුළුවන් නම් මේ වැඩේ මට කරලා දෙන්න, අපට ඔය උපාධිධාරීන් එකපාර එකටම දෙදාහක් විතර එකවර බඳවා ගන්න - පුළුවන් නම් ඒ උදව්ව කරලා දෙන්න. මම ඒ වෙනුවෙන් මහන්සි වෙලා තිබෙනවා. කිසිම -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

යහපාලන ආණ්ඩුවෙන් අපි ඒක කරලා දෙන්නම්. නමුත් මම මහ ඇමතිතුමාට කිව්වේ, අපි අරන් තිබෙන ක්‍රමවේදය අනුවම යන්න. අර ඇමතිතුමා කළා, මේ ඇමතිතුමා කළා කියලා නොවෙයි.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒක වෙනසක් කරන්න බැහැ. මට කරන්න බැහැ ඒක.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අපි පිළිගන්නවා ඔබතුමා හරියට කරනවාය කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒක අපට කරන්න බැහැ. අපට වෙනස් කරන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ. කොස්තා මන්ත්‍රීතුමාට කවුරු හරි කිව්වා හෝ හිතුනා, මේකේ දේශපාලන පැත්තක් තිබෙනවා කියලා. මේකේ දේශපාලන පාර්ශවයක් නැහැ. ඒ ලකුණෙන් පිට අපි දන්න ඉතිහාසයේ කාටවත් අරගෙන නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

එක විෂයයකට ලකුණු 40 කට වඩා වැඩි වෙන්න ඕනැ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔක පටන් ගත්තේ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා. අන්තිම කාලයේ පටන් ගත්තේ. ඒ ක්‍රියාදාමය චන්ද්‍රිකා මැතිනිය කළා. මහින්ද මහත්තයාත් කළා. දැන් අපේ ජනාධිපතිතුමා - ඔයගොල්ලන්ගේ නොවෙයි. අපේ ජනාධිපතිතුමාත් කරන්නේ ඒක.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

අපි දෙගොල්ලෝගේම කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අද දිනට නියමිත න්‍යාය පත්‍රයේ ශෝක යෝජනා දෙකක් ඇතුළත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මම ඉල්ලීමක් කරනවා. මේ ශෝක යෝජනා සම්බන්ධව කටයුතුවලදී සභාවේ ගරුත්වය රැකෙන ආකාරයට සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා හැසිරෙයි කියලා බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම මේ අවස්ථාවට ඒ ශෝක යෝජනා ඉදිරිපත් කරන අප අතරින් වියෝ වූ ගරු මන්ත්‍රීතුමන්ලාගේ පවුලේ ඥාතීන් සම්බන්ධ වෙන්න ඇවිල්ලා ඉන්නවා. ඒ නිසා අපි සභාවේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවධානය හා හැසිරීම මීට වඩා ගරුත්වයක් ඇති වන ආකාරයෙන් පවතියි කියලා මම විශ්වාස කරනවා. ඒ අනුව පළමුවෙන්ම අවස්ථාව ගරු සභානායකතුමාට ලබා දෙනවා. හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී තිලකරත්න රාජපක්ෂ මැතිතුමා වෙනුවෙන් වූ ශෝක යෝජනාව ඉදිරිපත් කරන්න.

# ශෝක ප්‍රකාශ යෝජනාව : ගරු තිලකරත්න රාජපක්ෂ මැතිතුමා

## MOTION EXPRESSING CONDOLENCES : HON. MEMBER THILAKARATHNE RAJAPAKSHA

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ දෙවන පළාත් සභාවත්, තුන්වන පළාත් සභාවත් පොදු ජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් තේරී පත් වී ඉන් පසුව හතර වන පළාත් සභාවත්, පස් වන පළාත් සභාවත් එක්සත් ජනතා නිදහස් සන්ධානය යටතේ නියෝජනය කරමින් තේරී පත් වී බස්නාහිර පළාත් සභාවේ අවුරුදු 20 කට ආසන්න කාලයක් ඉතාම අවංක මන්ත්‍රීවරයකු හැටියට කටයුතු කළ තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා පසුගියදා අභාවයට පත් වුණා. මේ අවස්ථාවේ අපේ පළාත් සභාවේ හිටපු, ඉතාම දීර්ඝ කාලයක් පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක් හෙබ වූ එතුමාගේ අභාවය පිළිබඳව බස්නාහිර පළාත් සභාවේ සංවේගය ඒ පවුලේ උදවියට පුද කරන්න සැරසෙන මේ අවස්ථාවේ මේ යෝජනාව මම පළාත් සභාව වෙත ඉදිරිපත් කරනවා.

*"බස්නාහිර පළාතේ පළාත් සභාවේ දෙවන පළාත් සභාවට හා තෙවන පළාත් සභාවට පොදුජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින්ද, සිව්වන පළාත් සභාවට හා පස්වන පළාත් සභාවට එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරමින්ද කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු පළාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත් වී වසර දහනවයකට අධික කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරන ලද හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී තිලකරත්න රාජපක්ෂ මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.*

*බස්නාහිර පළාතේ පළාත් සභාව එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමාගේ අභාවය පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පළ කර සිටියි."*

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා හෝමාගම මැතිවරණ බල ප්‍රදේශයේ උඩුගහපත්තුව ප්‍රදේශය නියෝජනය කරමින් දේශපාලනයට පිවිසි මන්ත්‍රීවරයෙක්. මම පෞද්ගලිකව එතුමා පිළිබඳව බොහෝ දේ දන්නවා. තිලකරත්න රාජපක්ෂ මන්ත්‍රීතුමා දේශපාලනයට පිවිසෙන්න කලින් කලක් ඒ පළාතේ මහජන සේවකයකු හැටියට තමන්ගේ තරුණ කාලයේ - එතුමා විවාහයට පත් වුණු කෙනෙක් නොවෙයි. අවිවාහකව සිටිමින් මහජන නියෝජිතයෙකු බවට පත් වීමට පෙර සිටම අති දැවැන්ත සේවයක් ඒ පළාතට ඉටු කළා.

තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා 1955 ඔක්තෝබර් 17 වැනිදා උපත ලැබුවා. ඒ පළාතේ හිටපු ප්‍රකට ව්‍යාපාරිකයෙක්. මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. කොළඹ වරාය සම්බන්ධ කර ගෙන හරමානිස් අප්පුහාමි මහත්මයා හොඳ ව්‍යාපාරයක් පවත්වාගෙන ගියා. එතුමාගේ ආදරණීය පියතුමා. කරුණාසිරි ඩයස් මහත්මිය එතුමාගේ ආදරණීය මෑණියන්. ඒ වාගේම කැස්බෑව හා හෝමාගම ප්‍රදේශවල විශාල ඥාතීන් පිරිසක් එතුමාට ඉන්නවා. ඒ පවුලේ සහෝදර සහෝදරියන් හය දෙනෙක් ඉන්නවා. එහෙම ඉඳගෙන සමාජ සේවයේ නිරත වන කොට මට මතකයි, 1991, 1992, 1993 කාලවල මම හිතන්නේ, මංජු ශ්‍රී අරංගල විපක්ෂ නායකතුමා මමත් එක්ක එකඟ වෙයි. අපේ ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා මෙතැන ඉන්නවා. එතුමා එකඟ වෙයි. මම නියෝජනය කරන පොදු ජන එක්සත් පෙරමුණට ලොකු අඩුවක් තිබුණා. ඒ උඩුගහපත්තුවේ නායකත්වය පිළිබඳව අපට ගැටළුවක් තිබුණා. මම මේ වෙලාවේ ගෞරවයෙන් මතක් කරනවා සුනිල් පෙරුම්බුලි ගරු මන්ත්‍රීතුමා පිළිබඳවත්. සුනිල් පෙරුම්බුලි ගරු මන්ත්‍රීතුමා එක දවසක් මට හඳුන්වලා දුන්නා තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාව. මේ හොඳ ව්‍යාපාරිකයෙක්. හොඳ මහත්මයෙක්. මෙතුමාව අපි දේශපාලනයට ගේන්න ඕනෑය කියලා. ඒ නිසා 1993 දෙවැනි පළාත් සභාවට පොදු ජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා තරග වැදුණා. තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා ඒ පළමු අවස්ථාවේදීම ජයග්‍රහණය කළා. ඉන් පසුව එතුමා ජීවත් වෙලා ඉන්න කල්, පිට පිට හතර වරක් මේ පළාත් සභාවේ අවුරුදු 20 ක් ගරු මන්ත්‍රීවරයකු හැටියට කටයුතු කළා. එතුමා ආශ්‍රය කරපු මේ පළාත් සභාවේ ඉන්න සියලුම මන්ත්‍රීවරු පිළිගන්නවා, තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා අවංක මන්ත්‍රීවරයෙක් කියන එක. තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා නිර්ලෝභී මන්ත්‍රීවරයෙක් කියන එක. තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා කවදාවත් හොරකමක් නොකරපු

[ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා]

මන්ත්‍රීවරයෙක් කියන එක ඕනෑ කෙනෙක් පිළිගන්නා කාරණාවක්. තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා තාත්තාගේ අඩි පාරේ යමින් යම් ව්‍යාපාරයක් කළාද? ඒ ව්‍යාපාරයෙන් අධික මුදලක් හම්බ කළාද? ඒ හම්බ කරපු සියලු මුදල් සමාජයේ යහපත සඳහා යෙදෙව්වා. මම පෞද්ගලිකව දන්නවා. එතුමාගේ ඉඩකඩම්, එතුමාගේ දේපළ සියල්ල විකුණලා, එතුමා ඒ මුදල් තමන් නියෝජනය කරපු දේශපාලන පක්ෂය වෙනුවෙන් කැප කරපු මන්ත්‍රීවරයෙක්. ඒ නිසා තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා උඩුගහපත්තුව ප්‍රදේශයේත්, හෝමාගම ආසනයේත් අපි නියෝජනය කරන කැස්බෑව ආසනයේත් ඉතා ජනප්‍රිය මන්ත්‍රීවරයෙක් බවට පත් වෙලා තිබුණා.

විශේෂයෙන්ම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාගේ යම් ක්‍රියාදාමයක් තිබුණා. යම්කිසි පාරක් හදනවා නම්, යම් විදුලි මාර්ගයක් හදනවා නම්, යම් පාරක් කොන්ක්‍රීට් කරනවා නම්, යම් කටයුත්තක් කරනවා නම්, ප්‍රජා ශාලාවක් හදනවා නම් එතුමා ඒ ප්‍රජා ශාලාවේ හෝ පාරේ හෝ ඇස්තමේන්තුව ගෙනැල්ලා ගමේ කමිටුවක් හදලා ඒ ගමේ අයගේ අතට දෙනවා. දීලා ගමේ අයට කියනවා. මේක හොඳට හොයලා බලන්න. මේකේ මුදල මෙපමණයි. මේක කරන්නේ අහවලා. මේකේ දිග ප්‍රමාණය මෙපමණයි. මේකට ගල් මෙපමණක් ගේන්න ඕනෑ. වැලි මෙපමණක් ගේන්න ඕනෑ කියලා දැනුවත් කරනවා. ඒ නිසා අවංකව, අන්න ඒ කාරණා එතුමා මන්ත්‍රීවරයෙක් වෙලා ඉන්න කාලයේ කළා. අද වාගේ මට මතකයි. ඇස්බැස්ටොස් ෂීට් ඉස්සර දෙන්නේ නැහැ. සෙවිළි තහඩු දෙන්නේ. එතුමා නිලධාරීන්ව එක්ක ගෙන යනවා, චෛත්‍යාලිංගම් කොම්පැනියට. එක්ක ගෙන ගිහිල්ලා, එයා ඉස්සරහා චෙක් එක සටහන් කරලා, සත පහක්වත් කාටවත් කමිෂන් ගන්න දෙන්නේ නැහැ. ඒ මුදලට හරියන්න සම්පූර්ණයෙන්ම අවශ්‍ය සෙවිලි තහඩු හරි ගන්නවා නම් එතුමා පෞද්ගලිකවම මැදිහත් වෙලා ඒක කරනවා. ඒ නිසා එවැනි අවංක මන්ත්‍රීවරයෙක්.

අද තමුන්නාන්සේලා දන්නවා. පාසල්වල ආපන ශාලා තිබෙනවා. මේවා පාලනයකින් තොරව කළේ. කෑම දෙන්නේ හිතෙන හිතෙන විධියට. මිල ගණන් හිතෙන හිතෙන විධියට. තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා තමයි අපේ හිටපු ගරු ප්‍රධාන අමාත්‍ය රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා ඉන්න කාලයේ, ඒ සඳහා කාරක සභාවට යෝජනාවක් ගෙනැල්ලා, බස්නාහිර පළාතේ ආපන ශාලා සියල්ල ටෙන්ඩර් කරලා, ප්‍රමිතියකට ආපන ශාලා පවත්වාගෙ යන්න, දරුවන්ට හොඳ ආහාර වේලක් ලබා දෙන්න අවශ්‍ය යෝජනාව සභා සම්මත කළේ, තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාය කියන එක මම මේ වෙලාවේ ගෞරවයෙන් මතක් කරනවා.

තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා අවිවාහකයෙකු හැටියට දේශපාලනය කළා. මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කළා. ඒ තමන් උපයා ගත් සියලු දේ මහජනතාව වෙනුවෙන් කැප කරපු ගරු මන්ත්‍රීවරයෙක් කියන එක මම මේ වෙලාවේ ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ. ඒ නිසා උඩුගහපත්තුව ප්‍රදේශයට, හෝමාගම ආසනයට, එතුමාගේ අභාවය විශාල පාඩුවක්. ඒ නිසා මේ කනගාටුදායක අවස්ථාවේ එතුමාගේ ආදරණීය සහෝදරයා ඒ පවුලේ ඥාතීන් මේ සභාවට ඇවිල්ලා ඉන්නවා. ඒ නිසා බස්නාහිර පළාත් සභාව මේ වෙලාවේ තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා මේ පළාත් සභාවේ මන්ත්‍රීවරයකු හැටියට වසර 20 ක් පුරා ඒ කළ මෙහෙවර අගය කරමින්, එතුමාගේ අභාවය පිළිබඳව කනගාටුව ප්‍රකාශ කරන අතරම, සසර අවසානයේදී අපි කවුරුත් බලාපොරොත්තු වන ශාන්ත අමා මහා නිර්වාණ සම්පත්තිය එතුමාට අත්වේවායි කියලා බෞද්ධයකු හැටියට ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හිතේ දුකක් තිබුණත් මම සතුටු වෙනවා. මේ වාගේ අපූරු සුන්දර, නිහතමානී ජනතා සේවකයකු අභාවයෙන් පස්සේ මේ උත්තරීතර සභාවේ එතුමා වෙනුවෙන්, එතුමාට කරන ගෞරවයක් හැටියට, එතුමාගේ පවුලේ අයට කරන ගෞරවයක් හැටියට වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව. තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා කියන්නේ, සැබවින්ම අර්ථාන්විත දේශපාලඥයෙක්. අර්ථාන්විත සමාජ සේවකයෙක් කියලා මම මේ අවස්ථාවේදී නොපැකිලව කියනවා. එතුමා ගම් ප්‍රදේශය නියෝජනය කරමින්, ජාතික තලයට දේශපාලඥයෙක් හැටියට ප්‍රවිෂ්ට වෙමින් ගරු සභානායකතුමා කිව්වා වාගේ, කිසිම හොරකමක්,

නරක දෙයක් නොකර ජනතා සේවය සඳහා කැප වුණු පුද්ගලයෙක් කියන කාරණාව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. එතුමා අප අතර, ජීවතුන් අතර නැති වුණත් එතුමාට කරන ගෞරවයක් හැටියටත්, ඒ වාගේම එතුමාගේ පවුලේ ඥාතීන්ට කරන ගෞරවයක් හැටියටත් මම මේක ප්‍රකාශ කරනවා. තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා කසාද බැඳලා හිටියේ නැහැ. කවුරුත් ඒක දන්නවා. අපි හුඟාක් වෙලාවට කසාදයක් බැඳපන් බං කියලා කිව්වත්, ඒ සියල්ලම අතපසු වුණේ එතුමා ඊට වඩා සමාජ සේවය නැමැති යුතුකම මූලික කර ගෙන හිටපු නිසා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මතකයි. රෙජිනොල්ඩ් කුරේ මැතිතුමා ප්‍රධාන අමාත්‍යවරයා වෙලා ඉන්න කාලයේ එක්තරා හැන්දෑවක ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ කථිකාවක් තිබුණා. රාජපක්ෂ මන්ත්‍රීතුමා ඇවිල්ලා කිව්වා, සර් හැම පාසලකම කැන්ටිම දාලා ඉහළ මිනිස්සුයි, පල්ලෙහා මිනිස්සුයි හොරකම් කරනවා. ඒ වාගේම ප්‍රමිතිගත ආපන ශාලා නැති නිසා දරුවන් රෝගාතුර වෙනවාය කියලා. මේක එක්තරා ප්‍රකාශයක් වුණත් ඒක එතුමා ගැඹුරින් රෙජිනෝල්ඩ් කුරේ ප්‍රධාන අමාත්‍යතුමාට - එවකට මම අමාත්‍යවරයෙක්. මා ඉස්සරහා පිට එතුමා ඒක සපථ කරලා කිව්වා. මේ වැඩ පිළිවෙළ තුළ බස්නාහිර පළාත් සභාවට අයත් සියලුම පාසල්වල දරුවන්ගේ සෞඛ්‍ය සඳහා මේ ආපන ශාලා පැවැත්වෙන්න ඕනෑ. ඒ ආපන ශාලාවල ප්‍රමිතියක් තිබෙන්න ඕනෑ. ඒ ආපන ශාලා තුළින් ඒ ආපන ශාලා හිමියෝ දරුවන්ව සූරා කනවා. ඒ නිසා මේ ආපන ශාලා සියල්ලම ටෙන්ඩර් කරලා, වැඩි ඉල්ලුමට, හොඳ ඉල්ලුමට මේවා ප්‍රදානය කළ යුතුයි කියලා පැහැදිලි කළා. ඒ අවස්ථාවේදී පළාත් සභාවේ ඇතැම් අය අතර කසුකුසුවක් ආවා විතරක් නොවෙයි, විරෝධතාවයක් ආවා. මොකද, තමන්ගේ හිතවතුන්ට ආපන ශාලා දෙන්න බැරි වීම පිළිබඳව. නමුත් අකමැත්තෙන් වුණත් එදා අධ්‍යාපන ඇමතිවරයා හැටියට රෙජිනෝල්ඩ් කුරේ ප්‍රධාන අමාත්‍යවරයා චක්‍රලේඛයක් නිකුත් කළා. සියලුම පාසල්වල ආපන ශාලා ටෙන්ඩර් කළ යුතුයි කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට පුදුමයි. ටෙන්ඩර් කරපු ඒ වර්ෂයේ විතරක් අපේ බස්නාහිර පළාත් සභාවට ආදායම මිලියන ගණනක්. කෝටි ගණනක්. විශාල මුදලක්. අපට අදහා ගන්න බැරි වුණා. ඒ නිසා මම හිතන්නේ, නිර්මාණශීලී, කාලෝචිත, පළාත් සභාවට ළෙංගතු, ජනතාවට ළෙංගතු පුද්ගලයෙක් හැටියට එතුමා කළා වූ ක්‍රියාදාමය අදත් ගලාගෙන යනවා. මම මේක ප්‍රකාශ කළේ එතුමා නිකම්ම නිකම් පළාත් සභා මන්ත්‍රීවරයෙක් නොවෙයි. එතුමා ඉතාමත්ම හොඳ තීක්ෂණ බුද්ධියක් තිබෙන, යුතුකම් ඉෂ්ට සිද්ධ කරන්න පුළුවන් කෙනෙක් කියන කාරණාව මේ සභාව තුළ ප්‍රකාශ කරන්නයි.

ඊළඟට ගරු සභානායකතුමාත් කිව්වා වාගේ පරිත්‍යාගශීලීභාවය. මම කිව්වා අපූරු සුන්දර මනුස්සයෙක් කියලා. දැන් තමුන්නාන්සේලා හුඟක් අය දන්නවා ඇති. අපි විදේශ චාරිකා යන කොට අපි හුඟක් දෙනා ගෙනියන්නේ ඇඳුම් ටික විතරයි. අපි ඔක්කොම කියනවා. තිලකරත්න රාජපක්ෂ එනවා නේ? අපි ආදරයට කියනවා, තිලකෙ එනවා නේ? ප්‍රශ්නයක් නැහැ. අපි කවුරුවත් කෑම බීම ගෙනියන්නේ නැහැ. නමුත් තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා එතුමාගේ ඇඳුම් බෑග් එකට අමතරව විශාල තව බෑගයක් ගෙන එනවා. ඒකේ ටින් කෑම තිබෙනවා. අච්චාරු තිබෙනවා. සීනි සම්බෝල තිබෙනවා. ඒ විතරක් නොවෙයි අපව එහිදී සතුටු කරන්න - මම කියන්නේ නැහැ ඒ මොන වතුරද කියලා. අපට හොඳ ගුණාත්මක පැන් වර්ග එතුමා අරගෙන යනවා. ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාත් ඒ අවස්ථාවට සම්බන්ධ වෙලා ඇති. එතුමා ඉතාමත්ම පරිස්සමෙන් හැමෝම අතරම මේවා බෙදලා දෙනවා. එක්සත් ජාතික පක්ෂයේ අය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය - ජනතා විමුක්ති පෙරමුණේ අය මේ ගමන් යන්නේ නැහැ. නමුත් අපව එක කාමරයට ගෙනැල්ලා අපි සියලු දෙනාම සතපවනවා. ඒකේදී එතුමා අපේ ප්‍රියශීලීභාවය හා මිත්‍රත්වය, මිතුදම ඇති කිරීමයි කරන්නේ. ඒක මේ පළාත් සභාවේ පැවැත්මට හුඟක් ඉවහල් වුණා. මම මේ කාරණා කියන්නේ, මේවා හුඟක් අය හිතන්න පුළුවන් බොළඳ කාරණා කියලා. නමුත් ඒවා ඉතාමත් වැදගත් කාරණා වුණා.

ඒ වාගේම අපේ සුනිල් ජයමිණි ගරු සභානායකතුමා කිව්වා වාගේ එතුමා පළාත් සභාව 1993 සිට නොකඩවා නියෝජනය කළා. නමුත් අවාසනාවකට ගියවර එතුමාට මේ අවස්ථාව ලැබුණේ නැහැ. ඒක මේ තිබෙන ජරාජීර්ණ දේශපාලනයේ ස්වරූපය. වැඩ කරන මිනිස්සුන්ව - ජනතාව තේරුම් ගන්නේ නැහැ. මේ අසුන්දර දේශපාලනය තුළ ඒ සුන්දර මනුස්සයෙකුට මේ පළාත් සභාව නියෝජනය කිරීමේ අවස්ථාව අහිමි වුණා. මම දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා කියන්නේ, සැබවින්ම අර්ථාන්විත, යහපත්

[ගරු හෙක්ටර් බෙත්මගේ]

දේශපාලඥයෙක්. එවැනි දේශපාලඥයෙකුගේ වියෝව මුළු බස්නාහිර පළාත් සභාවටම විශාල පාඩුවක් විතරක් නොවෙයි. මේ බස්නාහිර පළාත් සභාව තුළ රැව් පිළිරැව් දෙන කථා එදා තිබුණා නම් ඒවාවල අර්ථාන්විත කථා කිහිපයක් කරපු හොඳ බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයෙක් කියන කාරණාව එතුමා වෙනුවෙන් ප්‍රකාශ කරනවා. ඒ වාගේම එතුමාගේ පවුලේ අයට අපි අපේ ගෞරවය පුද කරනවා. කුමක් සඳහාද? එතුමාට ඒ සමාජ සේවය කරන්න පසුතලය නිර්මාණය කරලා දුන්නේ, ඒ පවුලේ උදවිය. ඒ අයටත් ස්තුතිවන්ත වෙමින් අවසානයේ අපේ කළණ මිතුරාට අපි ප්‍රාර්ථනා කරන නිර්වාණ සුවය හේතු වාසනා වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. තිලකරත්න රාජපක්ෂ මැතිතුමාගේ ශෝක නිවේදනය යටතේ කථා කරන්න ලැබුණාම මම කල්පනා කළා වචන කිහිපයක් කථා කරන්න ඕනෑය කියලා. ඊට හේතුව එතුමා නියෝජනය කළේ හෝමාගම ආසනය වුණත්, අපි මායිමේ ජීවත් වුණු උදවිය. මම කැස්බෑවේ. තිලකරත්න රාජපක්ෂ මැතිතුමා, මේ අපේ සභානායකතුමා ප්‍රකාශ කළා වාගේ හෝමාගමට ආවේණික වුණු පුද්ගලයෙක් නොවෙයි. මුළු කොළඹ දිස්ත්‍රික්කයටම ආවේණිකව ජීවත් වුණු චරිතයක් බවට එතුමා පරිවර්තනය වුණා. එතුමා වෙනුවෙන් වචනයක් කථා කරන්න ඕනෑය කියලා අපි අදහස් කළේ, එතුමා අද ජීවත් වන දේශපාලඥයින්ට හොඳ පාඩමක්, හොඳ ආදර්ශයක් දීලා, ඉතිහාසයක් තබලා තමයි එතුමා ජීවිතයෙන් සමුගත්තේ. අපි දැක්කා. මම දීර්ඝව කථා කරන්න උත්සාහ ගන්නේ නැහැ. එතුමා හෝමාගම ආසනයේ උඩුගහපත්තුවේ උත්පත්තිය ලැබුවේ. ඒ ගමේ එවකට හිටපු වැදගත් පවුලක දෙමව්පියන් දෙදෙනෙකුට දාව. එතුමා උත්සාහ කළා හැම තිස්සේම ඒ දෙමව්පියන්ගේ ගරුත්වය ආරක්ෂා කර ගෙන, ඒ පළාතේ ගෞරවය, ඥාතීන්ගේ ගෞරවය ආරක්ෂා කර ගෙන බොහොම සාධාරණ මනුස්සයෙක් වශයෙන් ජීවත් වෙන්න. දේශපාලඥයෝ මිය ඇදුනාම සමහර තැන්වල පවුල්වලට දරුවන්ට ජීවත් වෙලා ඉන්න ඒ උදවියට ප්‍රශ්නයක්, ඉදිරි කාලය ඇදගෙන යන එක. අද එතුමා මිය ගියාට එහෙම තත්ත්වයක් නැහැ. නමුත් තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා අපිත් එක්ක එදා 2004 දී මේ පළාත් සභාවේ ඇවිල්ලා එකට ජීවත් වුණා. ඊට කලින් මම එතුමාව දැන ගෙන හිටියේ. මගේ ඥාති සම්බන්ධයකුත් තිබෙනවා. ඊට වැඩිය ගිය අපේ ගමේ තිබුණු මිත්‍රශීලීකමක්, අප අතර බැඳියාවක් තිබුණා. එහෙම නම් එතුමා අද මේ යුගයට පාඩමක් ඉගැන්නුවා. තමන් මිය ඇදුනත් ජීවත් වෙලා ඉන්න උදවියටත් යහපත්කමක් ඇතිව ජීවත් වෙන්න පුළුවන්කමක් තිබෙන්න ඕනෑ. ගමේ මිනිහෙකුගෙන් කථාවක් අහන්නේ නැතිව ජීවත් වෙන්න පුළුවන් හැකියාවක් තිබෙන්න ඕනෑ. එහෙම නම් එතුමා එතැනට, ඒ තත්ත්වයට පත් වෙලා තමයි මිය ඇදුනේ කියන එක මම මේ ගරු සභාවට කියන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. එතුමා දේශපාලනය විතරක් නොවෙයි කළේ. තමන්ගේ ව්‍යාපාර, දෙමව්පියන්ගෙන් පැවති ව්‍යාපාර ඒ විධියටම ආරක්ෂා කර ගෙන වැදගත් මහත්මයෙක් වාගේ ජීවත් වුණා. ඒ වාගේම එතුමා තමන්ගේ දෙමව්පියන් සතුව තිබුණු ගොවිතැන් බත, කුඹුරු වගා කර ගෙන ගියා. ඒවා එකක්වත් අතඇරියේ නැහැ. තමන්ට ආවේණික ජීවිතයක් ගත කරපු බොහොම වැදගත් මහත්මයෙක් බවට පරිවර්තනය වුණාය කියන එක මම මේ සභාවට දන්වනවා. එහෙම නම් අපි බෞද්ධයෝ වශයෙන් යම්කිසි විධියකින් උපන්නාම අපට මරණය නියතයි. එහෙම නම් තිලකරත්න රාජපක්ෂ මැතිතුමා කාගෙන්වත් කථාවක් අහන්නේ නැතිව, හොඳ මන්ත්‍රීවරයෙක් බවට පරිවර්තනය වෙලා, එතුමා ගමේ හොඳ දේශපාලඥයෙක් වශයෙන් හැසිරිලා අද අපි එක්සත් ජාතික පක්ෂයේ - අපි කඳවුරු දෙකක හිටියේ. තිලකරත්න රාජපක්ෂ මැතිතුමා ප්‍රතිපත්තිගරුක දේශපාලඥයෙක් බවට පරිවර්තනය වුණා. වාසියට එහෙට මෙහෙට පැන්නේ නැහැ. අපි මේ පැත්තේ ඉන්නවා. නමුත් අද අපි ආයාසයෙන්, වෙලාව ඉල්ලා ගෙන කථා කරන්න ඉදිරිපත් වෙන්නේ මොකද, එතුමාගේ ඒ තිබුණු ගුණ යහපත්කම නිසා. එහෙම නම් අපි බෞද්ධයෝ වශයෙන් පතන්නා වූ බෝධියකින් එතුමාට නිවන් සැප ලැබෙන්නය කියලා ප්‍රාර්ථනා කරමින්, සමස්ත එක්සත් ජාතික පක්ෂයේ ශෝකයත් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි නියෝජනය කරන හෝමාගම මැතිවරණ කොට්ඨාශය නියෝජනය කරලා, බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කරපු තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා පසුගියදා අප අතරින් වෙන් වුණා. ඒ පිළිබඳව ශෝක ප්‍රකාශය කරන අවස්ථාවේදී එතුමා වෙනුවෙන් වචන කිහිපයක් මේ සභාවේ කථා කරන එක අපේ යුතුකමක් විධියට මම දකිනවා.

විශේෂයෙන්ම තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාව මම දැන හඳුනා ගත්තේ, එතුමා පළමුවෙන්ම ප්‍රාදේශීය සභා මැතිවරණයට ඉදිරිපත් වුණු අවස්ථාවේදී. එදා හෝමාගම ආසනයේ දේශපාලන පෙරළියක් කරලා, මුල් අවස්ථාවේදී පුටුව ලකුණ හඳුන්වා දීලා එක්සත් ජාතික පක්ෂ රජය තිබෙන වෙලාවේ පොදු ජන එක්සත් පෙරමුණෙන් පළමු වැනි වතාවට හෝමාගම ප්‍රාදේශීය සභාවට තරග වැදුනු වෙලාවේදී, ඒ කණ්ඩායමේ දෙවැනි ස්ථානයට පත් වුණේ තිලකරත්න රාජපක්ෂ මැතිතුමා. එදා මගේ පියාත් මුල් අවස්ථාවේදී ඒ ලැයිස්තුවෙන් ප්‍රාදේශීය සභාවට තරග කළා. එතුමා එදා ඒ ආරම්භ කරපු දේශපාලන ගමන, හෝමාගම ආසනය ප්‍රධාන කොළඹ දිස්ත්‍රික්කයේම, බස්නාහිර පළාත් සභාව තුළම ඉතා ජනප්‍රිය චරිතයක් බවට එතුමාට පත් වෙන්න පුළුවන්කම ලැබුණා. අපි දැකපු දෙයක් තමයි. එතුමාගේ තිබුණා කොන්ද කෙළින් තිබෙන ගතියක්. එතුමා හැම අවස්ථාවකදීම නිවැරදි පිළ නියෝජනය කරලා එතුමා අල්ලස, දූෂණය, වැරදි දේට එරෙහිව කෙළින් හිට ගෙන කථා කරපු මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම එතුමාත් සමඟ පුදුම විශ්වාසයක් ජනතාව අතර ඇති වෙලා තිබුණා. මුළු හෝමාගම ආසනයේම තරුණ පිරිස් අතර ලොකු ශක්තියක් එතුමා ගොඩ නගා ගෙන තිබුණා. අපට මතකයි. එවකට තිබුණු එක්සත් ජාතික පක්ෂ රජය පෙරළන අවස්ථාවේදී චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ජනාධිපතිනිය වුණු අවස්ථාවේදී, ඊට පසුව මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා වන අවස්ථාවේදී එතුමා මන්ත්‍රීවරයෙක් වශයෙන්, මහජන නියෝජිතයකු වශයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට පුදුම ශක්තියක් එතුමා ලබා දුන්නා. එතුමාගේ ඒ ජන බලය ඒකරාශී කරලා, හෝමාගම ආසනය තුළ ඒ හැම සටනකටම එතුමා නායකත්වය දුන්නා. එදා තිබුණු ජනඝෝෂා, අත්වැල්, පාද යාත්‍රා ඒ හැම එකකම පෙරමුණේ ගමන් ගත් මන්ත්‍රීවරයෙක් වශයෙන් අපි තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාව දකිනවා. ඒ නිසා එතුමා දේශපාලන චරිතයක් වශයෙන් හැමෝටම ආදර්ශවත් චරිතයක්. එතුමා දේශපාලනයට එන කොටත් හොඳ ව්‍යාපාරිකයෙක්. ඒ වාගේම පවුල් පසුබිම අතින් විශාල යමක් කමක් තිබුණු, දේපළක් තිබුණු පවුලක දරුවෙක්. අපි දකිනවා. අපි අහලා තිබෙනවා. එතුමා දේශපාලනය තුළ කිසිම වැරදි දෙයක් නොකරපු මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම එතුමාට කාටවත් චෝදනාවක් කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. එතුමාගේ දේශපාලන පාඨය වුණෙත් යස ඉසුරු නොපැතූ දේශපාලනයක් කියන එක. ඒක හරියාකාරව එතුමා කර ගෙන ගියා. දෙවැනි පළාත් සභාවේ සිට පස් වන පළාත් සභාව වන තෙක් අපරාජිතව ඒ පළාත් සභා සියල්ල නියෝජනය කරන්න හෝමාගම ආසනයේ ජනතාව එතුමාට මූලිකත්වය දීලා, අවස්ථාව ලබා දුන්නා. දීර්ඝ වශයෙන් කථා කරන්න අවස්ථාව නොවෙයි. කෙසේ නමුත් තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා කියන්නේ, අද දේශපාලනයේ ඉන්න සියලු දෙනාටම හොඳ ආදර්ශවත් චරිතයක්. මොකද, එතුමා දේශපාලනය කරලා, දේශපාලනයෙන් හරි හම්බු කරන්න උත්සාහ කරපු කෙනෙක් නොවෙයි. එතුමා දේශපාලනයෙන් හරි හම්බු කළේ නැහැ. එතුමාගේ යමක් කමක් තිබුණා නම්, තමන්ගේ යෞවනත්වයේ සිටම තමන්ගේ ජීවිතය පවා දේශපාලනය වෙනුවෙන් වැය කළා. අඩුම ගණනේ එතුමා විවාහයක් කර ගන්නවත් හිතුවේ නැහැ. එතුමා හැම මොහොතකම හිටියේ තමන්ගේ පිරිස සමඟ. කොයි වෙලාවේ බැලුවත්, රාත්‍රියේ බැලුවත්, දවල් බැලුවත්, මළ ගෙයක් වුණත්, මඟුල් ගෙයක් වුණත් එතුමා රෑ දොළහද, එකද, දෙකද ඒ ගමේ ජනතාව නියෝජනය කරපු නායකයෙක්. ඒ නිසා එතුමා වෙන් වීම අද අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විශාල පාඩුවක්.

අපි ඊයේ පෙරයිදාත් අපේ පක්ෂයේ පිරිස සමඟ කථා කරද්දීත් උඩුගහපත්තුව ප්‍රදේශයට එතුමා දීපු නායකත්වය අදත් අපට සම්පූර්ණ කරන්න පුළුවන්කමක් නැහැ. අපි යෝජනා කරනවා. එතුමාගේ පවුලේ සහෝදරවරු ඉන්නවා. ඔවුන්ට ඇවිල්ලා මේ අඩුපාඩුව නියෝජනය කරලා, එතුමා වෙනුවෙන් එතුමා ගෙන ගිය හඬ ගෙනිහිල්ලා නැවතත් බස්නාහිර පළාත තුළ නියෝජනය කරන්න ලංකාවේ දේශපාලනය නියෝජනය කරන්න අවස්ථාව ලැබෙන්නය කියලා. අවසාන වශයෙන් ඒ පවුලේ සියලු දෙනාට ශෝකය ප්‍රකාශ කරමින්, අපේ ආගම අනුව අපි ප්‍රාර්ථනා කරන අජරාමර නිවන් සුව එතුමාට අත් වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Hector Bethmage M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

තිලකරත්න රාජපක්ෂ හිටපු පළාත් සභා ගරු මන්ත්‍රීතුමා වෙනුවෙන් ශෝක ප්‍රකාශ කරන මේ අවස්ථාවේදී උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාගේ ශෝක යෝජනාවට කථා කරන්න අවස්ථාවක් ලැබීම ගැන ප්‍රථමයෙන්ම මගේ ස්තුතිය පුද කර සිටිනවා. තිලකරත්න රාජපක්ෂ මැතිතුමා මේ සභාවේදී අපේ මන්ත්‍රීවරුන් කිව්වා වාගේ, 1991 පැවති පළාත් පාලන මැතිවරණයේදී, එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ප්‍රබලව මේ රටේ තිබෙන වෙලාවේ, ඒ භීෂණය තිබෙන කාලයක තිලකරත්න රාජපක්ෂ මැතිතුමා හෝමාගම ආසනයෙන් පළාත් පාලන මැතිවරණයට පුටුව ලකුණෙන් තරග කළා. එදා ඒ ගහපු සන්ධානය අනුව පුටුව ලකුණින් තරග කරලා තමයි එදා සුනිල් පෙරුම්බුලි මැතිතුමා එක්ක නායකත්වය අරගෙන තරග කරලා තමයි එදා ජයග්‍රහණය කරන්න පුළුවන්කම ලැබුණේ. එදා පළාත් පාලන මැතිවරණය වෙලාවේ මම මහරගම ආසනයෙන් තරග කරන කොට තිලකරත්න රාජපක්ෂ මැතිතුමා හෝමාගම ආසනයෙන් තරග කරලා, එදා ජයග්‍රහණය කළා. එදා 1993 තිබුණු පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වෙලා එතුමා 1994 පළාත් සභාවට තේරිලා විශාල සේවාවක් මේ පළාත් සභාව තුළ කළා. එතුමා අධ්‍යාපන විෂය ගැන, ඒ වාගේම අපේ ගමේ පාරවල් ගැන, විහාරස්ථාන ගැන, දහම් පාසල් ගැන, ක්‍රීඩාව ගැන මේ විවිධ අංශ ගැන විශාල කැපවීමකින් වැඩ කරපු මන්ත්‍රීවරයෙක් තමයි තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා. මට මතකයි එතුමා එදා එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව මහින්ද රාජපක්ෂ මැතිතුමා පා ගමන යන කොට, මිනිස් දම්වැල යන කොට - මේ රටේ මිනිස්සුන්ව මරණ කොට දේවාලයට ගිහිල්ලා පොල් ගහන්න යන කොට තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාගේ කණ්ඩායමත් එක්ක එතුමා පෙරමුණේ ගිහිල්ලා මේ රටේ යහපත් ආණ්ඩුවක් පිහිටුවා ගන්න එදා එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව ඒ මහා සටන දියත් කරපු හොඳ නායකයෙක් තමයි හෝමාගම ආසනයේ හිටපු තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා. ඒ විතරක් නොවෙයි. මේ මන්ත්‍රීවරු කලින් කිව්වා වාගේ, එතුමාට පරම්පරාවෙන් ලැබුණු තමන්ගේ දේපළ, තමාගේ අම්මා තාත්තාගෙන් ලැබුණු ඉඩකඩම්, ඒ සියල්ලක්ම මේ අපේ රටේ යහපත වෙනුවෙන්, දුප්පත් මිනිහා වෙනුවෙන්, හෝමාගම ජනතාව වෙනුවෙන් කැප කරලා වැඩ කරපු ජන නායකයෙක්. ඒ වාගේම එතුමාගේ ව්‍යාපාර කටයුතු එතුමා සාර්ථකව කර ගෙන යමින්, සෑම මළ ගෙදරකටම යම් දෙයක් දුන්න කෙනෙක්. එතුමා නැති මළ ගෙදරක් නැහැ. ඒ වාගේ තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා සමාජ සේවකයෙක් හැටියට විශාල කටයුත්තක් කරපු කෙනෙක්. ඒ වාගේම දහම් පාසලට, පන්සලට විශාල සේවාවක් කරපු මන්ත්‍රීවරයෙක් තමයි තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා.

පසුගිය කාලයේ මට මතකයි මම මහා මාර්ග අමාත්‍යවරයා වශයෙන් ඉන්න කොට එතුමාගේ ගෙදරට යන පාර පළල් කර ගන්න ගිහිල්ලා සමහර තැන්වලින් ඒ පාර සඳහා ඉඩ නොදෙන කොට එතුමා බොහොම කලකිරීමෙන් ඇවිල්ලා එදා හිටපු මහ ඇමති ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමාට කථා කරලා, මට කථා කරලා, මාව ගෙන්වලා ඒ පාරේ වැඩ කරලා කාපට් කර ගන්න කටයුතු කරලා දෙන්නය කියලා කිව්වා. එතුමා අන්තිම මොහොතේදීත් කරපු එකම ඉල්ලීම තමයි. එතුමාට ඒක කරලා දුන්නා. අපට ඒ යුතුකම එතුමා වෙනුවෙන් ඉටු කරන්න පුළුවන්කමක් ලැබුණා. තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා අපට නැති වීමේ ශෝකය වෙනුවෙන් අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රගතිශීලී පෙරමුණ වෙනුවෙන් කැප කරපු කෙනෙක් හැටියට, එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අද මේ වෙලා තිබෙන යහපාලන ක්‍රමයත් එක්ක හිටියා නම් මම හිතන්නේ, අද පළමුවෙන්ම කලකිරෙන මනුස්සයා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රගතිශීලීන් වෙනුවෙන්, රටේ දුප්පත් මිනිස්සු වෙනුවෙන් තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා ඒ පෙරමුණේ නායකත්වය ගන්න කෙනෙක් කියලා අපි මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ නිසා

තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා ඒ කළ සේවාවට එදා චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ පළාත් සභා කාලයේ, සුසිල් ප්‍රේමජයන්ත මහ ඇමතිතුමාගේ කාලයේ, මොරිස් රාජපක්ෂ මහ ඇමතිතුමාගේ කාලයේ, රෙජිනෝල්ඩ් කුරේ මහ ඇමතිතුමාගේ කාලයේ, ඒ වාගේම ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමාගේ කාලයේ විවිධ වැඩ ගෙනැල්ලා පළාත් සභාවට විවිධ ක්‍රම සකස් කරලා දුන්නා. අපේ සුනිල් ජයමිණි ගරු සභානායකතුමා කිව්වා වාගේ, පාසල් කැන්ටින් ක්‍රමය අපට හඳුන්වලා දුන්නේ අපේ තිලකරත්න රාජපක්ෂ මැතිතුමා. ඒ නිසා එතුමා විශාල සේවාවක් කළා. අපි හිතුවේ නැති වෙලාවක එතුමාට මිය යන්න සිද්ධ වුණා. ඒ නිසා ඒ ශෝකය වෙනුවෙන් එතුමාගේ පවුලේ ඥාතීන්ට විශේෂයෙන් මහරගම - කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් සභා මන්ත්‍රීවරයා හැටියට, එදා 1991 දී අපිත් එක්ක හිටපු කෙනා හැටියට එතුමා නැති වීමේ ශෝකය වෙනුවෙන් අපේ ශෝකය පළ කරමින් එතුමා සංසාර ගමනේ යම් වැරදි තැනක ඉපදිලා ඉන්නවා නම් මේ අපි කථා කරන පින් බලයෙන් එතුමාට හොඳ යහපතක් ලැබේවායි කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සහෝදර හිටපු පළාත් සභා මන්ත්‍රී දිවංගත තිලකරත්න රාජපක්ෂ මැතිතුමා වෙනුවෙන් වචන කිහිපයක් එකතු කිරීම මගේ යුතුකමක් වෙනවා. මොකද, එතුමාත් අපිත් 1991 දී ක්‍රියාකාරී දේශපාලනයට එකතු වුණු අය. එතුමා හෝමාගම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයකු හැටියටත්, මම මහරගම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකු හැටියටත් අපි දේශපාලනය ආරම්භ කළා. ඉන් පසුව එතුමා ඊළඟ පළාත් සභා මැතිවරණයේදී පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට එකතු වුණා. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට මම අවස්ථා දෙකක් නියෝජනය කළා. ඒ නිසා පළාත් සභාවේ මෑත කාලයේ හිටපු ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයකු හැටියට එතුමා මේ රටේ මිනිස්සු ඉල්ලන යහපත් දේශපාලඥයෙක් හැටියට, අවංක දේශපාලඥයෙක් හැටියට එතුමා ජීවත්ව සිටින කාලය තුළදී, මහජන නියෝජිතයකු හැටියට කටයුතු කරන කාලය තුළදී එතුමා ක්‍රියා කළාය කියන එක අපි මේ අවස්ථාවේදී ඉතාම කෘතවේදීව සිහිපත් කරන්න ඕනෑ. ඒ වාගේම එතුමා පසුගිය පළාත් සභා මැතිවරණයෙන් පසුව අමාත්‍ය මණ්ඩලය පත් කරන කොට මට ඇමති ධූරයක් නොලැබීම පිළිබඳව එතුමා ඉතා කනගාටුවෙන් කථා කරපු බව එතුමාත් එක්ක දේශපාලනය කරන අය මට කිහිප අවස්ථාවකදීම ප්‍රකාශ කරන්න යෙදුණා. එතුමා මනුස්සයන්ව ගොඩ නගන්න කටයුතු කළාට, තමන්ගේ ගම, තමන් ඉන්න ප්‍රදේශය, මිනිස්සුන්ගේ ජන ජීවිතය නගා සිටුවන්න කටයුතු කළාට එතුමාට එතුමාගේ ජීවිතය පිළිබඳව කිසිම ආදරයක් තිබුණේ නැහැ. ඒ නිසා තමයි එතුමාට මේ තරම් ඉක්මණින් අපව අතහැරලා යන්න සිද්ධ වුණේ. නැත්නම් එතුමා අදත් අප අතර ජීවත් වන කෙනෙක්. හැබැයි, අවාසනාව තමයි, එවැනි මේ සමාජයට ආදරය කරන, රටට ආදරය කරන, මිනිස්සුන්ට ආදරය කරන මිනිස්සුන්ට දීර්ඝ ආයුෂයක් වින්දනය කරන්න අවස්ථාව ලැබෙන්නේ නැහැ. ඒ වාගේ අයට ඒ අවස්ථාව ලැබෙන්නේ නැහැ. ඒක මම හිතන්නේ එතුමාගෙන් සේවාව ලබා ගන්න ඉන්න මිනිස්සුන්ගේත් අවාසනාවක් හැටියට මම දකිනවා. එතුමා අද ජීවත් වෙලා හිටියා නම් අද එතුමා විශාල සන්තෝෂයකට පත් වෙනවා. එතුමා බලාපොරොත්තු වුණේ, මාව ඇමතිවරයෙක් කරන්න. අද මට ප්‍රධාන අමාත්‍ය ධූරය ලැබිලා තිබෙනවා. එතුමා ජීවත්ව හිටියා නම් වඩාත් සතුටට පත් වන අය අතර එතුමාත් ඉන්නවාය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා ගම් මට්ටමේ, බිම් මට්ටමේ මිනිස්සුත් එක්ක තමන්ගේ දේශපාලන ගමන් මග එළි පෙහෙළි කරපු කෙනෙක්. දූෂණයට, වංචාවට එරෙහිව හඬ නගපු කෙනෙක්. මේ රටේ යහපත් දේශපාලනයක්, යහ පාලනයක් උදා කරන්න කැප වුණු කෙනෙක්. ඒ වාගේම තමන් ව්‍යාපාරිකයකු හැටියට, ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ එතුමා ලබන ආදායමෙන් විශාල කොටසක් වාගේම එතුමාට තිබුණු දේපළ, වස්තු එතුමා ජනතාව වෙනුවෙන් පූද කරපු කෙනෙක්. මම හිතන්නේ, මෑත කාලයේ අප අතර හිටපු සැබෑ මානව හිතවාදියකු හැටියට අපට තිලකරත්න රාජපක්ෂ මැතිතුමාව හඳුන්වා දෙන්න පුළුවන්. ඒ නිසා එතුමාගේ මව, එතුමාගේ සහෝදරයෝ, ඒ එතුමාගේ ගමන් මග තුළ තවමත් රැඳී සිටිනවාය කියන එක අපි මතක් කරන්න ඕනෑ. පසුගිය දවසක එතුමාගේ පිංකම තිබුණා. නමුත් දිනය මාරු වුණු නිසා මට ඒකට යන්න බැරි වුණා. එතුමාගේ මරණය වෙලාවේදී අපි පළාත් සභා මන්ත්‍රීවරු හැටියට ක්‍රියාකාරී වෙලා, ඒ මව, සහෝදරයන් එක්ක ඒ කටයුතු හොඳින් පවත්වාගෙන යන්න පුළුවන් දායකත්වය, සහයෝගය ලබා දුන්නා. පළාත් සභා මන්ත්‍රීවරුන් හැටියට අපේ ගරු මන්ත්‍රීවරුන්, ගාමිණී තිලකසිරි ගරු ඇමතිතුමා, අපේ ගරු විපක්ෂ නායකතුමා,

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

සුනිල් ජයමිණි ගරු සභානායකතුමා, ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා ප්‍රධාන එතුමාගේ සමකාලීනයන් එතුමා වෙනුවෙන් කැප වෙලා හිටියා. ඒ ප්‍රදේශවාසීන්ගේ ඉතා බලවත් ඉල්ලීමක් තිබුණා, ඒ පාර කාපට් කරන්න. කොහොම නමුත් එතුමා ජීවත්ව සිටින කාලය තුළදී ඒක කරන්න බැරි වුණත් එතුමාගේ අවසන් ගමන කාපට් පාරකින් ගෙනියන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ නිසා අපි විශ්වාස කරනවා. ඒ අවමංගල්‍යයට සහභාගී වුණු වෙලාවේදීත්, අපි සමාජයේදී හමු වන වෙලාවේදීත් ඒ ගමේ ඉන්න, ඒ පළාතේ ඉන්න, පාරේ ඉන්න අය කිව්වේ මේ පාර ගොඩ නගන්න කැපවීමක් කරපු තිලකරත්න රාජපක්ෂ මැතිතුමා වෙනුවෙන් ඒ පාර නම් කරන්නය කියලා. ඒ අනුව පළාත් සභාවේ මට පැවරී ඇති බලතල ප්‍රකාරව මම අද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු විපක්ෂ නායකතුමනි, අපේ පාලක පක්ෂයේත්, විපක්ෂයේත් එකඟතාවය මත එතුමා ජීවත් වුණු, එතුමා පෝෂණය කරපු ඒ පාර එතුමාගේ නමින් අපි ඉදිරි දිනකදී ඒ පවුලේ හා ඒ ගමේ ඉන්න ස්වේච්ඡා සංවිධාන අපට ලබා දෙන දිනකදී මමත් තිලකසිරි ගරු ඇමතිතුමාත්, අපේ ගරු සභා නායකතුමාත්, ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමාත්, ඒ වාගේම අපේ ගරු විපක්ෂ නායකතුමා ඇතුළු ඒ ප්‍රදේශයේ සිටින විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුනුත් ඇවිල්ලා ඒ තිලකරත්න රාජපපක්ෂ ශ්‍රීමතානන් වෙනුවෙන් එතුමා ජීවත් වුණු ගමේ තිබෙන පාර තිලකරත්න රාජපක්ෂ නමින් නම් කරලා කටයුතු කරන්න මේ පළාත් සභාවේ එකඟතාවය ලබා ගනිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී තිලකරත්න රාජපක්ෂ මැතිතුමා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන්නට විනාඩි කිහිපයක් ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඇත්ත වශයෙන් අපිත් එක්ක හිටපු සුන්දරම, නිහතමානීම, අවංක මන්ත්‍රීවරයෙක් කියලා අපි අවිවාදයෙන් පිළිගන්නා මන්ත්‍රීවරයෙක් තිලකරත්න රාජපක්ෂ මන්ත්‍රීතුමා. අපත් එක්ක අවුරුදු දහයක පමණ කාලයක් මේ පළාත් සභාවේ හිටියත් ඊට පෙර සිටම අපේ හිතවත් මිත්‍රයෙක් වශයෙන් අපට ගුරුහරුකම් දුන්න, අපට හැම තිස්සේම අවවාද අනුශාසනා කරපු ඉතාම සුහදශීලී මිත්‍රයෙක්. මම හිතන්නේ, එතුමාව අපි හඳුනාගත්තේ ඒ පාසලේ හිටපු අපේ යසරත්න විදුහල්පතිතුමා සමඟ කුළුපගව සිටීමෙන්. ඒ කාලයේ අපි හැමදාම වාගේ මුණ ගැසුනා. කාලයක් එතුමාට අපි විවාහ යෝජනා ගෙනාවා. මට මතකයි, විදුහල්පතිතුමා විවාහ යෝජනා ගෙනාවා. හැමදාම මග ඇරලා, මට ඕවා කරන්න බැහැයි කියලා කොහොම හරි ලිස්සලා ගියා. එතුමා තමන්ගේ මවට ඉතා ආදරය කළ කෙනෙක්. මම හිතන්නේ එතුමා තරම් මවට ආදරය කරපු මන්ත්‍රීවරයෙක් නැහැ. එතුමා විදේශගත වුණත්, කොහේ හිටියත් නිතරම තමන්ගේ මව පිළිබඳව නිරන්තරයෙන්ම සොයා බැලුවා. අපේ ගරු මන්ත්‍රීවරුන් කිව්වා වාගේ, එතුමා විදේශගතව හිටියත් අම්මාගේ කෑම තමයි කෑවේ. ඒ කෑම ටික හදා ගෙන යනවා. කොහේ ගියත්, ට්‍රිප් එකක් ගියත් එතුමාට එහෙම ගතියක් තිබුණා. මවට පණ සේ ඇලුම් කරපු, මව වෙනුවෙන් ජීවත් වුණු මන්ත්‍රීවරයෙක්.

ඒ වාගේම ඒ ප්‍රදේශයට විශාල සේවාවක් කරපු මන්ත්‍රීවරයෙක්. මම හිතන්නේ අද කවුරුත් කථා නොකළ දෙයක්. කළු ගඟ හරස් කරලා ඒ වතුර කළුතර දිස්ත්‍රික්කයට යන කොට, ඒ උඩුගහපත්තුවේ වතුර තිබුණේ නැහැ. මට මතකයි. දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සමඟ නිරන්තරයෙන් සාකච්ඡා කළා. අපේ කළුතර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන් සමඟ ගැටුම් ඇති කර ගත්තා, හෝමාගම උඩුගහපත්තුව ප්‍රදේශයට වතුර ලබා ගන්න. එතුමාගේ අප්‍රතිහත ධෛර්යය නිසා තමයි ඒ ප්‍රදේශයේ ජනතාවට වතුර ලැබුණේ. මම හිතන්නේ, කෝටි 3000 කට වඩා වැඩි මුදල් සම්භාරයක් වියදම් කරලා, ඒ ප්‍රදේශයට පානීය ජලය ලබා දුන්නේ තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාගේ බලවත් ඉල්ලීම නිසයි. එතුමා සටන් කළා. හැපුණා. මට මතකයි. කළුතර දිස්ත්‍රික්කයේ රත්නසිරි වික්‍රමනායක මැතිතුමා සමඟත් සංවාදයක පැටළුනා. මෙහෙට වඩා ඒ ළිංවල වතුර හොඳයි. අපේ පැත්තේ තමයි ළිඳක් කපා ගන්න බැරි. කළුගල තිබෙන නිසා. ඒ නිසා මෙහෙට වතුර ඕනෑය කියලා සටන් කරලා තමයි එතුමා ඒ ප්‍රදේශයට ජලය ලබා දුන්නේ. මට මතකයි, දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සමඟ නිරන්තරයෙන් සාකච්ඡා කරලා ඒ වතුර ලබා දුන්නා. අද දහස් ගණන් අය පානීය ජලය බොනවා. නමුත් මේකේ මූලාරම්භය ගොඩක් දෙනෙක් දන්නේ නැහැ. රාජපක්ෂ මැතිතුමාට එය විශාල පිනක්. ඒ සඳහා එතුමා විශාල කැප වීමක් කළා.

ඒ විතරක් නොවෙයි. පාසල් පිළිබඳව නිරන්තරයෙන් අවධානය යොමු කළා. ඒ ප්‍රදේශයට ගුරුවරු යනවා හොරයි. බස් නැහැ. ඒ නිසා ගුරුවරු එන්නේ නැහැ. කෝල් කරලා අහනවා. මේ ගුරුවරයාට අපේ පැත්තට එන්න බැරිද? පින් සිද්ධ වෙනවා මේ ළමයින්ට උගන්වන්නය කියලා. එහෙම තමයි එතුමා ඒ ප්‍රදේශයට, උඩුගහපත්තුවට ගුරුවරු ගෙන්වා ගත්තේ. වෙලාවට බස් නැති නිසා ගුරුවරු මාරු වෙලා යනවා. මට මතකයි. මහ ඇමතිතුමාත් එක්ක රණ්ඩු වෙනවා. අපේ පැත්තේ ගුරුවරු මාරු කරන්න එපා කියලා. එක්කෙනෙක් නොදා වෙන කෙනෙක්ව ගන්න එපාය කියලා එතුමා නිර්භයව ප්‍රකාශ කළා. හිටපු ප්‍රධාන අමාත්‍ය, ප්‍රසන්න රණතුංග මැතිතුමාටත් ඇවිල්ලා කිව්වා, මගෙන් නොඅහා එක ගුරුවරයෙක්වත් මාරු කරන්න එපා. අපේ ඉස්කෝලවල ළමයින්ට ඉගෙන ගන්න ගුරුවරු ඕනෑය කියලා කිව්වා. එතුමා අධ්‍යාපනය වෙනුවෙන් විශේෂ කැපවීමක් කළා. යටිතල පහසුකම් දියුණු කරන්න, ජලය ලබා දෙන්න, පාසල ගොඩ නගන්න, සමිති සමාගම් හදන්න ඒ ප්‍රදේශයේ ජන ජීවිතය ගොඩ නගන්න. මම හිතන්නේ, සිය ගණනකට රැකියා ලබා දුන්නා. හැම ඇමතිවරයෙක් ළඟටම ගිහිල්ලා එතුමා සිය ගණනකට පමණ රැකියා ලබා දීලා තමන්ගේ ප්‍රදේශයේ ජනතාවට සේවය කළා.

ඒ නිසා මම හිතන්නේ, මේ වාගේ හොඳ මන්ත්‍රීවරයෙක්. මන්ත්‍රීවරු එනවා. ගොඩක් අය කළු පැල්ලම් ඉතිරි කරනවා. කිසිම කළු පැල්ලමක් නැතිව, සත පහක් හොරකම් කරන්නේ නැතිව, වංචා කරන්නේ නැතිව, ජනතාවට සේවය කරලා මියැදීම භාග්‍යයක්. එතුමා ඒ භාග්‍ය ලැබුවා. අවසානයේ මනාප ක්‍රමයට එතුමා දැන ගෙන හිටියා, මේ පාර මට ෂුවර් එකක් නැහැයි කියලා කිව්වා. ඒත් පැරදුණාට මම කැමැතියි. මම හෝමාගම ප්‍රාදේශීය සභාවට ඉල්ලලා අනිවාර්යයෙන්ම ඒකට එනවාය කියලා කිව්වා. මනාප ක්‍රමයට තිබුණොත් කිසිම ප්‍රශ්නයක් නැහැ. මෙවර පැරදුනු එක හොඳයි. මම ප්‍රාදේශීය සභාවට ඉල්ලනවා කියලා එතුමාගේ බලාපොරොත්තුවක් තිබුණා. එතුමා විශ්‍රාම ගන්න කල්පනා කළේ නැහැ. එතුමා මීට වඩා සේවයක් ඒ නගර සභාව තුළ කරන්න බලාපොරොත්තුවක් තිබුණා. අවාසනාවකට අපි සියලු දෙනාටම යන්න සිදු වන මරණයට එතුමාට යන්න සිදු වුණා. නමුත් එතුමාගේ නාමය අමරණීයයි. එතුමාගේ නමින් ඒ මාර්ගය නම් කිරීමට තීරණය කිරීම පිළිබඳව ගරු මහ ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා කරපු ජනතා මෙහෙවර එතුමා වෙනුවෙන් ඉදිරියේදීත් ඒ ප්‍රදේශයට විශාල වැඩ කොටසක් කරන්න මේ සියලු මන්ත්‍රීවරු දායක වෙලා, එතුමා බලාපොරොත්තු වුණු ඉතිරි වැඩ කොටස කරන්න අපි දායක වෙනවාය කියලා ප්‍රතිඥා දෙමින්, එතුමාගේ පවුලේ උදවියට අපේ ශෝකය පළ කරනවා. එතුමාත් සමඟ ගත කළ ජීවිතය අපට ඉතා අනුස්මරණීයයි. එතුමා ඒ කළ සියලු පිනුත් එකතු වෙලා එතුමාට අමා මහා නිවන් සුව අත්වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තිලකරත්න රාජපක්ෂ හිටපු ගරු මන්ත්‍රීතුමා සම්බන්ධව එතුමාට ගෞරවය පුද කිරීම සඳහා මම මෙය අවස්ථාව කර ගන්නවා. එතුමාව මම හඳුනා ගන්නේ, 1999 දී මම මේ පළාත් සභාව නියෝජනය කරන්න ගත්තාට පස්සේ. එදා සිට මම ඔහුගේ ජීවිතයේ ගුණාංග ටිකක් දැක්කා. විශේෂයෙන්ම මේ අනෙකුත් ගරු මන්ත්‍රීතුමන්ලා පෙන්වා දුන්නා වාගේම පන්ති පදනමෙන් ගත්තොත් එහෙම එතුමා අපේ පන්තියේ මනුස්සයෙක්. සාමාන්‍ය මිනිහෙක්. ඒ සාමාන්‍ය මිනිහෙක් මහජන නියෝජිතයකු වුණාට පස්සේ, ඒ මහජන නියෝජිත කාර්යභාරය පවත්වාගෙන ගිහිල්ලා, ඊළඟ ඡන්දයටත් ඒ ආයතනය නියෝජනය කිරීම සඳහා එතුමාට වෙනත් මාර්ගයක් තිබුණේ නැහැ. එතුමාට තිබුණේ, මිනිස්සු හම්බු කර ගන්න. ඒ නිසා තමයි එතුමා තමන්ගේ සේවය ඊළඟ මැතිවරණයට ආයෝජනයක් බවට පත් කර ගත්තේ. අන්න ඒ සේවය ඉටු කරපු මන්ත්‍රීවරයකු හැටියට මම එතුමාව හඳුන්වනවා. මොකද, එතුමාව මට බොහෝ වෙලාවට හමු වෙලා තිබෙන්නේ, රාත්‍රී කාලයේදී. අපිත් පෙළඹිලා තිබෙනවා, මළ ගෙයක් තිබෙනවා නම් අපේ කටයුතු ඉවර වෙලා, වැඩ ඉවර වෙලා තමයි යන්නේ. ඒ නිසා බොහෝ වෙලාවට මට එතුමාව මුණ ගැසිලා තිබෙන්නේ පාන්දර එකට, දෙකට තමයි. විශේෂයෙන්ම කහතුඩුව පැත්තේ, පොල්ගස්ඕවිට පැත්තේ, හෝමාගම පැත්තේ මළ ගෙවල්වලදී. ඒ මළ ගෙවල්වල එතුමා කථා බහ කරමින් ඉන්නවා. ඔන්න ඔය වෙලාවේදී තමයි අපි ඔය සාමාන්‍ය ජීවිත සම්බන්ධව, සමහර මාතෘකා සම්බන්ධව කථා කරන්නේ. මාත් එක්ක ගොඩක් වෙලාවට මුණගැහිලා තිබෙන්නේ ඔන්න ඔය වෙලාවේදී. ඉතින් ඒ වෙලාවේදී එක දවසක් මට මතකයි. විශේෂයෙන්ම එතුමා නැති වුණාට පස්සේ මට මේක මතක් වුණා. මොකද, එතුමාගේ සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධයෙන් මම එතුමාගෙන් ප්‍රශ්න කළා.

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

මොකද, එතුමා ශරීර සෞඛ්‍ය ගැන හිතපු කෙනෙක් නොවෙයි. ඒ වෙලාවේ එතුමා පිළිගත්ත අවස්ථා තිබෙනවා. ඒක තමයි ගරු මන්ත්‍රීතුමා. මටත් මේක නතර කර ගන්න බැරිව ඉන්නේ. විශේෂයෙන්ම එතුමා කරපු දුම්පානය සම්බන්ධව. ඒ නිසා ශරීර සෞඛ්‍ය සම්බන්ධව එතුමා ලොකුවට හිතපු නැති එක තමයි එතුමාගේ තිබුණු එක දුර්වලතාවයක් වන්නේ. තමන්ගේ ශරීරය ගැන හිතුවේ නැහැ. මම විශේෂයෙන්ම මේක කියන්නේ, සමහර අය ඉන්නවා තමන්ගේ ශරීරය නඩත්තු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට හමු වෙලා තිබෙනවා. සමහර මන්ත්‍රීවරු ඉන්නවා මේ රක්ෂණය කාලයේ රක්ෂණය ඉවර වෙන්න ඉස්සෙල්ලා ගිහිල්ලා, සති දෙකක් හෝ නතර වෙලා තමන්ගේ ශරීර සෞඛ්‍ය පරීක්ෂා කර ගන්නවා. ඒවා නඩත්තු කරනවා. බොහෝ වෙලාවට අපට එහෙම මතක් වෙන්නේ නැහැ. මේ වාරිකයේ කාලය ඉවර වෙන්න පෙර හොස්පිට්ල් එකට ගිහිල්ලා ඒක කර ගන්නවා. නමුත් එතුමා එහෙම කටයුතු කරපු කෙනෙක් නොවෙයි. ඒක එතුමාගේ තිබුණු එක දුර්වලතාවයක් හැටියට මම දකින්නේ. මම හිතන්නේ, එතුමා නැති වෙන තත්ත්වයකටත් ඒකයි හේතුව. එතුමා ඒ තිබුණු සමහර රෝගී තත්ත්වයන් සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කළේ නැහැ. මට එතුමාගේ අවසාන මොහොතට සම්බන්ධ වෙන්න බැරි වුණා. මොකද, මමත් ඒ වෙලාවේ අසනීප තත්ත්වයක හිටියේ. මට මතක හැටියට මම ආරෝග්‍ය ශාලාවේ හිටියේ. මට ආරංචි වුණා එතුමා නැති වුණාය කියලා. එතුමා අන්න එහෙම කෙනෙක්.

ඒ වාගේම එතුමා දැන් අපිත් සමඟ, අපේ දේශපාලනයත් එක්ක බැලුවොත් එහෙම - අපිත් එක්ක දේශපාලන ගැටුමක් තිබුණා. තර්ක කරනවා. ලොකු විධියට ගැටීම් ඇති වෙලා නැහැ. බොහොම අඩු තත්ත්වයන්වල තමයි අපිත් එක්ක ගැටිලා තිබෙන්නේ. ඒ ගැටුණු කිසිම අවස්ථාවක එතුමා අපිත් එක්ක ගැටිලා තිබෙන්නේ දේශපාලනිකව. අදේශපාලනිකව ගැටිලා නැහැ. මොකද, මම දන්නවා. විශේෂයෙන්ම එතුමාට ගෞරවයක් හැටියට ඒක කියන්න ඕනෑ. සමහර අය ඉන්නවා. අපේ දේශපාලනයත් එක්ක අදේශපාලනිකව - මම මේක අවස්ථාවක් කර ගන්නෙ නැහැ අනික් පැත්තට දෙයක් කියන්න. නමුත් මට අපේ මන්ත්‍රීවරයෙක් කිව්වා. මේ පළාත් සභාවේම මන්ත්‍රීවරයෙක් හිටියා. එතුමා ඇමතිවරයෙක් වෙලා ඉඳලා දැන් පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ. අපිත් එක්ක එතුමාගේ තිබුණේ අදේශපාලනික ගැටුමක්. මොකද, එතුමා සමහර වෙලාවට කැන්ටින් එකට ගිහිල්ලා අපේ කට්ටිය කැන්ටින් එකේ කෑම කන කොට කියනවාලු. යකෝ මුන් ජේවීපී කාරයෝ. දැක්කා නේද මුන් කන හැටි, මස් මාලු දා ගෙන කියලා. එහෙම අදේශපාලනිකව හිතන අයත් ඉන්නවා. එහෙම කෙළින් කියලා තිබෙනවා. මට මතකයි. මම මෙවර පළාත් සභාව නියෝජනය කරන්න ආවාට පස්සේත් - මම එතුමා ගැන එපමණ දැන ගෙන හිටියේ නැහැ. සමහර දේවල්වලදී පුංචි කාරණයකදී මාත් එක්ක ලොකුවට මෙතැන හැප්පුණා. ඊට පස්සේ මම හිතුවා, ඇයි එහෙම එතුමා කරන්නේ කියලා. මේ අනික් අයට වාගේ නැතිව, ඒ විධියට වුණේ මොකද කියලා මම සොයලා බැලුවා. බැලුවාම එතුමාට අපිත් එක්ක තිබෙන්නේ වෙන ප්‍රශ්නයක්. වෙන ගැටළුවක්. දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි. ඒ නිසා තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා කියලා කියන්නේ, එහෙම කෙනෙක් නොවෙයි. ඒ ජාතියේ කෙනෙක් නොවෙයි. එතුමාට අපිත් එක්ක ගැටුමක් තිබුණා නම් තිබුණේ, ඒක දේශපාලන ගැටුමක්. ඉතින් එහෙම තිබෙන්නත් ඕනෑ. ඒක නැති වුණොත් තමයි ප්‍රශ්නය. මොකද, එතුමා මොන පක්ෂයේ හිටියත් එතුමා මතවාදයක් නියෝජනය කරනවා. අපිත් මතවාදයක් නියෝජනය කරනවා. ඒ නිසා එතුමාට මතවාදීමය ප්‍රශ්නයක් තිබුණා මිසක්, වෙනත් ප්‍රශ්නයක් තිබුණේ නැහැ. අර කිව්වා වාගේම එතුමා සෑහෙන්න හෝමාගම ආසනයට, ඒ සාමාන්‍ය මිනිස්සුන්ගේ ජීවිතය සම්බන්ධව කටයුතු කරපු කෙනෙක්. අවශ්‍ය දේ සම්බන්ධව සොයා බලලා, ඒ ප්‍රදේශයේ ඉන්න අපේ අයත් සමඟ කවුරුත් එක්ක බොහොම ළඟින් කටයුතු කරපු කෙනෙක්. ඒ නිසා හොඳ ජීවිතයක් ගත කරපු කෙනෙක්. ඇත්තටම එතුමා ජීවත්ව හිටියා නම් මන්ත්‍රීකම තිබුණත් නැතත්, ඒ ප්‍රදේශයට විශාල සේවයක් කරන්න හිටපු කෙනෙක් තමයි ඒ ප්‍රදේශයේ ජනතාවට අහිමි වුණේ. ඒ සම්බන්ධව සංවේගය ප්‍රකාශ කරමින්, විශේෂයෙන්ම එතුමාගේ පවුලේ ඥාතීන්ටත්, විශේෂයෙන්ම අපගේ ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් අපගේ සාතිශය සංවේගය ප්‍රකාශ කරමින් එතුමාට ගෞරවනීය ආචාරය අපි පුද කරනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ තිලකරත්න රාජපක්ෂ, අපේ හිටපු ගරු මන්ත්‍රීතුමාව මම දකින්නේ, මනාපවලට එරෙහිව උඩුගං බලා පීනපු අපේ

කාලයේ මේ සභාව නියෝජනය කළ මන්ත්‍රීවරයෙක් කියලා. එතුමා සමහ කථා කරපු හැම මොහොතකම එතුමා කථා කරපු දෙයක් තමයි මේ මනාප ක්‍රමය පිළිබඳව. එතුමාට මනාප ක්‍රමය පිළිබඳව දැඩි විවේචනයක් තිබුණා. විශේෂයෙන්ම මම දන්නා විධියට එතුමා පළාත් සභා මන්ත්‍රීවරයෙක් වෙන්න ලොකු ප්‍රචාරණ කටයුතු කර ගත්තේ නැහැ. එතුමා විශ්වාස කළා, තමන්ගේ ඡන්ද පදනම තමන්ගේ කලාපය තුළින් තමන්ට මන්ත්‍රීවරයෙක් වෙන්න පුළුවන් කියලා. අපි කවදාවත් දැක්කේ නැහැ කොළඹ දිස්ත්‍රික් ඡන්දයකදී තිලකරත්න රාජපක්ෂ මහත්මයාගේ පෝස්ටර් එකක් කොළඹ තිබෙනවා. මොරටුව, රත්මලාන, දෙහිවල තිබෙනවා. එතුමා හැම තිස්සේම හෝමාගම ප්‍රධාන කර ගත් කැස්බෑව, මහරගම, අවිස්සාවේල්ල ප්‍රදේශවලින් පමණයි එතුමාගේ මනාප ප්‍රතිශතය එතුමා වර්ධනය කර ගත්තේ. ඒ වාගේම එතුමා මටත් වඩා මගේ පියාගේ මිත්‍රයෙක්. එතුමාටත් මටත් එකට මේ පළාත් සභාවේ ඉන්න ලැබුණා. එතුමාගේ චරිතය තුළ තිබුණු සුවිශාල අවංකකම දේශපාලන ක්‍රමයකට ඔබිනවාද කියන කාරණය තිබුණා. එතුමා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම අවංක දේශපාලඥයෙක්. ඔහුගේ ජීවිතයේ අද දේශපාලඥයන්ට දිගු කරන ඇඟිලි එකක්වත් එතුමාට දිගු කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. එතරම්ම එතුමා විනිවිදභාවයෙන් යුක්ත වූ දේශපාලඥයෙක්. එතුමාගේ ජීවිත කාලයම ගෙවෙන්නේ සාමාන්‍ය පන්තියේ මිනිස්සුත් එක්ක.

එතුමාගේ ජීවිතයේ තිබුණු එකම දුර්වලතාවය තමයි අපිත් එක්ක කථා කරන හැම මොහොතකදීම එතුමාගේ ඇඟිලි තුඩු දෙක ඇතුලේ දුම්වැටියක් තිබීම. ඒ හැර එතුමාට කාටවත් ඇඟිල්ලක් දිගු කරන්න බැහැ. එතුමාට තිබුණු ප්‍රශ්නය, එතුමා එතුමාගේ ජීවිතයට ආදරය කළාද කියන එකයි. ජනතාවට ආදරය කරපු දේශපාලඥයෙක්. එතුමා, එතුමාගේ ජීවිතයට ආදරය කළාද කියන කාරණය තිබෙනවා. එතුමා තමන්ගේ සෞඛ්‍ය ගැන තවදුරටත් හිතුවා නම්, මම විශ්වාස කරනවා, එතුමා තව බොහෝ කාලයක් ඉන්නවා. නමුත් මේ පවතින සමාජ ක්‍රමය තුළ එතුමාට කළ හැකි සියල්ල මම විශේෂයෙන් හිතනවා, හෝමාගම ජනතාවට එතුමා කළා. යාබද ආසනයක් විධියට අපිත් එක්ක දේශපාලනය - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා. උදේට ගහන පෝස්ටර් එක රෑට ගැහුවොත් රෑ දොළහට වහලා. දොළහට ගැහුවොත් පාන්දර පහට වහලා. හයට ගැහුවොත් හතට වහලා. එහෙම පෝස්ටර් කරන මේ ක්‍රමය තුළ මම හිතන්නේ, එතුමා එහෙම චරිතයක් වුණේ නැහැ. අහළ පහළ කිසිම දේශපාලඥයෙක් එක්ක, දේශපාලන පක්ෂයක් එක්ක ගැටුමක් ඇති කර නොගත් වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මහත්මා දේශපාලඥයෙක්. එතුමන්ලා වැනි දේශපාලඥයෝ මේ සමාජයට කොතරම් අවශ්‍ය ද කියනවා නම් - නමුත් පසුගිය මැතිවරණ ප්‍රතිඵලයේදී පෙනුනා කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව සන්ධානයෙන් පත් කරලා එවූ මන්ත්‍රීවරුන්ගේ ලැයිස්තුව දැක්කාම තිලකරත්න රාජපක්ෂ මැතිතුමා සිටිය යුතු ස්ථානයේද එතුමාව කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව තැබුවේ කියලා. එතුමා අද මේ අපි සියලු දෙනාගෙන් සමුගෙන ගියත් එතුමා ඉතිරි කර ගිය මතකය පළාත් සභාවක් තුළ, ගමක, ප්‍රදේශයක මම හිතන්නේ ඉතා විශාල වශයෙන් මිනිස්සුන්ට මතක තියෙයි. නමුත් මතකය කියන කාරණය අපේ සිත් තුළ තිබෙන්නේ, ඉතා කෙටි කාලයයි. තව ටික කාලයක් ගියාම සමහර විට අහයි තිලකරත්න රාජපක්ෂ කියලා දේශපාලඥයෙක් හිටියාද කියලා. මොකද, ඔහු පුංචි තිරයේ හිටියේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔහු කවදාවත් පුංචි තිරයේ වීරයෙක් වුණේ නැහැ. ඔහු වීරයෙක් වුණේ ගමේ මිනිස්සුන්ට. ගමේ දුප්පත් අයට. හැබැයි, රූපවාහිනී තිරවල පැය 24 ම රඟපාන දේශපාලඥයින්ට වඩා මම හිතනවා, තමන්ගේ ගමේ මිනිස්සුත් එක්ක එතුමා ගත කළ සුන්දර දේශපාලන මතකය, ඒ ගම්වල මිනිස්සුන්ට සදාකාලිකව මතක තියෙයි.

ඒ නිසා මේ මොහොතේදී විශේෂයෙන්ම එතුමාව ආශ්‍රය කරපු දේශපාලඥයෙක් විධියටත්, ඒ වාගේම අල්ලපු ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා විධියටත් මේ මොහොතේදී මගේ යුතුකමක් තිබෙනවා. දේශපාලන පක්ෂවලට බෙදිලා අපි දේශපාලනය කළත්, අපේ කැස්බෑව ආසනයේ එක්සත් ජාතික පක්ෂයේත්, සිවිල් සංවිධානවලත් ශෝකය එතුමාගේ අභාවය වෙනුවෙන් ඒ පවුලේ සියලු දෙනා වෙත ප්‍රකාශ කරනවා. මිනිසුන්ට අසීමිතව ආදරය කළ, ඒ වාගේම මිනිස්සුන් විසින් නැවතත් ගෞරවයෙන් ආදරය කළ ඒ කෘතහස්ත, ඒ වාගේම මේ පළාත් සභාව තුළ වසර ගණනාවක් නියෝජනය කළ සුවිශාල අත්දැකීම් තිබුණු ඒ දේශපාලඥයා තිලකරත්න රාජපක්ෂ මැතිතුමාට අමාමහ නිවන් සුව අත්වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාගේ ශෝක යෝජනාවෙන් පසුව අපේ හිටපු තවත් ගරු මන්ත්‍රීවරයකු වන අජිත් අමරසිරි ගරු මන්ත්‍රීතුමාගේ ශෝක යෝජනාවත් තිබෙනවා. ඒ නිසා අවසන් කථාව හැටියට මම විශ්වාස කරනවා, විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල මැතිතුමාගේ කථාව තිලකරත්න රාජපක්ෂ මැතිතුමා වෙනුවෙන් කරයි කියලා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා කියන්නේ අපේ ඉතාම හොඳ කල්‍යාණ මිත්‍රයෙක්. මම දන්නවා, තිලකරත්න රාජපක්ෂ මැතිතුමා තමන්ගේ දේශපාලන ගමන ආරම්භ කළේ, එක්සත් ජාතික පක්ෂයෙන්. එක්සත් ජාතික පක්ෂයේ රිලාවල ගම්මානයේ තරුණ සංවිධානයේ ලේකම්වරයා හැටියට තමයි ගාමිණී ජයසූරිය මැතිතුමාගේ සමකාලීනයෙක් විධියට ඒ කාල පරිච්ඡේදය තුළ එතුමා දේශපාලන කටයුතුවල නියැලුනේ. ඉන් අනතුරව අපෙන් වෙන් වෙන්න, වෙනස් වෙන්න එතුමාට හේතුපාදක වුණේ වෙන මොකක්වත් නොවෙයි. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ඉන්දියානු සාම සාධක හමුදාව ලංකාවට ගෙනාවාට පස්සේ, මේ රටේ විශාල මතවාදයක් ඇති වුණා. පිටරට හමුදාවක් ගෙනැල්ලා, ඉන්දියානු හමුදාවක් ගෙනැල්ලා මේ රටේ ප්‍රශ්නය විසඳනවාට වැඩිය වෙනත් ජාත්‍යන්තර බලපෑම් මේ රටට ඇති වෙයි. ඒ නිසා මේ වෙනුවෙන් ජාතික බලවේග ඉන්දියානු සාම සාධක හමුදාවට විරුද්ධව ක්‍රියාත්මක වුණා. ඒ එක්තරා අවස්ථාවක එතුමාත් ඒ ක්‍රියාවේ යෙදුණා විතරක් නොවෙයි. මම පුද්ගලිකව ඇවිල්ලා හමු වුණා රාජපක්ෂ මන්ත්‍රීතුමාව. මට කිව්වා. නැහැ, මේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා කරන වැඩේට සිංහලයෙක් හැටියට මට එකඟ වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මම මේකට විරුද්ධත්වය ප්‍රකාශ කරලා එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් වෙනවා. ඒ විතරක් නොවෙයි. මම දන්න විධියට එතුමා ඒ ප්‍රදේශය තුළ තමන්ගේ මතය, කලු කොඩි පවා දාලා තමයි විරුද්ධත්වය ප්‍රකාශ කළේ. ඊත් එක්කම තිබුණු ප්‍රාදේශීය සභා මැතිවරණයට එතුමා ඉදිරිපත් වුණා. මම හිතන්නේ, පළමුවැනි වතාවට ක්‍රියාකාරී දේශපාලනයේ එතුමා ඡන්දයක් ඉල්ලපු වෙලාවේ හෝමාගම ජනතාව එතුමාව දෙවන ස්ථානයට පත් කළා. ඒ ලැයිස්තුවේ කොපමණ ජ්‍යෙෂ්ඨයෝ හිටියත්, ඒ ජ්‍යෙෂ්ඨයෝ අභිබවා එතුමාගේ මතවාදය, එතුමාගේ හඬ හෝමාගම මැතිවරණ කොට්ඨාශය තුළ ඒකෙන් ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තා. එතැනින් තමයි අපි දන්නා හැටියට තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා ක්‍රියාකාරී දේශපාලනයට පත් වුණා. නමුත් අපි දන්නවා. ප්‍රාදේශීය සභාව ජයග්‍රහණය කළා. දෙවැනියා වුණාට එතුමාට උප සභාපතිකම නම් ලැබුණේ නැහැ. ඉන් අනතුරුව එතුමා පළාත් සභාවට තරග කරලා පළාත් සභාවේ මන්ත්‍රීවරයකු හැටියට පත් වුණා. මට එතුමාව ඉතාම කිට්ටුවෙන් ආශ්‍රය කරන්න පුළුවන්කම ලැබුණා. අනික් එක මම දන්නවා. තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා සමහර වෙලාවට සමහර මිනිස්සු අමනාප කර ගත්තා. ඒ හේතුව, ඇත්ත ඕනෑම මිනිහෙකුගේ මුහුණට කියන්න භයක් නැති, කශේරුකාවක් එතුමාට තිබුණා.

අර හැමෝම කිව්වා වාගේ එතුමා අවංක දේශපාලඥයෙක්. හොරකම පෙන්වන්න කැමැතිම නැහැ. හොර වැඩ කරනවාට කැමැතිම නැහැ. ඒ නිසාම එතුමා සමහර මිනිස්සු කරන, තමන්ගේ පක්ෂයේ වුණත් කරන හොර වැඩ දිහා කෙළින්ම ඇඟිල්ල දික් කරලා එතුමා කියන්න පටන් ගත්තා මේක කරන්න එපාය කියලා. මේ රටේ බහුතරයක් මිනිස්සු දේශපාලනය තුළ හා දේශපාලනයට උදව් උපකාර කරන මිනිස්සු බලාපොරොත්තු වෙන්නේ මේකට ඇවිල්ලා කීයක් හරි හරිහම්බු කර ගන්න. ඒ නිසා ඒකට විරුද්ධව මතවාදය ගෙනියන, ඒකට විරුද්ධව කථා කරන දේශපාලඥයකු වුණා නම් මිනිස්සු කියන්නේත් වැඩක් නැහැ ඔය යකා එක්ක ඉඳලා. ඌ හම්බ කර ගන්නේත් නැහැ. අපට හම්බු කර ගන්න දෙන්නේත් නැහැයි කියලා. ඒ නිසා ඉතාම ඉක්මණින් ඒක මිනිස්සු දේශපාලඥයකුව අතඅරින හේතුවක් බවට පත් වෙනවා. නමුත් තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා ඒවා එකකින් වත් සැලුනේ නැහැ. ප්‍රසිද්ධ වේදිකාවේ පවා තමන්ට කියන්න ඕනෑ දේ කොන්ද කෙළින් තියාගෙන කොයි නායකයා හිටියත්, එතුමා කියන්න තරම් ශක්තිමත් පුද්ගලයෙක් බවට පත් වුණා. අපි පෞද්ගලිකව දන්නවා. එතුමා පළාත් සභාවේ ඉන්න කාලයේ තමන්ගේ ආසනයේ හිටපු කැබිනට් ඇමතිවරයාටත් කෙළින් කථා කරපු මන්ත්‍රීවරයෙක් බවට පත් වුණා. කැබිනට් ඇමති කෙනෙක් කියලා එතුමා සැලුනේ නැහැ. එතුමා භය වුණේ නැහැ. සමහර වැරදි දේ වැරදි විධියට දකින්න එතුමාට පුළුවන්කමක් ලැබුණා. ඒ නිසා එතුමාගේ තිබුණු වචන දිහා බැලුවාමත් බොහොම ග්‍රාමීය මට්ටමේ, මටසිලිටු, හැම

මිනිස්සු අතරේම කථා බහට යෙදෙන ගමේ කථා කියලා කිව්වොත් ඒක නිවැරදියි. එතුමා වෙලාවකට ගැමියෙක් වාගේ තමයි. දැන් මම මට මතකයි, ඒක අපේ මූලාසනයේ ඉන්න ගරු මන්ත්‍රීතුමාත් මතක් කළා. එතුමායි මමයි අපි එකට ගියා, වියට්නාමයේ සංචාරයක. මම හිටියේ එතුමාගේ අල්ලපු කාමරයේ. මට කිව්වා, මට මාර වැඩක් වෙලා තිබෙනවා. අඳින්න සරමක් ගෙනැල්ලා නැහැයි කියලා. පසුව මම කිව්වා, භය වෙන්න එපා මම සරමක් දෙන්නම් කියලා. පසුව මට ඒක සෝදලා නැවත ගෙනැත් දුන්නා. දවසක් විතර යන කොට කිව්වා, මට නම් මේවා කන්න පුළුවන්කමක් නැහැ. දවල්ට මගේ කාමරයට එන්න කියලා කිව්වා. මම ගියා. මම යන කොටත් විස්සක් විතර හිටියා ඒ කාමරයේ. ටික වෙලාවක් යන කොට බෑග් එකේ තිබිලා බොම්බයි ළූණු ගෙඩි දහයක් පහළොවක් ගත්තා. සැමන් ටින් එකක් ගත්තා. ඒ විතරක් නොවෙයි ඊට පසුව මිරිස් කරල් හතරක් පහක් ගත්තා. හෝටලයේ තිබුණු පිඟානක් අරගෙන සැමන් එක හදා ගෙන කට්ටිය එක්ක පාන් ගෙනැල්ලා කෑවා. මට නම් අල්ලන්නේ නැහැ මේ තිබෙන ඒවා. මම කෝකටත් ලැහැස්ති වෙලා ආවේ කියලා කිව්වා. බැලුවාම ඒ බෑග් එක ඇතුළේ පිහියකුත් තිබෙනවා. එහෙම තමයි මම දැක්ක තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාගේ චරිතය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාත් කිව්වා වාගේම තනිවම කෑවේ නැහැ. අන්තිමට වැඩියෙන්ම ඒ කාමරයේ තමයි කට්ටිය කාලා තිබෙන්නේ. කාලා පැය දෙකක් විතර යන කොට ඒ කාමරය අස් කරන්න ලේසි පහසු මිනිසෙකුට පුළුවන්කමක් ඇත්තේ නැහැ. කනවායි අනික් දේ කරනවායි දෙකම කට්ටිය ඒක ඇතුළේ තමයි රෙස්ටුරන්ට් එක වාගේ පාවිච්චි කරලා තිබෙන්නේ. ඒකෙන් අපි දැක්කේ වෙන මොකුත් නොවෙයි. තමන් ගෙනැල්ලා තමන් හදාගෙන දෙතුන් දෙනෙක් එක්ක කන සිරිතක් තිබුණේ නැහැ. ගෙදරින් හදා ගෙන එන හැමදේම සියලු දෙනාම බෙදා හදා ගෙන කන බොන චාරිත්‍රයක් තිබුණා. ඉතින් ඒ නිසා මම දැක්ක එකම දේ තමයි, මම දැක්කාම කියනවා, ඔය සිගරට් බීම අඩු කරන්නය කියලා. ඒකට පිටිපස්සෙන් කැප් එකක් ගහ ගන්නවා. දැන් මට ප්‍රශ්නයක් නැහැ. මේක එන්නේ නැහැ. මට ගැටළුවක් නැහැයි කියනවා. ඒක තමයි තමන්ට සතුටු වෙන්න තිබෙන එකම දේ. ඉතින් අපි දන්නවා. තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා අවංකවම - බොහෝ දෙනෙක් කිව්වා වාගේ, පාසල්වල තිබෙන ආපන ශාලාවල ප්‍රමිතිය පමණක් නොවෙයි, ඒ ආපන ශාලාවලින් විශාල මුදලක් අද පළාත් සභාව ලබනවා නම් ඒ ගෞරවය සම්පූර්ණයෙන්ම තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාට හිමි විය යුතුයි කියලා පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට මම මතක් කරන්න කැමැතියි. මම මීට වඩා දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මගේ මැතිවරණ කොට්ඨාශයේ දීර්ඝ කාලයක් තිස්සේ තිබුණු අපේ මිත්‍රත්වය මත. ඉතාම හොඳ මනුස්සයෙක්, ඉතාම හොඳ මන්ත්‍රීවරයෙක්, අපේ සමාජයෙන් අපට නැති වුණා. ජීවිතයේ ස්වභාවය මේකයි. අපි දන්නවා. අනික් පැත්තෙන් අපේ උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා මෙතැන නැහැ. එතුමා කිව්වා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රගතිශීලී කණ්ඩායමේ ශෝකය පළ කරනවාය කියලා. මම හිතන්නේ ඒ කාලයේ හරියට ප්‍රගතිශීලීන් හිටියා නම්, රාජපක්ෂ මන්ත්‍රීතුමා තමයි එතුමාගේ ඇමතිකමේ අයිතිකාරයා බවට පත් වෙන්නේ. ඒ නිසා ඔය කිව්වාට ඒ කාලේ ප්‍රගතිශීලීව ඉඳලා නැහැ. එහෙම නැත්නම් රාජපක්ෂ මැතිතුමා තමයි ඒ අවදිය වන විට ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක් හැටියට මේ පළාත් සභාවේ හිටියේ කියන එක මතක් කරමින්, අප අතරින් සදහටම අවසන් ගමන් ගිය අපේ තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාට නිවන් සැප ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ගාමිණී තිලකසිරි**(කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Animal Production and Health and Agrarian Development.)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන මොහොතේ හරි මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට මගේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටිනවා. 1996 මම හෝමාගම මැතිවරණ කොට්ඨාශයේ සංවිධායකවරයා වශයෙන් පත් වෙලා ගිය වෙලාවේ හෝමාගම මැතිවරණ කොට්ඨාශයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ හිටපු ප්‍රබල ආධාරකරුවෙකු තමයි තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා. එතුමාගේ දේශපාලන ජීවිතය විශේෂයෙන්ම මට දැන ගන්නට ලැබුණේ, මම හෝමාගම ආසනයේ සංවිධායකවරයා වශයෙන් පත් වෙලා ගියාට පස්සේ. 1991 පැවති ප්‍රාදේශීය සභා මැතිවරණය වෙලාවේ, ලංකාවේ ප්‍රථමවරට පැවැත්වූ මැතිවරණය වෙලාවේ එතුමා හෝමාගම ආසනයේ ප්‍රාදේශීය සභාවට තරඟ කළා. තරඟ

[ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා]

කරලා එම කණ්ඩායමේ දෙවැනි තැනට ආවා. හැබැයි, එතුමාට එදා උප සභාපති තනතුරවත් ලැබුණේ නැහැ. එදා එතුමා මන්ත්‍රීවරයෙක් හැටියට හෝමාගම ප්‍රාදේශීය සභාව නියෝජනය කළා. මම එදා කැස්බෑව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට කටයුතු කළා. 1993 පැවති පළාත් සභා මැතිවරණයෙන් එතුමා පළාත් සභාවට තේරී පත් වුණා. එතකොට එතුමාත් මමත් 1993 බස්නාහිර පළාත් සභාවට තේරී පත් වුණු දෙදෙනෙක්. ආසන දෙකකින්. තිලකරත්න රාජපක්ෂ හිටපු මන්ත්‍රීතුමා 1993 බස්නාහිර පළාත් සභාවට තේරී පත් වෙලා පසුගියදා පැවැත්වුණු පළාත් සභා මැතිවරණය තෙක්ම හැමදාම මේ මැතිවරණ කොට්ඨාශය නියෝජනය කරනවා.

තිලකරත්න රාජපක්ෂ මන්ත්‍රීතුමා කියන්නේ පුදුමාකාර හදවතක් ඇති පුද්ගලයෙක්. එතුමා බොහොම සාමාන්‍ය ජනතාවට සමීපව දේශපාලනය කරපු කෙනෙක්. ඒ ප්‍රදේශයේ අවමංගල්‍ය උත්සවයක් තිබුණොත්, රෑට කාලා බීලා මළ ගෙදරට ගියාම පහුවෙනිදා උදේ තමයි ගෙදර එන්නේ. එතුමා ජනතාවත් සමඟ බොහොම සමීපව කටයුතු කරපු නිසා හෝමාගම මැතිවරණ කොට්ඨාශය තුළ එතුමාට ආදරය කරපු බොහෝ ජනතාව හිටියා. පක්ෂ පාට භේදයකින් තොරව. පළාත් සභාව නියෝජනය කරන කාල සීමාව තුළදී එතුමාගේ ප්‍රතිපාදනවලින් විශාල වැඩ කොටසක් හෝමාගම මැතිවරණ කොට්ඨාශයේ සිද්ධ වුණා. මම හිතන්නේ, 75% ක්ම එතුමාට ලැබෙන ප්‍රතිපාදන වෙන් කළේ හෝමාගම මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන්. අපි දීර්ඝ කාලයක්, මම 1990 ඉඳලා එතුමාගේ මේ අවසාන පළාත් සභා මැතිවරණයත් එක්ක අපි බොහොම ළඟින් සිටියා. අවසාන පළාත් සභා මැතිවරණයේදීත් එතුමාත් මමත් දේශපාලන කටයුතු එක හා සමානව කරගෙන ගියත් අවසාන මොහොතේ සමහර නායකත්වය තුළින් කරපු ක්‍රියාකාරකම් නිසා එතුමාට පසුගිය පළාත් සභා මැතිවරණයෙන් පරාජයට පත් වෙන්න සිද්ධ වුණා. අපි හීනකින්වත් හිතපු දෙයක් නොවෙයි. මේ තරම් මහජනතාවට ඉතාමත්ම සමීප වුණු පුද්ගලයෙක්, දේශපාලන වශයෙන් හරි හම්බ කර ගත්තේ නැති පුද්ගලයෙක් එතුමාට තිබුණු දේපළ මම හිතන්නේ වැඩි ප්‍රමාණයක් දේශපාලනය නිසා විකුණපු පුද්ගලයෙක්. ජනතාව වෙනුවෙන් එතුමාගේ අතින් විය යුතු යුතුකම් හැමදේම ඉෂ්ට කළා. දේශපාලන වශයෙන් හම්බ කර ගන්නේ නැතිව තමන්ගේ දේපළ විකුණලා තමයි දේශපාලන කටයුතු කළේ. අපි දන්නවා, අපේ මැතිවරණ කොට්ඨාශයේ යමෙකුට හදිස්සියක්, කරදයක් වුණා නම්, මිල මුදල්වලින් පවා ඒ අවශ්‍යතාවයන් ඉෂ්ට කරපු කෙනෙක් තමයි, උපකාර කරපු කෙනෙක් තමයි තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා. එතුමා විවාහකයෙක් නොවුණත්, අවිවාහකයෙක් හැටියට එතුමා දේශපාලන වශයෙන් පූර්ණ කාලීනව කැපවීම් කරලා, එතුමා පොඩි ව්‍යාපාරික කටයුත්තකුත් කරගෙන ගියා. එතුමා ජීවත් වුණු නිවහන කාටත් පොදු ස්ථානයක් බවට පත් වුණා. ඕනෑම කෙනෙකුට වේලාවක් නොබලා, උදේද පාන්දරද දවල්ද නොබලා එතුමාගේ නිවහනට ගිහිල්ලා, එතුමා හම්බ වෙන්න පුළුවන්කම ලැබුණා. ඉතාමත්ම නිහතමානී හොඳ ගති පැවතුම් ඇති පුද්ගලයෙක් හැටියට තමන්ගේ ජීවිතය ගැන සලකන්නේ නැතිව, අනුන් වෙනුවෙන් තමන්ට කළ හැකි සියලුම යුතුකම් ඉෂ්ට කරපු කෙනෙක්. අපි දේශපාලන වශයෙන්, එක්සත් ජාතික පක්ෂයේ හිටියත් මංජු ශ්‍රී අරංගල මැතිතුමන්ලා අපි සියලුම දෙනාම පක්ෂ පාට කොහේ තැනක සිටියත් එතුමා දේශපාලනය කරපු කාල සීමාව තුළ, මේ මැතිවරණ කොට්ඨාශය තුළ කිසිම කෙනෙක් සමඟ අමනාපකමක් නැතිව එතුමාගේ දේශපාලන කටයුතු කරගෙන ගියා. මේ අවස්ථාව හැටියට මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. එතුමා මිය ගිය වේලාවේ බස්නාහිර පළාත් සභාවේ ඉන්න සියලුම ගරු මන්ත්‍රීවරු එතුමාගේ අවසන් කටයුතු කරන මොහොතේ ඒ අවශ්‍ය කරන සහයෝගය දැක්වීමට කටයුතු කළා. එතුමාගේ අවමංගල උත්සවයේදී. ඒ නිසා අපි නොහිතපු වේලාවක හෘදයාබාධයකින් එතුමා අවසන් ගමන් ගියා. නමුත් එතුමා තමන්ගේ ජීවිත කාලය තුළ, තමන් ගැන හිතන්නේ නැතිව අනුන් වෙනුවෙන් වැඩ කටයුතු කරපු මන්ත්‍රීවරයෙක් කියන එක මම සඳහන් කරන්න ඕනෑ. ඒ නිසා දීර්ඝ කාලයක් හෝමාගම මැතිවරණ කොට්ඨාශයේ පමණක් නොවෙයි. කොළඹ දිස්ත්‍රික්කයට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජයග්‍රහණය කරන්න විශාල වශයෙන් කැපවීම් කරපු තිලකරත්න රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා, එතුමා බස්නාහිර පළාත් සභාව තුළ අමතක කරන්න පුළුවන් මන්ත්‍රීවරයෙක් නොවෙයි. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. එතුමාට තනතුරු නොලැබුණාට තනතුරු ලබා දෙන්න වටින පුද්ගලයෙක්. ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. නමුත් ඒ කාලසීමාවන් තුළ එවැනි දේවල්

එතුමාට නොලැබුණත් මන්ත්‍රීවරයෙක් හැටියට එතුමාගේ අතින් ඉෂ්ට විය යුතු යුතුකම දේශපාලනික වශයෙනුත්, සමාජයීය වශයෙනුත්, ආගමික වශයෙනුත් එතුමා ඒ යුතුකම් සියල්ල ඉෂ්ට කරපු නායකයෙක් කියන එක මම මේ අවස්ථාවේ සඳහන් කරමින්, දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නේ නැහැ. අවසාන මොහොතේ හරි මට මේ අවස්ථාව දීම ගැන මම ඉතාමත්ම සතුටු වෙනවා. අප අතරින් වෙන් වුණු තිලකරත්න රාජපක්ෂ සොහොයුරාට අජරාමර නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon.Presiding Member

බොහොම ස්තුතියි. බස්නාහිර පළාත් සභාව තුළ අමිල යුතුකම් රාශියක් ඉෂ්ට කරලා සදහමට අපෙන් වෙන්ව ගිය ගරු තිලකරත්න රාජපක්ෂ හිටපු පළාත් සභා මන්ත්‍රීතුමා වෙනුවෙන් ශෝකය පළ කළ සියලුම පක්ෂ, විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මෙම අවස්ථාවට එතුමාගේ සියලුම ළඟ ඥාති මිත්‍රාදීන් සහභාගි වෙනවා. ඒ ඥාති මිත්‍රාදීන්ට අපේ පළාත් සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ ශෝකය ප්‍රකාශ කිරීමේ යෝජනාව තුළ එතුමා පිළිබඳව කෙරුණු, එතුමාගේ ජීවිතය පිළිබඳව කෙරුණු ඇගයීම් අහලා සතුටු වෙන්න ඇතියි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා මම මේ අවස්ථාවේදී ගරු මන්ත්‍රීවරුන් විසින් පළ කළ ඒ ඉතා වටිනා අදහස් ඇතුළත් හැන්සාඩ් නිල වාර්තාවේ පිටපතක් එතුමාගේ පවුලේ ඥාතීන් වෙත යැවීමට මම ලේකම්තුමාට උපදෙස් දෙනවා. ඒ අනුව ලේකම්තුමා විසින් මේ හැන්සාඩ් වාර්තාව ඇතුළු සියලුම වාර්තාවන් ඒ ඥාතීන්ට යවනු ඇතැයි කියා මා බලාපොරොත්තු වෙනවා. එසේ බලාපොරොත්තු වෙමින් ගරු තිලකරත්න රාජපක්ෂ මැතිතුමා කළ ඒ අමිල අමරණීය සේවයට බස්නාහිර පළාත් සභාවේ ගෞරවය නැවතත් පුද කරමින් එතුමාගේ ශෝක යෝජනාව මෙයින් අවසන් කරනවා.

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා ඇති.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [හෙක්ටර් බෙත්මගේ මහතා ]මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරළගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon.Presiding Member [Mr. Hector Bethmage M.P.C] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

# ශෝක ප්‍රකාශ යෝජනාව : II
## ගරු අජිත් අමරසිරි මැතිතුමා
## MOTION EXPRESSING CONDOLENCES :II
## HON. MEMBER AJITH AMARASIRI

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"ප්‍රථම බස්නාහිර පළාත් සභාව නියෝජනය කරමින් පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත් වූ අජිත් අමරසිරි මන්ත්‍රීතුමා බස්නාහිර පළාතේ ජනතාවට අතිමහත් සේවයක් ඉටු කරමින් නොබෝදා අභාවප්‍රාප්ත වුණා.*

*බස්නාහිර පළාත් සභාව එතුමාගෙන් ඉටු වූ ඒ සේවය අගය කරමින් එතුමාගේ අභාවය පිළිබඳ ස්වකීය සාතිශය සංවේගය පළ කර සිටීමේ යෝජනාව මම මෙම අවස්ථාවේදී සභාවට ඉදිරිපත් කරනවා."*

1955 මැයි මස 15 වන දින පානදුර ප්‍රදේශයේ උපත ලබලා මද්දුමාගේ ගුල්ගම් ගාමීන් මැතිතුමාගේ ආදරණීය පුතණුවකු හැටියටත්, දයාවතී වාස් ගුණවර්ධන මහත්මියගේ ආදරණීය පුතණුවකු හැටියටත් මෙලොව එළිය දුටු අජිත් අමරසිරි මැතිතුමා ඒ ප්‍රදේශයේ ප්‍රකට පවුලක දරුවෙක් හැටියට තමන්ගේ ජීවිතය ආරම්භ කළා. අජිත් අමරසිරි මැතිතුමාට සහෝදරයෙක් ඉන්නවා. අජිත් අමරසිරි මැතිතුමා පානදුරේ ශාන්ත අන්තෝනි විද්‍යාලයෙන්, වෑකඩ බෞද්ධාලෝක විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබලා කොළඹ විශ්ව විද්‍යාලයේ සේවක අධ්‍යාපන පාඨමාලාවක් සමත් වුණු මන්ත්‍රීවරයෙක් කියන එක මම මේ සභාවේදී ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ. එතුමා ලංකා සම සමාජ පක්ෂයෙන් දේශපාලනය ආරම්භ කරලා, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ වසර 20 ක් පමණ රැකියාව කරපු කෙනෙක්. විශේෂයෙන්ම ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට සම්බන්ධ වුණායින් පස්සේ එතුමා ලංකා සමසමාජ පක්ෂයේ දේශපාලන කටයුතුවල නිරත වෙලා, ඒ පක්ෂයේ වෘත්තීය සමිති අංශයේ ක්‍රියාකාරී නායකයෙක් හැටියට තම කටයුතු ආරම්භ කළා. ඒ ආරම්භ වන කාල සීමාව තුළදී එතුමා එම්.එල්. මල්ලිකා පීරිස් මෙනවිය සමඟ විවාහයට පත් වුණා. එතුමාට දයාබර පුතණුවන් දෙදෙනෙක් ඉන්නවා. අද මේ අවස්ථාවේ දයාබර බිරිඳත්, පුතණුවන් දෙදෙනාත් සභාවට පැමිණ සිටිනවා. ඒ නිසා මේ අවස්ථාවේ මේ පළාත් සභාවට විශාල සේවයක්

[ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා]

කරපු අජිත් අමරසිරි මන්ත්‍රීතුමා පිළිබඳව වචන කිහිපයක් සඳහන් කිරීම අපේ යුතුකමක් වෙනවා.

අජිත් අමරසිරි මන්ත්‍රීතුමා අධ්‍යාපනය ලබලා, ඒ වාගේම දුම්රිය දෙපාර්තමේන්තුවේ රැකියාවක් කරලා, ඒ දුම්රිය දෙපාර්තමේන්තුවේ වෘත්තිය සමිති නායකයෙක් හැටියට කටයුතු කරලා, ඒ වාගේම ලංකා සම සමාජ පක්ෂයෙන් දේශපාලනය ආරම්භ කරලා ඒ පක්ෂයට අති විශාල සේවයක් කරපු කෙනෙක්. මා විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මේ සභාවේ ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාවේ 1988, 89 කාලයේ තමයි පළාත් සභා ක්‍රමය ආරම්භ වුණේ. එය ආරම්භ කළේ, දිවංගත ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා. හැබැයි, පළාත් සභා ක්‍රමය ආරම්භ වෙන කොට ඒක බොහොම පහසු දෙයක් වුණේ නැහැ. පළාත් සභා ක්‍රමයේ ආරම්භයත් එක්ක ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එකා පිට එකා මැරී වැටෙන කොට මේ පළාත් සභා ක්‍රමය ආරම්භ නොවෙයි කියලා බොහෝදෙනා විශ්වාස කළා. නමුත් එවකට එක්සත් ජාතික පක්ෂය ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ නායකත්වයෙන් ඒ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරන්න දැඩි වෙහෙසක් මේ රටේ ගත්තා. මේ කථා කරන අපි එදා ඒකට විරුද්ධව සිටියේ. ඒ එක්කම එක්සත් සමාජවාදී පෙරමුණ අනික් පැත්තෙන් පළාත් සභා ක්‍රමය මේ රටේ ස්ථාපිත කරන්න දැඩි වෙහෙසක් දැරුවා. අජිත් අමරසිරි මන්ත්‍රීතුමා තෝරා ගත්තේ එක්සත් සමාජවාදී පෙරමුණ, මේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරන්න සුදුසු පක්ෂය හැටියටයි. එදා ලංකා සමසමාජ පක්ෂය දිවංගත විජය කුමාරණතුංග මැතිතුමාත් එක්ක එකතු වෙලා, ශ්‍රී ලංකා මහජන පක්ෂය ආරම්භ වෙනවා. කොමියුනිස්ට් පක්ෂය එකතු වෙනවා. තව පක්ෂ කීපයක් සම්බන්ධ වෙලා එක්සත් සමාජවාදී පෙරමුණ විධියට පළමුවැනි පළාත් සභාවට තරග කරනවා. එදා ඒ පළාත් සභාවට තරග කරන කොට අපි අද කරන දේශපාලනය නොවෙයි, එදා තිබුණේ. පළාත් සභාවට ඉදිරිපත් වීම නිසා, මේ පළාත් සභාව තුළ තමන්ගේ කටයුතු කරන්න යෑම නිසා බොහෝදෙනා තමන්ගේ ජීවිතයෙන් වන්දි ගෙව්වා. ඒ නිසා අජිත් අමරසිරි සහෝදරයා ඒ මැතිවරණයට ඉදිරිපත් වෙලා තමන්ගේ දේශපාලන භූමිකාව රඟ දක්වනකොට මම හිතනවා, එතුමාට අප්‍රමාණ බාධා කරදර එල්ල වුණා කියලා. ජීවිත තර්ජන, මරණ තර්ජන නිරන්තරයෙන් එතුමාට එල්ල වුණා කියලා. නමුත් එතුමා ඒකට භයේ ආපස්සට ගිය මන්ත්‍රීවරයෙක් නොවෙයි. තමන්ගේ දේශපාලන අරමුණු ඉටු කරගන්න ඒ මැතිවරණයට ඉදිරිපත් වෙලා - ඒ අරමුණ මුල් කාලයේ, මාස කිහිපයක් ඉටු කරගන්න බැරි වුණත් මාස කිහිපයක් ගිහිල්ලා මේ බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට තේරී පත් වෙනවා. ඒ නිසා අජිත් අමරසිරි මැතිතුමා පළමුවැනි පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට තමන්ගේ කාර්ය භාරය, තමන්ගේ පක්ෂය වෙනුවෙන් ඉටු කරපු ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක් කියන එක මම මේ සභාවේදී මතක් කරන්න ඕනෑ. එදා එතුමන්ලා ගත්තු නායකත්වය නිසා තමයි පළාත් සභා ස්ථාපිත වෙන්නෙත්. පළාත් සභා ඉස්සරහාට ගමන් කරන්නෙත්. ඒ නිසා අජිත් අමරසිරි මැතිතුමා තමන්ගේ වැඩ කොටස දේශපාලන වශයෙනුත්, පළාත් සභා ආරම්භ කරන්නත් බොහෝ උර දීපු මන්ත්‍රීවරයෙක් කියන එකත් මම මේ සභාවේදී මතක් කරන්න ඕනෑ.

එතුමා පළාත් සභාවට තේරී පත් වීමෙන් පසු තමන් නියෝජනය කරපු පානදුර ප්‍රදේශයේ තමන්ට ලැබුණු විමධ්‍යගත මුදල් එක්ක, එතුමා තමන්ගේ ජනතාවට අති දැවැන්ත සේවයක් ඉටු කරනවා. ග්‍රාමීය මාර්ග සංවර්ධනය කරනවා. ග්‍රාමීය විදුලිබල මාර්ග ආරම්භ කරනවා. ඒ වාගේම දහම් පාසල් අධ්‍යාපනයට, දුප්පත් ජනතාවට ලබා දෙන්න අවශ්‍ය සහයෝගය එතුමා, එතුමාගේ කාලය තුළ ලබා දෙනවා. ඒ නිසා පළාත් සභාවේ කෙටි කාලයක් එතුමා නියෝජනය කරන්නේ. අවුරුදු 04 ක් පමණයි එතුමා පළාත් සභාව නියෝජනය කරන්නේ. ඒ හතරක කාලය තුළ එතුමා මන්ත්‍රීවරයෙක් හැටියට ඒ තමන්ගේ යුතුකම් කොටස හොඳින් ඉටු කළයි කියන එක මම මේ සභාවේදී ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ. ඒ නිසා අද මේ අවස්ථාවේදී තවත් මන්ත්‍රීවරු කිහිප දෙනෙක් අදහස් ප්‍රකාශ කරන්න තිබෙන නිසා, කාලය ගැන සලකලා මම මගේ කථාව කෙටි කරමින් අජිත් අමරසිරි මැතිතුමා පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට ඒ කරපු මෙහෙවරට, ඒ ආදරණීය භාර්යාව - මම හිතන්නේ ඒ කාලයේ දරුවන් බොහොම කුඩයි. ඒ දරුවන් දීපු සහයෝගයත් විශේෂයෙන් බලපෑවයි කියලා මම හිතනවා. ඒ නිසා එතුමා පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට ඒ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරන්න වෙහෙස දරපු මන්ත්‍රීවරයෙක් කියන එක යළිත් මතක් කරමින් අජිත් අමරසිරි මැතිතුමාට බෞද්ධයන් හැටියට අපි ප්‍රාර්ථනා කරන ශාන්ත අමා මහ නිර්වාණ සම්පත්තිය ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සුමිත් ලාල් මැන්ඩිස් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. SumithLalMendis- Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අජිත් අමරසිරි මැතිතුමා අප අතරින් වෙන් වෙලා ටික කාලයයි ගත වෙන්නේ. කෙසේ වෙතත් එතුමා පිළිබඳව විශේෂ හැඳින්වීමක් කරන්න කරුණු දැන නොගත්තත් එතුමාගේ දේශපාලන ඉතිහාසය අපි අහලා තිබෙනවා. කථා කරලා තිබෙනවා. එතුමා වාමාංශික දේශපාලනයේ ලංකා සම සමාජ පක්ෂයේ සාමාජිකයෙක් හැටියට කළුතර දිස්ත්‍රික්කයේ විශාල සේවාවක් කරපු මන්ත්‍රීවරයෙක්. අජිත් අමරසිරි මැතිතුමාව මම හඳුනා ගත්තේ, පළාත් සභාවට අපි පත් වුණාට පස්සේ. එතුමාගේ දේශපාලන ඉතිහාසයත් එක්ක. අර අපේ සුනිල් ජයමිණි ගරු සභානායකතුමා කිව්වා වාගේ එතුමා මරණ වරෙන්තුව අතේ තියාගෙන තමයි පළාත් සභාවට 1989 ඉදිරි පත් වුණේ.

අපි දන්නවා, ඒ කාලයේ අපේ කළුතර හිටපු වාමාංශික නායකයෙක් වන චමිලි ගුණවර්ධන මැතිතුමාගේ නායකත්වයෙන්, ඒ වාගේම අපි දන්න විධියට රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා ඒ අවස්ථාවේ තරග කළා. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඒ වේලාවේදී මේ පළාත් සභා ක්‍රමය වර්ජනය කරලා, පළාත් සභා ක්‍රමයට අකමැත්තක් දක්වපු නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් කවුරුත් ඉදිරිපත් වුණේ නැහැ. නමුත් අපි දේශපාලනය කළේ, ලංකා සම සමාජ පක්ෂයේ. නමුත් අපි ඡන්දය පාවිච්චි කළේ, එක්සත් සමාජවාදී පෙරමුණට. පහන ලකුණින් ඡන්දය ඉල්ලුවේ. ඒ නිසා ඒ කාලයේ අවශ්‍යතාවයක් තිබුණා. කෙසේ වෙතත් මේ ජනවාර්ගික ගැටලුව පිළිබඳව හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ගත්තා වූ තීන්දුවක් අනුව පළාත් සභා ක්‍රමය රටේම පවත්වාගෙන යනවා. ඒ ක්‍රියාදාමය උඩ තමයි පළාත් සභා ක්‍රමය මේ රටේ ස්ථාපිත වුණේ. ඒ වාගේම ඒ කාලයේ මේ පළාත් සභාව නියෝජනය කරපු මන්ත්‍රීවරු කීප දෙනෙකුගේම ඒ කාලයේ තිබුණු ජනතා විමුක්ති පෙරමුණේ ත්‍රස්තවාදී ව්‍යාපාරය නිසා ජීවිත අහිමි වුණා. විශේෂයෙන් විජය කුමාරණතුංග මැතිතුමාටත් ජීවිතය අහිමි වුණා. ඊට පස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු මගේ සහෝදරයා විජය ලාල් මැන්ඩිස් මහත්මයා. එතුමාටත් ජීවිතය අහිමි වුණා. කෙසේ වෙතත් අද මේ රටේ ජනවාර්ගික ප්‍රශ්නය විසඳන්න සමාකාමීව උත්සාහ කළත්, මේ රටේ තිබුණු ඒ වාතාවරණ උඩ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා මැදිහත් වෙලා යුද්ධයෙන් තමයි මේ ප්‍රශ්නයට අපට විසඳුමක් දෙන්න පුළුවන් වුණේ. නමුත් දැන් ඒ සියලුම දේම ඉවර වෙලා තිබෙනවා. අජිත් අමරසිරි මන්ත්‍රීතුමා බලාපොරොත්තු වුණු රටේ ඒ සහජීවනය අද ගෙනියන්න අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මැදිහත් වෙලා ඉන්නවා. ඊයේ කළුතර තෛපොංගල් උත්සවයක් තිබුණා. ඒකට සිංහල, දෙමළ, මුස්ලිම් සියලු දෙනාම එකතු වෙලා මේ රටට පවත්වාගෙන යන්න, මේ රටේ ප්‍රශ්න හඳුනාගෙන අපි එකම ජාතියක් හැටියට නැගී සිටින්න ඕනෑය කියන මතය අනුව තමයි ඊයේ පැවැත් වුණේ. ඒ මතය තමයි අජිත් අමරසිරි මැතිතුමාත් ප්‍රාර්ථනා කළේ. අද එතුමා අප අතරින් වියෝ වුණත්, එතුමා අද කොහේ හරි ඉඳන් සන්තෝෂ වෙනවා ඇති අද රටේ සාමකාමී වාතාවරණයක් ඇති වෙලා තිබෙන එක පිළිබඳව.

අජිත් අමරසිරි මැතිතුමා මෑත කාලයේදී පළාත් සභාවේ නොසිටියත් එතුමා මාව කිහිප අවස්ථාවකදීම හම්බ වෙලා තිබෙනවා. තමන් ඉගෙන ගත්ත පාසලට මොනවා හරි කරන්න ඕනෑය කියලා මට කිහිප අවස්ථාවකදීම කිව්වා. නමුත් මම පසුගිය කාලයේ එතුමාට උදව් කරන්න ලැහැස්ති වුණත් එතුමා අසනීපයෙන් හිටපු නිසා එතුමාට ඒ දේ කරගන්න බැරි වුණා. අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා. පානදුර ප්‍රදේශයේ එතුමා බලාපොරොත්තු වුණු ඒ සංවර්ධන වැඩ කොටසට අපිත් දායක වෙලා එතුමාට උපහාරයක් වශයෙන් ඒ කටයුත්ත කරන්න. ඒ නිසා මම දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. එතුමන්ලා ගෙන ගිය ඒ අවංක දේශපාලන වැඩ පිළිවෙළ අපි ගෙනි යනවා නම් තමයි එතුමන්ලාට ඒ උපහාරය ලැබෙන්නේ. ඒ සඳහා අපි ඇප කැප වෙලා ඒ කටයුතු කරනවා. ඒක නිසා අපි අද එතුමාගේ පවුලේ සියලු දෙනාටම බස්නාහිර පළාත් සභාව වශයෙන් කළුතර දිස්ත්‍රික්කයේ පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන් අපි සියලු දෙනාගේම ශෝකය ප්‍රකාශ කරන ගමන්, එතුමාට අපි බලාපොරොත්තු වෙන අමාමහ නිවන් සම්පත්තිය ලැබේවා කියා ප්‍රාර්ථනය කරනවා. බොහොම ස්තුතියි.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. KeerthiKariyawasam

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු හැටියට කටයුතු කරපු අජිත් අමරසිරි මැතිතුමා වෙනුවෙන් ශෝක යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේ අපට වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය සභාපතිතුමාට ස්තුතිවන්ත

[ගරු කීර්ති කාරියවසම්]

වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අජිත් අමරසිරි මැතිතුමා මේ බස්නාහිර පළාත් සභාවේ පළමු පළාත් සභාව නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක් බවට පත් වුණා. ලංකා සම සමාජ පක්ෂයේ සමාජිකයෙකු හැටියට හිටපු, ක්‍රියාකාරිකයෙක් හැටියට හිටපු එතුමා බස්නාහිර පළාත් සභාවට එදා තරග වැදුණේ ලංකා සමසමාජ පක්ෂයත්, ශ්‍රී ලංකාවේ කොමියුනිට්ස් පක්ෂයත්, මහජන පක්ෂයත් එක්ක එකට සැඳුම්ලත්ව කටයුතු කරපු සමාජවාදී එක්සත් පෙරමුණේ සාමාජිකයෙකු හැටියටයි. එතුමා බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු හැටියට එහි නියෝජිතයෙකු ලෙසටයි කළුතර දිස්ත්‍රික්කයෙන් තේරී පත් වුණේ. එතුමාගේ උපන් ගම් ප්‍රදේශය වුණේ, පානදුර කළුදැවල ප්‍රදේශය. එතුමා බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් වෙන්න ප්‍රථම ලංකා සම සමාජ පක්ෂයේ සාමාජිකයෙක් වෙලා පානදුර ආසනය එදා නියෝජනය කරපු හැත්තෑව සමගි පෙරමුණ ආණ්ඩුවේ ප්‍රවාහන ඇමතිවරයා හැටියට කටයුතු කරපු මේ රටේ වැදගත් දේශපාලඥයෙක් හැටියට හිටපු ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා සමඟ එකට කටයුතු කරපු මන්ත්‍රීවරයෙකු හැටියටයි අපි එතුමාව දකින්නේ. එතුමා ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා සමඟ පානදුර ආසනය තුළ තරුණයෙක් හැටියට දේශපාලන කටයුතුවල නිරත වෙමින්, විශේෂයෙන්ම ලංකා සම සමාජ පක්ෂයේ තරුණ සමිති ව්‍යාපාරයේ සමාජිකයෙක් හැටියට, ක්‍රියාකාරිකයෙකු හැටියට එදා කටයුතු කළා කියන එක අපි විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම එතුමා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවයට ඇතුළත් වෙලා තමන් සේවය කරන දුම්රිය දෙපාර්තමේන්තුව තුළ දුම්රිය කම්කරුවන් වෙනුවෙන්, දුම්රිය සේවකයන් වෙනුවෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් ස්ථාපිත කර ගන්න වෘත්තීය සමිති නායකයෙකු හැටියට කටයුතු කරපු කෙනෙක් හැටියටත් අපි විශේෂයෙන්ම සඳහන් කරන්න අවශ්‍ය වෙනවා.

1988 වර්ෂයේ පළමුවැනි පළාත් සභාවට එතුමා පත් වෙන කොට මට ප්‍රථමයෙන් කථා කරපු මන්ත්‍රීවරුනුත් සඳහන් කළා වාගේ, එදා ඉතාමත්ම අමාරු තත්ත්වයක තමයි බස්නාහිර පළාත් සභාවට මන්ත්‍රීවරුන් හැටියට ඔවුන්ට පත් වෙන්න පුළුවන්කම ඇති වුණේ. ඒ කාලයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් පළාත් සභා ක්‍රමය ප්‍රතික්ෂේප කරන අවස්ථාවේ, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එදා ජනාධිපතිවරයා හැටියට බලය විමධ්‍යගත කිරීම අරමුණු කරගෙන, මේ පළාත් සභා ක්‍රමය යෝජනා කරන අවස්ථාවේ එවකට ලංකා සම සමාජ පක්ෂයේ නායකයා හැටියට කටයුතු කරපු කොල්වින් ආර් ද සිල්වා මැතිතුමා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා යෝජනා කරපු ඒ පළාත් සභා ක්‍රමය, ඒ බලය බෙදා හැරීමේ ක්‍රමයත් එක්ක එකට යා යුතුයි මේ රටේ සහ ජීවනයක් ගොඩනගන්න. ජාතීන් අතර සංහිඳියාවක් ගොඩ නගන්න, මේ බලය බෙදීම අරමුණු කර ගත යුතුයි කියන මතයේ හිඳිමින් කටයුතු කරපු නිසා තමයි එදා අපට පුළුවන්කම ඇති වුණේ, බස්නාහිර පළාත් සභාව වැනි පළාත් සභා ක්‍රමය මුළු රට පුරා ක්‍රියාත්මක කරවන්න. ඒ අවස්ථාවේ අපි දන්නවා, ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු බොහෝ පක්ෂ පළාත් සභා ක්‍රමය ප්‍රතික්ෂේප කරමින්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් ප්‍රතික්ෂේප කරමින් ඒකට විරුද්ධව කටයුතු කරන වේලාවේ ජීවිත අවදානම් තබාගෙන කටයුතු කරපු උදවිය තමයි එදා පළාත් සභාව වෙනුවෙන් ඉදිරිපත් වුණේ. අපි දන්නවා, පළාත් සභාව නියෝජනය කරපු මන්ත්‍රීවරුන්ගේ ජීවිත එදා අහිමි වුණා. කළුතර දිස්ත්‍රික්කයේ ලංකා සම සමාජ පක්ෂය නියෝජනය කරපු පිටිගල මන්ත්‍රීතුමාව සහසික විධියට මරා දමන්නට යෙදුණා. එවැනි අනතුරුදායක අවස්ථාවක තමයි අජිත් අමරසිරි මැතිතුමාට මේ පළාත් සභාව නියෝජනය කරලා මන්ත්‍රීවරයෙකු හැටියට තේරී පත් වෙන්න පුළුවන් වුණේ. ඒ අභියෝගයන්ට මුහුණ දීලා වමේ දේශපාලනයේ හිටපු කෙනෙක් හැටියට, තමන් විශ්වාස කරපු ආකාරයට මේ රටේ සමාජ සාධාරණත්වයක් ඇති කිරීම වෙනුවෙන් පෙනී සිටින්න, ඒ වෙනුවෙන් සමාජයේ ජීවත්වන සියලු දෙනාට එක සමාන අයිතීන් තිබෙන්න ඕනෑය කියන පිළිගැනීමක් තිබුණු උදවිය හැටියට, මේ රටේ සියලු ජාතීන්ට එකට සහෝදරත්වයෙන් ජීවත් වෙන්න පුළුවන් සමාජ සංහිඳියාවක් ගොඩ නැගෙන්න ඕනෑය කියන කාරණාව විශ්වාස කරපු කෙනෙක් හැටියටයි අජිත් අමරසිරි මැතිතුමා එදා කටයුතු කළේ කියන එක අපි විශේෂයෙන්ම මේ අවස්ථාවේ සිහිපත් කරන්න අවශ්‍ය වෙනවා.

අවුරුදු ගණනාවක් ගියාට පස්සේ මේ බලය බෙදා හැරීම පිළිබඳ මතයට විරුද්ධ වුණු කාලපරිච්ඡේදය, ඒ වාගේම අජිත් අමරසිරි මැතිතුමා මේ විධායක ජනාධිපති ක්‍රමය මේ රටෙන් තුරන් කළ යුතුය, මෙය අහෝසි විය යුතුය කියන මතයේ හිටපු කෙනෙක් හැටියට එතුමා විශ්වාස කරපු දේශපාලනය අද යථාර්ථයක් බවට පත් වෙන කාල පරිච්ඡේදයක සිටිනවාය කියන එකේදී අපට සිහිපත් වෙන්නේ එතුමන් නිවැරදි දේශපාලන තලයක ඉඳගෙන, දර්ශනයක ඉඳගෙන, ප්‍රතිපත්තියක ඉඳගෙන කටයුතු කරපු

කෙනෙක් හැටියටයි අපට සඳහන් කරන්න පුළුවන් වෙන්නේ. තමන් නියෝජනය කරපු පානදුර ආසනයට පමණක් නොවෙයි, කළුතර දිස්ත්‍රික්කයේ සියලු ජන කොටස්වලට මන්ත්‍රීවරයෙකු හැටියට එතුමා කටයුතු කරපු ඒ කෙටි කාලසීමාව තුළ විශාල සේවාවක් කරන්න ඉදිරිපත් වුණු කෙනෙක් හැටියට අපි එතුමාව දකිනවා. ඒ වාගේම ඉතාමත්ම සමාජශීලී පුද්ගලයෙකු හැටියට කටයුතු කරපු කෙනෙක් හැටියටයි අපි ඔහුව දකින්න තිබෙන්නේ. මම පුද්ගලිකව එතුමාව දන්නවා. හඳුනනවා. එතුමා පළාත් සභාව නියෝජනය කරන කාලයේ අපි මේ පළාත් සභාව තුළ නොසිටියත් ඔවුන් කරපු දේශපාලන ඉතිහාසය පිළිබඳව අවබෝධයක් තිබෙන අය හැටියට එතුමා නිවැරැදිව හැමදාමත් පළාත් සභාව තුළ කටයුතු කළාය කියන විශ්වාසය අප තුළ තිබෙනවාය කියන එක විශේෂයෙන් සඳහන් කරන්න වෙනවා. එතුමාගේ ආදරණීය බිරිඳ, ඒ වාගේම එතුමාගේ දරුවන් දෙදෙනා එතුමාගේ මේ කටයුතුවලට ශක්තියක් වුණා. අපි දන්නවා, එතුමා අසනීපයෙන් සිටින කාලපරිච්ඡේදයේදී එතුමාගේ ජීවිතය රැක ගැනීම සඳහා ඔවුන් විශාල උත්සාහයක් දැරුවා. නමුත් කාටත් හිමි වෙන්න තිබෙන මරණය - තවත් කාලයක් ජීවත් වෙන්න ඉඩකඩ තිබුණු එතුමාට ජීවිතය අහිමිවීම මේ සමාජයට වුණු පාඩුවක් හැටියටයි අපි විශේෂයෙන්ම සලකන්න බලාපොරොත්තු වෙන්නේ. ඉතින් එවැනි කෙනෙක් වූ අජිත් අමරසිරි මැතිතුමාව සිහිපත් කරන මේ අවස්ථාවේ ලංකා සම සමාජ පක්ෂය වෙනුවෙන් එතුමාගේ ආදරණීය බිරිඳට, ඒ දරුවන්ට, පවුලේ සියලුදෙනාට අපේ ශෝකය ප්‍රකාශ කරනවා වාගේම අපේ පෞද්ගලික ශෝකයත් එතුමා වෙනුවෙන් ප්‍රකාශ කරමින්, විශේෂයෙන්ම මේ අවස්ථාව නියෝජනය කරන අපේ සහෝදර මන්ත්‍රීතුමාගේත් ශෝකය ප්‍රකාශ කරමින්, බෞද්ධයන් වූ අපි එතුමාට නිවන් සුව අත්වේවායි කියන ප්‍රාර්ථනයත් එක්ක මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අජිත් අමරසිරි මැතිතුමා සම්බන්ධව ශෝක යෝජනාව ගරු සභා නායකතුමා ඉදිරිපත් කළා. එයට හේතු ගණනාවක් තිබෙනවා. එතුමාගෙන් ඉටු වූ සේවය අගය කිරීමක් තමයි අපි මේ අවස්ථාවේදී සිදු කරන්නේ. ඇත්තටම ඒ වකවානුවේ අපි පළාත් සභාවේ ඉඳලා නැහැ. ඊට පසුව අපි ආවේ. ඒත් මගේ පියා යූ.එස්. පෙරේරා මැතිතුමා ඒ වකවානුවේ පළාත් සභාවේ එතුමා සමඟ සිටියා. ඇත්තටම එතුමා කළුතර දිස්ත්‍රික්කයේ උපත ලබලා, දේශපාලනය කරලා, පානදුර ප්‍රදේශයේ සේවය කරලා දුම්රිය දෙපාර්තමේන්තුවේ, ඒ වාගේම විශ්ව විද්‍යාලයේ සේවක පාඨමාලාවල් හදාරලා වෘත්තීය සමිති, ඒ වාගේම සමාජ සේවා කටයුතු, සර්වෝදය සමිතිවල තනතුරු දරලා ඉතාමත් කීර්තිමත් දේශපාලඥයෙක් වශයෙන්, කීර්තිමත් සමාජ සේවකයෙක් වශයෙන් කටයුතු කිරීම නිසා තමයි එතුමා 1988, 89 වකවානුව තුළ පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වෙලා බස්නාහිර පළාත් සභාවට තේරී පත් වුණේ.

එවකට තිබූ පළාත් සභා මැතිවරණය ගැන කථා කරනවා නම්, අපි තරුණ වියේ පාසල් යන වියේ දරුවෝ. ඒ වකවානුවේ මගේ පියා පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වන කොට තිබුණු තත්ත්වය දැක්ක පුද්ගලයෙක් මම. ඉතින් එවැනි වාතාවරණයකදී දිවංගත ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා 13 වැනි සංශෝධනය ලංකාවට ගෙනැල්ලා, 13 වැනි සංශෝධනය හඳුන්වා දීමේදී රටේ තිබුණු තත්ත්වය අපි කවුරුත් දන්නවා. ඉතින් එවැනි වාතාවරණයක් තුළ ඇති වුණු මේ පළාත් සභා ක්‍රමයේදී මැතිවරණයකට ඉදිරිපත් වෙනවා කියන්නේ ඉතා ලෙහෙසි පහසු ක්‍රියාදාමයක් නොවෙයි. අපේ කීර්ති කාරියවසම් මැතිතුමාත්, අපේ සුමිත් ලාල් මැතිතුමාත්, ගරු සභා නායකතුමාත් කිව්ව ආකාරයට ඒ මැතිවරණය ඉතාම භීෂණකාරී මැතිවරණයක්. මම කාටවත් චෝදනා කරන්න යන්නේ නැහැ. ඒ මැතිවරණයට ඉදිරිපත් වුණේ ඇයි? මේ ප්‍රජාතන්ත්‍රවාදය රැක ගන්න. එම නිසා තමයි මේ හයවන පළාත් සභාවෙත් අපි මන්ත්‍රීවරු වශයෙන් කටයුතු කරන්නේ. එතුමන්ලා එදා ඒ ගත්ත වැයම නිසා තමයි අපි අද මෙතැන ඉඳගෙන කථා කරන්නේ. එහෙමනම් ඒ අවස්ථාව ලබා දුන්නේ එතුමන්ලා. එහෙමනම් එතුමන්ලාව මේ බස්නාහිර පළාත් සභාවේ අපි අගය කරන්න ඕනැ. සියලුම ඥාතීන් ගෙනැල්ලා, ඒ අයගේ පවුලේ උදවිය ගෙනැල්ලා මේ කරන කර්තව්‍යය තුළ අගය කරන්න ඕනැ. තරුණ පළාත් සභා මන්ත්‍රී කෙනෙක් වශයෙන් මම අගය කරනවා. අපේ මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය අඩු වෙන්න පුළුවන්. ඒත් ඒ ක්‍රියාදාමය හොඳයි. ක්‍රියාදාමය හරි වටිනවා. ඒක තමයි ඒ පවුලට, ඒ දරුවන්ට දෙන්න පුළුවන් තෑග්ග. බස්නාහිර පළාත් සභාවෙන්. ඒ තෑග්ග අපි අද දෙනවා. මම එක්සත් ජාතික පක්ෂයේ, ඇත්තටම විපක්ෂයේ ප්‍රධාන සංවිධායක වශයෙන්, විපක්ෂය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරනවා.

[ගරු ශූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා]

හැබැයි එදා සුසිල් මුණසිංහ ඇමතිතුමා ප්‍රධාන අමාත්‍ය ධූරය දරන කොට දිවංගත ඔසී අබේගුණසේකර මැතිතුමා තමයි විපක්ෂ නායක ධූරය දරලා තිබෙන්නේ. එතුමාගේ යටතේ හිටපු කණ්ඩායම. එහෙමනම් ඒ වේලාවේ එතුමා විපක්ෂයේ. අද අපි විපක්ෂයේ ඉඳගෙන එතුමාට ඒ ශෝකය ප්‍රකාශ කරන අවස්ථාවක්. මේක තමයි දෛවය. කෙසේ වෙතත් අපි කියන්න ඕනෑ. එතුමා ලංකා සම සමාජ පක්ෂයෙන් දේශපාලනය ආරම්භ කරලා - ලංකා සම සමාජ පක්ෂය, කොමියුනිට්ස් පක්ෂය වාගේ ඒ පක්ෂ කියන්නේ, ඉතාම අමාරු දේශපාලනයක් කරන පක්ෂ. අපි නැහැයි කියන්නේ නැහැ. ජනතාවට අතරට ගිහිල්ලා - උදාහරණයක් ගන්නවා නම් සම සමාජ පක්ෂයේ පත්තරේ පවා ඔවුන් විසින්ම, ඒ සාමාජිකයන් විසින් විකුණන්න ඕනෑ. එයට හේතු ගණනාවක් තිබෙනවා. මගේ පියාත් සම සමාජ පක්ෂයේ. මගේ පියා දේශපාලනය ආරම්භ කළේ සම සමාජ පක්ෂයෙන්. පසුව එක්සත් ජාතික පක්ෂයේ කැලණිය ආසනයේ සංවිධායකත් වුණා. පළාත් සභා මන්ත්‍රී වුණා. හැබැයි මගේ පියාට විවාහ ගිවිසුමට පවා අත්සන් කළේ ආචාර්ය ඇන්.එම්. පෙරේරා වාගේ උදවිය. ඉතින් ඒ අතීතය අපි දන්නවා.

කෙසේ වෙතත් ඒ සම සමාජ පක්ෂයේ ඒ ශක්තියක් තුළ අද දේශපාලනයට ඇවිල්ලා එතුමා ඒ කටයුතු කිරීම අපි අගය කරන්න ඕනෑ. අපිට මේ තුළ ගොඩාක් දේවල් කථා කරන්න පුළුවන්. අපි තිලකරත්න රාජපක්ෂ මැතිතුමාගේ ශෝක යෝජනාවත් දැන් ගෙනාවා. දැන් මෙතුමාගේ යෝජනාව ගෙනවා. පළාත් සභා මන්ත්‍රීවරු අප අතරින් නැති වෙන කොට විශේෂයෙන් ඒ 88, 89 කාලයේදී මගේ පියා ලබපු අත්දැකීම් මම දන්නවා. දෙපාර තුන්පාර ඔන්න මෙන්න මැරෙන්න ගියේ. පත් වුණාට පස්සේ පැජරෝ සංස්කෘතියක් ආවා. මන්ත්‍රීවරුන්ට පැජරෝ දෙනවා. මන්ත්‍රීතුමාට පැජරෝ එකේ යන්න බැහැ. වෙඩි තියනවා. මේ මන්ත්‍රීතුමාටත් පැජරෝ එකක් දීලා ඇති. මගේ පියාටත් ලැබුණා. හැබැයි, පැජරෝ එක පාරේ යන්න බැහැ. ඒකෙන් ගිය ගමන්ම - හැබැයි, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා රුපියල් 72,000/- ක් වාගේ පොඩි මුදලකට, ඒකත් ගෙවන පදනම මත, පඩියෙන් කපන පදනම මත එතුමාට ඒ ශක්තිය දුන්නා. අවදානමකට ඉදිරිපත් වෙලා මන්ත්‍රීවරයෙක්ට නිසි තැන දුන්නේ, ඒ දිවංගත ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා. ඒ තුළ අපි දකිනවා. අවධානමක් තිබුණ නිසා, අද ප්‍රජාතන්ත්‍රවාදයක් ඇති වෙලා, පළාත් සභා ක්‍රමය ඇති වෙලා, 13 වන සංශෝධනය තව තවත් ශක්තිමත් කරන්න යන වේලාවක, ඒ වාගේම ව්‍යවස්ථා සංශෝධනයක් ලංකාවේ අවශ්‍යයි කියන වෙලාවක මෙතුමන්ලාගේ සේවය අගය කරනවා. හැබැයි, අපි කාගේත් කනගාටුවක් තිබෙනවා. දැන් මේ අය නැති වෙලා ගිහිල්ලා. මේ අය සේවයක් කළා. අනේ රජයේ සේවකයන්ට විශ්‍රාම වැටුපක් තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුපක් තිබෙනවා. එහෙමනම් පළාත් සභා මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුපක් නැත්තේ ඇයි කියන එක අපි ප්‍රශ්න කරන්න ඕනෑ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒ සම්බන්ධව කටයුතු කිරීම අපි අගය කරනවා. මේ හයවන පළාත් සභාවේ එතුමා පොරොන්දුවක් දුන්නා. මේ පළාත් සභාවේ මහ ඇමති වුණු දවසේ එතුමා පොරොන්දුවක් දුන්නා. පළාත් සභා මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුපක් දෙන්න ඕනෑය කියලා. එහෙමනම් මේ ශෝක යෝජනාව කථා කරන අවස්ථාවේදීත් අපි අදිටන් කර ගනිමු. ලේකම්තුමා මාර්ගයෙන් හරි මේ අවශ්‍ය කටයුතු සම්පාදනය කරලා මේ උදවියට ඒ ශක්තිය, ඒ පවුලේ උදවියට ශක්තිය දීලා, පවුලේ උදවියත් දේශපාලනයට, නැත්නම් සමාජ සේවා කටයුතුවලට කැප වෙන්න ආශාව ඇති වෙන්න කටයුතු කරන්නය කියලා ඉල්ලීමක් කරමින්, එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමේ ගරු විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල මැතිතුමා ඇතුළු විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්ගේ ශෝකය එතුමාට පිරිනමමින්, එතුමාට නිවන්සුව ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම හිතනවා, හිටපු පළාත් සභා මන්ත්‍රී අජිත් අමරසිරි මැතිතුමා පිළිබඳව ශෝක යෝජනාව ගරු සභානායකතුමා ගෙනැල්ලා ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු මන්ත්‍රීවරු ඒ පිළිබඳව සිහිපත් කරලා අපේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා අවසන් කළා. මමත් පළාත් සභාව නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් අජිත් අමරසිරි මන්ත්‍රීතුමාව දීර්ඝ කාලයක සිට දන්නවා. ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායක සුමිත් ලාල් මැන්දිස් මැතිතුමා කිව්වා වාගේ මගේ කාර්යාලයටත් කීප වතාවක්, බොහෝ වාර ගණනක් ආවා. අපේ තිබෙන මිත්‍රත්වය, ලෙංගතුකම වාගේම තමන් ඉගෙන ගත්තු පාසලට මොකක් හරි කරන්න ඕනෑය කියන කථාව හැමදාමත් කිව්ව මන්ත්‍රීවරයෙක්. එතුමා රෝගී තත්ත්වයට පත් වනතුරුම සමාජ සේවා කරපු මහජන

නියෝජිතයෙක් වශයෙන් තමයි අජිත් අමරසිරි මන්ත්‍රීතුමාව දකින්නේ. අද එතුමා පිළිබඳව ශෝක යෝජනාව ගෙනෙන අවස්ථාවේ එතුමාගේ ආදරණීය බිරිඳ පිරීස් මහත්මිය මේ අවස්ථාවේ සම්බන්ධ වෙලා ඉන්නවා. ඒ වාගේම එම්.ඒ. ප්‍රනාන්දු මහතා, පුතා. ඒ වාගේම එම්.ඒ.කේ. ප්‍රනාන්දු මහතා, සොහොයුරා. ඒ වාගේම එම්.ඩී.ඩබ්ලිව්. ප්‍රසාද් මහත්මිය, ඥාති සොහොයුරිය. ඒ වාගේ ජේ.ඩබ්ලිව්.එස්. චතුරංග මහතා, ඥාති පුතෙකුත් ඒ පිරිස අද ඇවිල්ලා ඉන්නවා. තමන්ගේ ස්වාමියා, තමන්ගේ සොහොයුරා, තමන්ගේ පියා පළාත් සභාව තුළ එවකට හිටපු ගරු මන්ත්‍රීතුමන්ලා අඩු වුණත්, ඒ නාමය තවමත් මේ පළාත් සභාව තුළ රැව් දෙනවා කියන එක පිළිබඳව ඒ උදවිය සතුටු වෙන්න ඕනෑ.

ඒ වාගේම එතුමාගේ ශෝක යෝජනාවේ අදහස් ඇතුළත් නිල වාර්තාවේ පිටපත් ඒ පවුලේ ඥාතීන්ගේ දැන ගැනීම සඳහා ලේකම්තුමා මගින් අපි ලබා දීමට කටයුතු කරනවා. එසේ ප්‍රකාශ කරමින්, ශෝක යෝජනා දෙකම මේ අවස්ථාවේදී අවසන් වෙනවා.

# කල් තැබීමේ යෝජනාව
## ADJOURNMENT

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "*දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි*" යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.25 ට, 2016 පෙබරවාරි මස 09 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 01.25 p.m till 9.30 a.m. on 09.02.2016*